# අදේව වාදය - ප්‍රකාශ කර සිටිනුයේ සාර්ථක බව ද? අසාර්ථක බව ද?

ෆාතින් සබ්රී

شركاء التنفيذ:

دار الإسلام جمعية الربوة رواد الترجمة المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع
الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص.

Telephone: +966114454900
ceo@rabwah.sa
P.O.BOX: 29465
RIYADH: 11557
www.islamhouse.com

# හදවතින් වූ ප්‍රකාශයකි

**මානසික පීඩනය:**

මා කිය වූ හා මා පුදුමයට පත් කළ කරුණක් විය. එනම්:

“කර්ලිනියා නම් නළුවාගේ රංගනයෙන් නැපෝලිය කැළඹුණු අවස්ථාවේ, එම නගරයේ සිටි ප්‍රසිද්ධ වෛද්‍යවරයකු වෙත මිනිසෙක් පැමිණියේ අධික මානසික අවපීඩනය සඳහා ප්‍රතිකාර ලැබීමට ය. වෛද්‍යවරයා ඔහුට උපදෙස් දුන්නේ විනෝදාස්වාදය සොයා කර්ලිනියාගේ සංදර්ශණය වෙත යන ලෙසයි. එවිට රෝගියා පිළිතුරු දුන්නේ: කර්ලිනියා මමයි. යනුවෙනි"[1].

ලේඛකයා තවදුරටත් මෙසේ පැවසීය.

"ගැඹුරු විශ්වාසයකින් යුතුව දේවත්වය විශ්වාස කරන්නා හා අදේවවාදියා මනෝචිකිත්සක සායනවලට නො පැමිණෙති. එහි පැමිණෙන්නේ සත්‍ය සොයන පර්යේෂකයන් සහ සියළු දේ සැක කරන සංශයවාදීන් පමණි. දේවත්වය විශ්වාසය කරන්නෝ එය සොයා ලබා ගනිති. අදේවවාදීන් එය සොයන්නේ නැත, ඔවුන් ලබා ගන්නේ ද නැත. තුන්වන වර්ගය තව ම සොයන නමුත් ඔවුන් එය ලබා ගන්නේ නැත. මැවුම්කරු අල්ලාහ්ගෙන් තොර ජීවිතය යනු, ප්‍රාණයක් නැති යාන්ත්‍රනයක් බවට පත් වෙයි. "උදේ පාන්දර (දුම්රිය පොළට) ගොස්, දුම්රියක නැග, මම විශ්ව විද්‍යාලයට පැමිණ, මගේ දේශනවලට සහභාගි වී ආපසු නිවසට පැමිණියෙමි." යැයි මම පැවසුවේ නම්, මෙම වාක්‍ය මාලාව නවකතාවක හෝ කෙටි කතාවකට හෝ සුදුසු

[1] My Escape to Freedom නම් පොත. අලි ඉසෙට්බෙගොවික්, බොස්නියා සහ හර්සගොවිනා ජනරජයේ පළමු ජනාධිපති සහ ඉස්ලාමීය දාර්ශනික.

වන්නේ නැත. හේතුව මෙහි හොඳ නරක යන අංග කිසිවක් දක්නට නැත. එමෙන් ම හොඳ නරක යන අංගවලින් තොර නවකතාවක් ඉතිහාසයේ නැත. මිනිස් පැවැත්මේ පදනම සහ ඒවායේ නියමිත කොටසේ රහස වන බැවිනි.

ලේඛකයා සඳහන් කරන මෙම නියමිත කොටස, මනුෂ්‍ය ආත්මය තුළ ගැඹුරුව ඇති හැඟීම නිරූපණය කර ඔහුව යහ දේ කිරීමට සහ වැරදි දේ වළක්වා ගැනීමට යොමු කරන අතර ඒ අනුව විනිශ්චය සහ දඬුවම් පවතින බව පෙන්වා දෙයි.

**සත්‍ය සොයා යන ගමන**

දේවත්වය ප්‍රක්ෂේප කරන අය කියා සිටින්නේ ජීවිතයේ සෑම දෙයක් ම සහජයෙන් ම අර්ථ විරහිතය. එබවත්, එබැවින් තෘප්තිමත් ජීවිතය ගෙවීම සඳහා සියළු දෑ හි අර්ථය සොයා ගැනීමට අපට නිදහස ඇති බවත්ය.අපගේ පැවැත්මේ අරමුණ ප්‍රතික්ෂේප කිරීම නියත වශයෙන් ම ස්වයං මුලාවකි. එය හරියට අපි අපට ම මෙසේ කියාගන්නවාක් මෙනි: “අපි මේ ජීවිතයේ අරමුණක් ඇතැයි සිතමු හෝ මවාපාමු.”

හරියට අපි දොස්තරලා, හෙදියන්ලා, නැත්නම් අම්මලා හෝ තාත්තලා විදිහට සෙල්ලම් කරන කුඩා ළමයි වගේ ඔවුහු හැසිරෙති. අපි සතුට අත්කර ගන්නේ අපේ ජීවිතයේ අරමුණ දැනගත් විට පමණයි.

සුඛෝපභෝගී විදුලි බල දුම්රියක කෙනෙක් නිරායාසයෙන් නංවනු ලැබ, පළමුවැනි පන්තියේ සුඛෝපභෝගී සහ සුවපහසු අත්දැකීමක, සුඛෝපභෝගීත්වයේ උච්චත ම අවස්ථාවක තමා සිටින බව ඔහු දුටුවේ නම්, ඔහුගේ සිත් තුළ දෝලනය වන ප්‍රශ්නවලට පිළිතුරු නො ලබා මේ ගමනෙහි ඔහුට සතුටක් ඇති වන්නේ කෙසේ ද?

තමා දුම්රියට නැග්ගේ කෙසේ ද? ගමනේ අරමුණ කුමක් ද? මෙම දුම්රිය යන්නේ කොහෙ ද? වැනි ප්‍රශ්නවලට පිළිතුරු නැති නම්, ඔහු සතුටින් සිටින්නේ කෙසේ ද?

ඔහු සතු සියලු සැප සම්පත් භුක්ති විඳීමට ලැබුන ද, ඔහු කිසි විටෙක සැබෑ හා අර්ථවත් සතුටක් නො ලබයි. මේ ගමනේ රසවත් ආහාර ලැබුනත්, ඔහුට මේ ප්‍රශ්න අමතකවේ ද? මෙවැනි සතුට තාවකාලික සහ ව්‍යාජ වනු ඇත. එය සාක්ෂාත් කරගත හැක්කේ මෙම වැදගත් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට හිතාමතා නො සලකා හැරීමෙන් පමණි. එය බීමත්කම නිසා ඇති වන ව්‍යාජ ප්‍රමෝදය හා සමානය. එය හිමිකරුගේ විනාශයට හේතු වන්නාක් මෙනි. මේ අනුව, මෙම වර්තමාන ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගන්නේ නම් මිස මිනිසාගේ සැබෑ සතුට සාක්ෂාත් කරගත නො හැකිය.

ඉංග්‍රීසි චින්තකයෙකු වන ජෝන් ලොක් (John Locke) මෙසේ පවසයි:

"සියලු මිනිස් බලාපොරොත්තු මේ ලෝකයට පමණක් සීමා වී ඇත්නම්, සහ අප මෙලොව පමණක් ජීවිතය භුක්ති විඳින්නේ නම්, දෙමාපියන් සහ දරුවන් බිල්ලට දීමෙන් පවා සතුට සෙවීම අරුමයක් හෝ අතාර්කික කරුණක් හෝ නො වන්නේය."

**පැවැත්ම හා (ශූන්‍ය නම්) නො පැවැත්ම අතර:**

විශ්වයේ මැවුම්කරුවෙකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන අය, කාලය විසින් ආලෝකයට බලපෑමක් නැති බව විශ්වාස කරති. එහෙත්, මැවුම්කරු කාලය හා ස්ථානය සම්බන්ධ නීතියට යටත් නො වන බව ඔවුන් පිළිගන්නේ නැත. මැවුම්කරු සෑම දෙයකට ම පෙර සහ

සියළුදේ ට පසුව පවතිනු ඇත හා ඔහුගේ කිසිම මැවිල්ලක් විසින් ඔහුගේ දැනුම වැටලිය නො හැකිය.

එකිනෙකට සම්බන්ධ වූ අණු (අංශු) එකිනෙකින් වෙන් වූ ද ඔවුන් අතර සන්නිවේදනය නො නැවතී පවතින බව බොහෝ දෙනෙක් විශ්වාස කරති. නමුත් මැවුම්කරු, ඔහුගේ සේවකයන් කොතැනකට සිටියත් ඔවුන් සමඟ සංදේශනය කරයි යන අදහස පිළිනො ගනිති. ඔවුහු එය නො දකින නමුත්, සිතක් ඇති බව විශ්වාස කරන අතර, ඇසට නො පෙනෙන මැවුම්කරු වෙත විශ්වාස තැබීම ප්‍රතික්ෂේප කරති.

ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ද ස්වර්ගය හා අපාය විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කළ නමුත් ඔවුහු නො දුටු වෙනත් ලෝකවල පැවැත්ම පිළිගත්හ. විද්‍යාව ඔහුට පැවසුවේ මිරිඟු වැනි ප්‍රථමයෙන් නො පවතින දේවල් තහවුරු කර විශ්වාස කරන ලෙසත් එය විශ්වාස කර එය පිළිගන්නා ලෙසත්ය. මරණයෙන් පසු, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව මිනිසුන්ට පොරොන්දු වූ පරිදි කිසිදු ඵලක් ගෙන දෙන්නේ නැත.

අදේවවාදීන් හා දෙවිඳා විශ්වාස කරන, දේව ග්‍රන්ථය විශ්වාස කරන කෙනෙක් අතර පවතින වෙනස නම්, අදේවවාදියා ඇසට නො පෙනෙන නිර්මාතෘවරයාගේ පැවැත්ම විශ්වාස කරන කෙනෙකු ගැන සළකන්නේ ඔහු නොදියුණු මිනිසෙකු ලෙසය. එයට හේතුව, ඔහු නො දකින දෙයක් විශ්වාස කරන බැවිනි. නමුත් විශ්වාස කරන්නා තම තත්ත්වය ඔසවා තබන සහ ඔහුගේ තරාතිරම උසස් කරන යමක් පිළිබඳ විශ්වාස කළත්, භෞතික විද්‍යාවේ සහ රසායන විද්‍යාවේ පොත්පත් පිවිතුරු යැයි සිතන අදේවවාදියා, දේව පැවැත්මක් නැතැයි විශ්වාස කිරීම, ඔහුගේ තත්ත්වය පහත හෙලා දමන බව සළකයි.

**මැවුම්කරුගේ පැවැත්ම:**

විශ්වයේ නිර්මාතෘවරයෙකුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය පදනම් වී ඇත්තේ හේතුවක් නොමැතිව කිසිවක් සිදු නො වීම හෝ අහඹුෙන් විශ්වයේ නිර්මාණය සිදුවිය නො හැකිය යන්න මතය. මන්ද අහඹු සිදුවීම ප්‍රධාන හේතුවක් නො ව ද්විතියික ප්‍රතිඵලයක් මත රඳා පවතී. මෙම සාධකවලින් සමන්විත වෙනත් සාධක (කාලය, ස්ථානය, පදාර්ථය සහ ශක්තියේ පැවැත්ම) තිබීම අහඹු සිදුවීමක් නො වේ. "අහම්බෙන්" යන වචනය කිසිවක් පැහැදිලි කිරීමට භාවිත කළ නො හැකිය, මන්ද එය සම්පූර්ණයෙන් ම කිසිවක් නො වේ.

**සත්‍යය අවබෝධ කර ගැනීම:**

ආනුභවික ද්‍රව්‍ය විද්‍යාව කෙරෙහි අපගේ සම්පූර්ණ විශ්වාසය තැබීමේ ගැටලුව නම් එය වෙනස්වීමට ලක්වන සුලු නිසාය. පෙර න්‍යායන් ප්‍රතික්ෂේප කරන නව සොයාගැනීම් සෑම දිනකම සිදු වේ. අපි විද්‍යාවක් ලෙස සලකන සමහර දේවල් තවමත් න්‍යායික පමණි. සියලු ම විද්‍යාව ඔප්පු කර නිවැරදි යැයි අපි උපකල්පනය කළත් අපට තවමත් ගැටලුවක් තිබේ.

වර්තමානයේ පර්යේෂණාත්මක විද්‍යාව, යමක් සොයා ගත් තැනැත්තාට සියලු කීර්ති නාමයන් ලබා දෙන අතර, එය නිර්මාණය කළ තැනැත්තා නො සලකා හරියි. උදාහරණයක් ලෙස - යමෙකු කාමරයකට ගොස්, ඉතා සූක්ෂම ලෙස පින්තාරු කරන ලද, ඇදහිය නො හැකි පිළිවෙලකින් සහ සම්මිතියකින් යුත් අලංකාර චිත්‍රයක් එහි සොයාගෙන, පසුව ඒ ගැන මිනිසුන්ට දැනුම් දෙයි. චිත්‍රය සොයාගත් පුද්ගලයා ගැන සෑම කෙනෙකු ම මවිතයට පත් වූ නමුත්, "එහි චිත්‍ර

ශිල්පියා කවු ද?" යන වඩාත් ම වැදගත් ප්‍රශ්නය ඇසීමට පවා ඔවුහු අමතක කරති.

මිනිසුන් සිදු කරන්නේ මෙයයි; ස්වභාවධර්මයේ සහ අභ්‍යවකාශයේ නියමයන් පිළිබඳ විද්‍යාත්මක සොයා ගැනීම් ගැන ඔවුන් කොතරම් පුදුමයට පත්ව සිටිනවාද යත්, විශ්වයේ නීති, ශක්තිය, පදාර්ථ ආදිය නිර්මාණය කළ තැනැත්තාගේ නිර්මාණශීලීත්වය ඔවුන්ට අමතක වී ඇත. විද්‍යාඥයන් සිදු කරන්නේ පවතින නීති සොයා ගැනීම පමණය. නමුත් ඔවුන් මේ නීති නිර්මාණය කළේ නැත. ඒවා සියල්ල නිර්මාණය කළේ මැවුම්කරු විසිනි.

පොත ගැන දන්නා පමණින් ලේඛකයාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කළ නො හැකිය. ඒවා ආදේශක නො වේ. විද්‍යාව විශ්වයේ නියමයන් සොයාගත් නමුත් ඒවා සකස් කළේ නැත. ඒවා සකස් කර ඇත්තේ මැවුම්කරුය.

දේවත්වය විශ්වාසය කරන්නන් අතර ද භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව පිළිබඳ ඉහළ උපාධිධාරීන් සිටිති. නමුත් මෙම විශ්වීය නීති, ඒවා පිටුපස ශ්‍රේෂ්ඨ නිර්මාපකයෙකු සිටින බව ඔවුහු තේරුම් ගනිති. මන්ද භෞතිකවාදීන් විශ්වාස කරන ද්‍රව්‍ය විද්‍යාව සොයාගෙන ඇත්තේ දෙවිඳා විසින් නිර්මාණය කරන ලද නීතියයි. නමුත් විද්‍යාව කිසිවිටෙක මෙම නීති නිර්මාණය කළේ නැත. දෙවිඳා විසින් නිර්මාණය කරන ලද මෙම නීති නොමැතිව විද්‍යාඥයින්ට අධ්‍යයනය කිරීමට කිසිවක් නැත. දේවත්වය පිළිබඳ විශ්වාසය(ඊමානය), මෙලොව සහ පරලොව විශ්වාස කරන්නන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

පුද්ගලයෙකුට දරුණු හෙම්බිරිස්සා හෝ අධික උණක් ඇති වූ විටෙක, ඔහුට බීමට වතුර වීදුරුවක් පවා තමා විසින් ලබා ගත නො හැකිය.

එසේනම් ඔහු තම මැවුම්කරු සමග ඇති සබඳතාව අත්හැරිය හැක්කේ කෙසේ ද?

විලියම් ජේම්ස් පවසන පරිදි, “සාගරයේ පෙරළී එන කැළඹිලි සහිත රළ කිසි විටෙකත් ගැඹුරු පතුලේ සන්සුන් භාවයට බාධා නො කරයි. එහි ආරක්ෂාවට බාධා නො කරයි. එසේ ම, දෙවිඳා කෙරෙහි ගැඹුරු විශ්වාසයක් ඇති අයෙකුට තාවකාලික මතුපිට කැළඹීම්වලින් තම සාමයට බාධාවක් නො වේ. සැබවින් ම ධාර්මික මිනිසා කනස්සල්ලට පත් නො වන අතර සෑම විටම සන්සුන්ව, කාලය ගෙන එන ඕනෑ ම දෙයකට මුහුණ දීමට සැම විට ම සූදානම්ය.

**ආගම කුමකට ද?**

දේවධර්මය පිළිබඳ මහාචාර්ය හාන්ස් ෂ්වාට්ස් මෙසේ පවසයි:

"විද්‍යාව වැදගත් වන නමුත්, එය නිර්මාණය සඳහා භාවිත කළ හැකි සේම එය විනාශ කිරීම සඳහා ද භාවිත කළ හැකිය. විශ්වාසය සතු වැදගත්ම කාර්යභාරය මෙහි පැමිණේ. එනම් ප්‍රායෝගික අත් හදා බැලීමෙන් සියලු පිළිතුරු සැපයිය නො හැකිය, යැයි පැහැදිලි කරයි."

එමෙන් ම එතුමා මෙසේ ද පැවසීය:

"දේව විශ්වාසය සහ දැනුම එකිනෙකාට අවශ්‍ය වන අතර, විද්‍යාඥයන් තමන් නිරීක්ෂණය කරන ස්වභාවධර්මයේ පැති අතර ගැඹුරු සම්බන්ධතා අවබෝධ කර ගැනීම සඳහා ඇතැම් විට දේව විශ්වාසය භාවිත කරන බව පිළිගත යුතුය."

ෂ්ර්ට්ස් (Schwartz) අදහස් කරනුයේ: විද්‍යාඥයන් තර්ක කරන පරිදි සියළු කරුණු සහ පිළිතුරු, ඔවුන් වෙත නොමැති බවයි. විද්‍යාඥයින් නොකඩවා අසන ප්‍රශ්න මගින්, මේ කාරණය සඳහා ඇති ලොකු ම

සාක්ෂියවෙ. විශේෂයෙන් ම ජීවයේ සම්භවය ගැන පර්යේෂණ කරන විද්‍යාඥයන් යම් නිගමනයකට එළඹෙන සෑම අවස්ථාවකම, ඊළඟ දවසේ ඊට පටහැනිව අලුත් සොයා ගැනීමක් සිදුවේ.

අපගේ ජීවිතයේ සම්භවය සහ ජීවත්වීමේ අරමුණ පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු දීමට, විද්‍යාවට නො හැකිය. එයට පිළිතුරු දීමේ කාර්යභාරය,පාරභෞතික වාදයට හෝ ආධ්‍යාත්මක විද්‍යාවට ලබා දී ඇත. විද්‍යාත්මක සොයාගැනීම් හේතුවෙන් සිදු වූ හිරෝෂිමා අනතුර සහ අනෙකුත් ව්‍යසනයන්, විද්‍යාවේ නිර්දෝෂීභාවය අහිමි කර ඇත. දාර්ශනික කාල් ජැස්පර්ස් සහ තවත් අය භෞතික විද්‍යාව මිථ්‍යා විශ්වාසයක් ලෙස හැඳින්වූහ.

මෙයින් අප නිගමනය කරන්නේ, විද්‍යාව විසින් ප්‍රශ්නයට පිළිතුරු දුන් බව තාර්කිකව අප පිළිගන්නේ නම්, 'විශ්වයේ සම්භවය සිදු වූයේ කෙසේ ද?' යන්නයි. විද්‍යාව සහ ආගම අතර පිළිගැනීම හා ඒකාග්‍රතාවෙන් මිස විද්‍යාත්මක දියුණුව පවත්වා ගනිමින් ජීවිතයේ සහ ආචාර ධර්මවල ආරම්භය සහ අරමුණ පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දිය නො හැකිය.

විද්‍යාවෙන් පුද්ගලයෙකුට මිසයිලයක් සෑදිය හැකිය. නමුත් මෙම විද්‍යාවෙන් උදාහරණයක් ලෙස ඔහුට චිත්‍රයක අලංකාරය රස විඳිය නො හැකිය. ඒවායේ වටිනාකම අගය කිරීමට හෝ එයට හොඳ නරක අපට පැවසිය නො හැකිය. වෙඩි උණ්ඩයක් මරා දමන බව විද්‍යාවෙන් අපි දනිමු, නමුත් එය අන් අයව මරන්නට භාවිත කිරීම වැරදි බව වටහා ගන්නට එය අපට උපකාර නො කරයි.

සුප්‍රසිද්ධ භෞතික විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් මෙසේ පවසයි:

"ආචාර ධර්මයට විද්‍යාව මූලාශ්‍රයක් විය නො හැකිය. විද්‍යාව සඳහා ආචාර ධාර්මික පදනම් ඇති බවට සැකයක් නැත, නමුත් ආචාර ධර්ම සඳහා විද්‍යාත්මක පදනම් ගැන අපට කතා කළ නො හැකිය. විද්‍යාවේ නීති සහ සමීකරණවලට ආචාරධර්ම යටත් කිරීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක වී ඇති අතර ඉදිරියට ද අසාර්ථක වනු ඇත."

සුප්‍රසිද්ධ ජර්මානු දාර්ශනික ඉමැනුවෙල් කාන්ට් මෙසේ පවසයි.

“දෙවිඳාගේ පැවැත්ම පිළිබඳ සදාචාරාත්මක සාක්ෂිය යුක්තියේ අවශ්‍යතා අනුව ස්ථාපිත කරන ලදී. මන්ද යහපත් මිනිසාට ත්‍යාග ලැබිය යුතු අතර, නපුරු මිනිසාට දඬුවම් කළ යුතු බැවිනි. සෑම දෙයක් ම පාලනය කරන උසස් ප්‍රභවයක් ඉදිරියේ මිස මෙය සිදු නො වේ. මිනිසා තමා කළ දෙයට වග කිව යුතු අතර, සාක්ෂිය පදනම් වී ඇත්තේ ගුණය සහ සතුට ඒකාබද්ධ කිරීමේ හැකියාවෙන් අවශ්‍ය දේ මත ය. මන්ද සියල්ල දන්නා සහ සර්වබලධාරී වන ලෝකෝත්තරයාණන් ඉදිරියේ මිස ඒවා ඒකාබද්ධ කළ නො හැකිය. ස්වභාව ධර්මයට ඉහළින් ඇති මෙම උත්තරීතර සහ පවතින මූලාශ්‍රය දෙවිඳා වහන්සේ නියෝජනය කරයි.

**වහල්භාවයෙන් නිදහස:**

නො වැළැක්විය හැකි කරුණ වනුයේ, අපි මැවුම්කරුට නැමදුම් නො කරන්නේ නම්, අවසානයේ වෙනත් “දෙවියන්ට” අපි නමස්කාර කරන්නට යොමු වීමය. මිනිස් හදවත එක්කෝ එය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන ලෞකික කාරණයකට සම්බන්ධ වන අතර එය ලබා ගැනීමට එය පසුපස දුවයි. එසේ නැතහොත් එය එහි නිර්මාතෘ හා එහි පැවැත්මේ මූලාරම්භය සමඟ සම්බන්ධ වේ. එබැවින් අපගේ තණ්හාවන් සහ ආශාවන් අපට නො දැනුවත්ව ම අපව

වහල්භාවයට පත් කළ හැකිය. අපගේ හදවත් සර්වබලධාරී අල්ලාහ් සහ පරලොව සමඟ සම්බන්ධ කිරීම, අපව අන් අයට වහල් වීමේ චක්‍රයෙන් මුදා හරියි. සර්වලෝකයේ ස්වාමියා අපගේ මැවුම්කරු වන අතර අප හැරී උපකාර ඉල්ලා සිටින අයගෙන් වඩාත් ම සුදුසු වන්නේ ඔහුය.

බොහෝ අය කීර්තියට හා විලාසිතාවට ආකර්ෂණය වේ. මීට අමතරව, වෙළඳ දැන්වීම් සහ සමාජ මාධ්‍ය මිනිසුන්ගේ අවධානය අධික ලෙස ආකර්ෂණය කර ගනී. අණු කෙරෙහි අවධානය යොමු කරන සහ ප්‍රමුඛතා බාධාවක් වන ඌන සංකල්ප විකාශනය කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි, මෙය අපගේ දුක් වේදනාවලට දායක වන අතර අපව කැළඹිලි සහිත අසතුටුදායක ජීවිතයක් ගත කරන්නට මග සළස්වයි.

එසේ ම, උරුම වූ සම්ප්‍රදායන් සහ සංකල්ප නිරීක්ෂණය කිරීමට අපට බල කරන සමහර සමාජ සම්මතයන් සහ වෙනත් පවුල් බලපෑම්, මේ ජීවිතයේ අපෙන් අවශ්‍ය දේ සහ අපගේ මැවුම්කරු කෙරෙහි අපගේ යුතුකමෙන් අපව ඈත් කරයි.

**යුතුකම් සහ වගකීම්:**

විශ්වයේ නිර්මාතෘවරයෙකුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය, යුතුකමක් මෙන් ම වගකීමකි. එම විශ්වාසය හෘද සාක්ෂිය අවදියෙන් තබන අතර, සෑම කුඩා හා ප්‍රධාන දෙයක දී ම තමාට වගකියන්නට සිදුවන බව දන්වා එය දේව විශ්වාසියා උනන්දු කරවයි. දේව විශ්වාසියා තමාට, තම පවුලට, තම අසල්වැසියාට සහ මගියාට පවා වගකිව යුතු වේ. ඔහු සියළු සාධක පිළිපදිමින් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබයි. දේව

විශ්වාසීන් යනු අබිංවලට ඇබ්බැහිවූවන් යැයි, අද අපකීර්තයට පත්කරනු ලැබුවන්ගේ ලක්ෂණයක් යැයි මම නො සිතමි.

ජනයාගේ සැබෑ අබිං වන්නේ, අදේවවාදය මිස දේව විශ්වාසය නො වේ. අදේවවාදය තම අනුගාමිකයින් භෞතිකවාදයට කැඳවා, ආගම ප්‍රතික්ෂේප කිරීමෙන් සහ වගකීම් සහ යුතුකම් අත්හැරීමෙන් ඔවුන්ගේ මැවුම්කරු සමඟ ඔවුන්ගේ සම්බන්ධතාව කොන් කර, ප්‍රතිවිපාක නො තකා, ඔවුන් ජීවත් වන මොහොත භුක්ති විඳීමට ඔවුන්ව පොළඹවන බැවිනි. දිව්‍යමය අධීක්ෂකයෙකු හෝ ගිණුම් බලන්නෙකු නොමැති බවත්, නැවත නැගිටීමක් හෝ ගිණුමක් නොමැති බවත් විශ්වාස කරමින් ඔවුන් ලෞකික දඬුවම්වලින් ආරක්ෂිත තත්වයක ඔවුහු කැමති දේ කරති. සැබැවින් ම එය(අබිංවලට) ඇබ්බැහි වූවන් ගැන විස්තරයක් නො වේ ද?

**තමාට උසස් නිලයක්:**

මා කියැ වූ හා මා පුදුමයට පත් කළ කරුණ:

"යමෙකු අපරාධයක් කළහොත්, අපරාධය භෞතිකවාදී දෘෂ්ටිකෝණයකින් සිදු වූවත්, අපරාධකරු පාපෝච්චාරණය කළත්, විත්තිකරුගේ නීතිඥයා එය චේතනාවකින් තොරව සිදු වූවක් බව ඔප්පු කිරීමට උත්සාහ කරයි. කෙසේ වෙතත් අපරාධය සිදු කරන අවස්ථාවේ චේතනාව සහ අභිප්‍රාය සොයා ගැනීමට සහ චූදිතයාගේ මානසික තත්වය දැන ගැනීමට නීතිය මැදිහත් වනු ඇත.

මෙහිදී වියුක්ත භෞතිකමය සිදුවීමට වඩා උසස් ස්ථානයක අපි ඔහුව තබමු.

එහිදී ඇත්ත වශයෙන් ම, අපි ලෝකයේ සිදු වූ දේ විනිශ්චය නො කරමු. නමුත් අපි ඔහු තුළ සිදු වූ දේ විනිශ්චය කරමු.

මෙයින් පිළිබිඹු වන්නේ මිනිසා සහ ලෝකය අතර ඇති මූලික ප්‍රතිවිරෝධතාවයි. ආචාර ධර්මවලට වියුක්ත භෞතිකමය ප්‍රමිතීන් මඟින් මනිනු නො ලබන සහ ස්වභාවික නීතිවලට යටත් නො වන වටිනාකමක් තිබිය යුතුය.

අව්‍යාජ සදාචාරාත්මක හැසිරීම, පරිත්‍යාගය, පරමාදර්ශ, තපස්, බ්‍රහ්මචර්යාව සහ පරාර්ථ චර්යාව යන මෙම මූලික සදාචාර, දෙවිඳාගේ පැවැත්ම සම්බන්ධයෙන් එක්කො ඒවාට අර්ථයක් තිබිය හැකිය. නැතහොත් අර්ථයක් නො තිබිය නො හැකිය.”[2].

**ධනය හා දරුවන් කිසිදු ප්‍රයෝජනයක් නො වන දිනයේ දී:**

කොරෝනා අර්බුදයේ දී අප දුටුවේ කිසිවෙකු නො දන්නා මියගිය මිනිසුන් සහ වැඩිහිටියන්ගේ නිවෙස් අප්‍රාණික මළ සිරුරුවලින් පිරී තිබුණු ආකාරය හා ඔවුන් අවට සිටින සියල්ලන් ම නීරෝධානය කර තැබූ ආකාරයයි. මහ පාරේ මිය යන අය ගැන කිසිවකු නො දනිති. එමෙන් ම මුදල් ඇති අය ප්‍රතිකාර සඳහා බලා සිටින අතර ඔවුන් තරුණයන් වෙනුවෙන් මහලු අය බිලි දෙන ආකාරය සහ රෝහල් ඇඳන් සඳහා රෝගීන් පොරකන ආකාරයයි. මෙම තත්වය, අවසාන දිනයේ යළි නැගිටුවනු ලබන දර්ශනයට සමාන දර්ශනයක් ඉදිරිපත් කරයි.

කොරෝනා අර්බුදය මිනිසුන්ගේ හදවත්වලින්, ඔවුන් තම මිත්‍යාවන් පදනම් වූ සංකේත බොහෝමයක් ඉවත් කළේය. අල්ලාහ් හැර ඔවුන්

---

[2] ආචාර්ය හයිතම් තල්අත්ගේ "හදවතේ ඇති දේ සුවකිරීම" නම් කෘතිය.

නැමදුම් කරමින් සිටි ඔවුන්ගේ ව්‍යාජ දෙවිවරුන් එකින් එක ඉවත් කළේය. ධනයට වහල් වූ තැනැත්තන් හට එම ධනය ප්‍රයෝජනවත් වූයේ නැත. තමන් මුදවා ගන්නා එක ම කරුණ භෞතික විද්‍යාව යැයි සිතූ තැනැත්තන් හට එම විශ්වාසය ප්‍රයෝජනවත් වූයේ ද නැත. එමෙන් ම ගල් හා පිළිම යාඥා කළ තැනැත්තන් ඒ හරහා රෝග ආසාධනය වනු ඇතැයි බියෙන් ඒවාට සමීප වූයේ ද නැත. සෘජුව ම දෙවිඳා වහන්සේ වෙත යොමු වන මෙන් සහ තමන් වෙත පැමිණීමෙන් වළකින්නැයි පූජකයන් ද තම අනුගාමිකයන්ගෙන් ඉල්ලා සිටින බහලුව අපට අසන්නට ලැබිණ. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. එවන් දෙවියාගේ හිරු ලෝකයේ බබළන්නට විය.

මෙම තත්ත්වය සර්ව ලෝකයේ ස්වාමියා වෙත මිනිසාව නැවත හරවා ඔහු වෙත යොමු කර, ඔහුගෙන් උපකාර පැතීමට සළස්වනු ඇතැයි කිසිදු සැකයක් නැත. උතුම් හදීසයේ වචන ඒවායේ අලංකාර අර්ථයන්ගෙන් මෙසේ ප්‍රකාශ වේ:

"ඔබ යමක් ඉල්ලන්නේ නම් අල්ලාහ්ගෙන් ඉල්ලනු. ඔබ උදව් පතන්නේ නම් අල්ලාහ්ගෙන් ම උදව් පතනු." මෙය තිර්මිදි විසින් වාර්තා කරන ලද්දකි.

වරක් මහළු ස්පාඤ්ඤ ජාතිකයෙක් මට පැවසූ වචන, මම සිහි කරමි. ඔහු මෙසේ පැවසීය: "බටහිර අපි දෙවියන්ට හෝ ක්‍රිස්තුස්ට නමස්කාර කරන්නේ නැහැ. අපි නමස්කාර කරන්නේ කාන්තාවන්ට සහ මුදල්වලට ය." ඔහු එය විහිළුවට පවසා සිටියත්, ඔහුගේ එම ප්‍රකාශය සත්‍යයකි. ඔහුගේ එම ප්‍රකාශය මට දැන් මතක් කර දෙන්නේ බටහිර රටවල සෑම කෙනෙකු ම, මම ඇතුළුව, "අනේ දෙවියනි! යනුවෙන් පවසා සිටීමු."

මෙලොව හා පරලොව යහපත උදාකර ගැනීම සඳහා අපට මෙලොව දී මැවුම්කරුව විශ්වාස කර, පැවැත්ම තිබුණත් නැතත් ඔහුට යටත් වන ලෙස ඔහු කරන ඇරයුම පිළිගැනීම හැර වෙනත් විකල්පයක් අපට නැත. එසේ නැතහොත් අපි මෙලොව ගැන සෑහීමට පත්වුවහොත්, අපි විනාශ වනු ඇත. අවසානයේ අපගේ ඉරණම අපාය වනු ඇත.

මෙම සාරාංශය තුළ, මැවුම්කරුගේ වචනවලින්, මැවුම්කරු විසින් පිහිටුවන ලද විශ්වයේ නීතිවලින් සහ මැවුම්කරු විසින් නිර්මාණය කරන ලද විශ්වයේ පැවැත්මෙන් විශ්වයේ මැවුම්කරුවෙකුගේ පැවැත්ම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට මට අවශ්‍ය විය. මැවුම්කරුගේ පැවැත්ම පිළිබඳ යථාර්ථයට අනුබල දෙන මැවුම්කරුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන්නන්ගේ ප්‍රකාශයන් මෙන් ම ඊට අමතරව ඔහුගේ පැවැත්ම විශ්වාස කරන සමහර විද්වතුන්ගේ ප්‍රකාශ ද ඉදිරිපත් කර ඇත.

ඇතැමුන් විශ්වාස කරන පරිදි තර්කයට, සහජ බුද්ධියට සහ නවීන විද්‍යාවට පටහැනි වන්නේ මැවුම්කරු ප්‍රතික්ෂේප කිරීමේ චින්තනය මිස මැවුම්කරු පිළිබඳ විශ්වාසය නො වන බව ඔප්පු කිරීමට මෙම පොත තුළින් අදහස් කෙරේ.

මෙම පොත මගෙන් පිළිගෙන, එය මඟ පෙන්වීමේ මූලාශ්‍රයක් බවටත් මැවුම්කරුගේ පැවැත්ම ප්‍රීතික්ෂේප කරන්නා සොයන විසඳුමට මෙය ප්‍රවේශයක් බවටත් පත් කර දෙන මෙන් මම සර්වබලධාරී අල්ලාහ්ගෙන් අයැද සිටිමි. මක්නිසාද යත් ඔහුගේ අදේවවාදය මෙම විසඳුම වෙත ළඟා වීමෙහි ඔහුගේ අසාර්ථකත්වය නිවේදනය කර ඇති බැවිනි.

# විශ්වය නිර්මාණය කළේ කවු ද?

විද්‍යාඥයා දේව විශ්වාස කරන්නෙකු නම්, නිසැකව ම මැවුම්කරු ගැන ඔහු කතා කරනු ඇත. නමුත් විද්‍යාඥයා අදේව වාදියෙකු නම්, ඔහු මෙසේ කියනු ඇත.: සුපිරි ඉංජිනේරුවෙකු හෝ බුද්ධිමත් බැක්ටීරියා හෝ අහඹුවක් හෝ විද්වතුන් පිරිසක් හෝ වෙනත් ග්‍රහලෝකයක පිටසක්වලින් පිරිසක් හෝ විශ්වයේ ආරම්භයට තුඩු දුන් දේ අත්හදා බලා ඇති බවයි.!

උත්තරීතර අල්ලාහ් මෙසේ පිළිතුරු දෙයි:

"අල්ලාහ් සියලු දෑහි මැවුම්කරුය. තවද, ඔහු සියලු දෑ කෙරෙහි භාරකරුය." (අස්-සුමර් 39:62)

"අහස්හි හා පොළොවෙහි උත්පාදකයාය. ඔහුට සහකාරියක් නො සිටිය දී ඔහුට දරුවකු ඇති වන්නේ කෙසේ ද? තවද, ඔහු සියලු දෑ මැව්වේය. තවද, සියලු දෑ පිළිබඳ ව ඔහු සර්වඥය." (101)

“ඔහුය අල්ලාහ්. නුඹලාගේ පරමාධිපතිය. ඔහු හැර නැමදුම් ලබන්නට කිසිවකු නොමැත. සියලු දෑහි මැවුම්කරුය. එබැවින් නුඹලා ඔහුට නැමදුම් කරනු. තවද, සියලු දෑහි භාරකරු වන්නේ ද ඔහුය.” (අල්-අන්ආම් 6:101-102)

“තවද, සැබැවින් ම අපි අහස් හා මහපොළොව ද ඒ දෙක අතර ඇති දෑ ද දින හයක් තුළ මැව්වෙමු. කිසිදු වෙහෙසක් අපට ඇති නො වීය.” (කාෆ් 50:38)

# මැවුම්කරු කවු ද?

"අල්ලාහ් වනාහි ඔහු හැර වෙනත් දෙවියෙක් නොමැත. සදා ජීවමාන ය, සදා පැවැත්ම ඇත්තා ය. මද නින්ද හෝ (තද) නින්ද හෝ ඔහු ව ග්‍රහණය නො කරයි. අහස් හි ඇති දෑ ද මහපොළොවේ ඇති දෑ ද ඔහු සතු ය. ඔහුගේ අනුමැතියෙන් මිස ඔහු අබියස මැදිහත් වන්නෙකු විය හැක්කේ කවරෙකුට ද? ඔවුනට ඉදිරියේ ඇති දෑ ද ඔවුනට පසුපසින් ඇති දෑ ද ඔහු දන්නේය. ඔහු අභිමත කළ පරිදි මිස ඔහුගේ දැනුමෙන් කිසිවක් ඔවුහු ග්‍රහණය නො කරති. ඔහුගේ අසුන අහස් හි හා මහපොළොවෙහි ව්‍යාප්ත ව ඇත. ඒ දෙක ආරක්ෂා කිරීම ඔහුට දුෂ්කර නො වේ. තව ද ඔහු අති උත්තරීතර ය. සර්ව බලධාරී ය. (අල් බකරා 2:255)

# මැවුම්කරු ව මැව්වේ කවු ද?

"ඔහු ප්‍රාරම්භකයාය. අවසානයාය. විද්‍යාමානයාය. (අදෘෂ්‍යමාන) අභ්‍යන්තරයාය. තවද, ඔහු සියලු දෑ පිළිබඳ සර්ව ඥානීය." (අල්-හදීද් 57:3)

"ඔහු වැනි කිසිවකුත් නොමැත. තව ද ඔහු සර්ව ශ්‍රාවක හා සර්ව නිරීක්ෂක වේ." (අෂ් ෂූරා 42:11)

# ඔහුගේ පැවැත්මේ යථාර්ථය කෙසේ නම් වන්නේ ද?

"අහස්හි හා මහපොළොවේ හිමිපාණන් මත දිවුරමින්. නියත වශයෙන් ම නුඹලා කතා කරනවාක් මෙන් සැබැවින් ම එය සත්‍යයක් මය." (අද්-දාරියාත් 51:23)

"ඔවුන් වෙත යැවූ දූතයෝ 'අහස් හා මහපොළොව මැවූ අල්ලාහ් කෙරෙහි නුඹලාට සැකයක් පවතින්නේ ද?' යැයි (ඔවුන්ගෙන්) විමසූහ." (ඉබ්රාහීම් 14:10)

# ඔහුගේ නාම හා ගුණාංග මොනවා ද?

"ඔහුය අල්ලාහ්. ඔහු වනාහි ඔහු හැර වෙනත් කිසිදු දෙවිඳෙකු නොමැත. ගුප්තය හා දෘශ්‍යයයමාන දෑ පිළිබඳ සර්ව ඥානීය. ඔහු අපරමිත දයාන්විත ය; අසමසම කරුණාන්විතය." (අල් හෂ්ර් 59:22)

"ඔහුය අල්ලාහ්. ඔහු වනාහි ඔහු හැර වෙනත් කිසිදු දෙවිඳෙකු නොමැත. ඔහු රජුය. පාරිශුද්ධය. සාමය ඇති කරන්නාය. අභයදායීය. සංරක්ෂකය. සර්ව බලධාරීය. මහෝදරයාණන්‍ය. ඔවුන් ආදේශ කරන දැයින් අල්ලාහ් සුවිශුද්ධය." (23) ඔහු අල්ලාහ්ය. මැවුම්කරුය. උත්පාදකය. මූර්තිකරුය. ඔහුට අලංකාර නාමයන් ඇත. අහස්හි හා මහපොළොවේ ඇති දෑ ඔහු ව සුවිශුද්ධ කරති. තවද, ඔහු සර්ව බලධාරීය; මහා ප්‍රඥාවන්තය. (24) (අල් හෂ්ර් 59:22-24)

## ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳ හඳුන්වාදීම.

"නියත වශයෙන් ම ඔහුගේ නියෝගය වනුයේ ඔහු යමක් (සිදු කිරීමට) අදහස් කළ විට එයට 'වනු' යැයි පැවසීම පමණය. එවිට එය සිදුවනු ඇත." (යා සීන් 36:82)

"තවද, තම ගැත්තන්ට ඉහළින් සිට මර්දනය කරන්නා ඔහුය. තවද, ඔහු නුඹලා වෙත ආරක්ෂකයින් (මලක්වරුන්) එවයි. අවසානයේ නුඹලාගෙන් කිසිවකු වෙත මරණය පැමිණි විට අපගේ සුරදූතවරුන් ඔහු ව අත්පත් කර ගනිති. තවද, ඔවුහු (තම වගකීම්) පැහැර නො හරිති." (අල්-අන්ආම් 6:61)

"තවද, ලෝ වැසියන්ගේ පරමාධිපති වන අල්ලාහ් අභිමත කරන්නේ නම් මිස, නුඹලා අභිමත නො කරන්නෙහුය." (අත්-තක්වීර් 81:29)

## නිරපේක්ෂ සැලසුම ඔහු සතුය.

"අහසේ සිට මහපොළොව දක්වා වූ සියලු ම කරුණු ඔහු සැලසුම් කරයි. පසු ව එහි ප්‍රමාණය නුඹලා ගණන් කරන වසර දහසක් වූ දිනක ඔහු වෙත එය ඉහළට යොමු වෙයි." (අස්-සජදා 32:5)

## සියලු පාලන කටයුතු ඔහු සතුය.

"අහස් හා මහපොළොවේ ගුප්ත දෑ අල්ලාහ් සතුය. සියලු කරුණු යොමු කරනු ලබනුයේ ඔහු වෙතට මය. එබැවින් නුඹ ඔහුට නැමදුම් කරනු. තවද, ඔහු වෙත සියල්ල භාර කරනු. නුඹගේ පරමාධිපති නුඹලා කරන දෑ පිළිබඳ ව අනවධානියෙකු නො වේ." (හූද් 11:123)

"අහස් හි ඇති දෑ ද මහපොළොවේ ඇති දෑ ද අල්ලාහ් සතු ය. තවද, සියලු කරුණු නැවත යොමු කරනු ලබනුයේ අල්ලාහ් වෙත ය." (ආලු ඉම්රාන් 3:109)

## පොදුවේ පොහොසත්බව ඔහු සතුය.

"කිසිදු දෙයක් එහි ගබඩාවන් අප වෙත මිස නැත. අපි එය නියමිත ප්‍රමාණයකින් මිස පහළ නො කරන්නෙමු."(අල්-හිජ්ර් 15:21)

"...අහස් හා මහපොළොවෙහි සම්පත් අල්ලාහ් සතුය. එනමුත් කුහකයින් වටහා නො ගනිති." (අල්-මුනාෆිකූන් 63:7)

"තවද, නුඹගේ පරමාධිපති අවශ්‍යතාවන්ගෙන් තොරය. කරුණාවෙන් යුක්තය. ඔහු සිතන්නේ නම් වෙනත් සමූහයක පරම්පරා වෙන් නුඹලා ව බිහි කළාක් මෙන් නුඹලා ව පහකොට නුඹලාගෙන් පසු ඔහු සිතන පරිදි (නුඹලා වෙනුවට වෙනත්) නියෝජිතයින් පත් කරනු ඇත." (අල්-අන්ආම් 6:133)

"අහෝ ජනයිනි! අල්ලාහ් වෙත යැපෙන්නෝ නුඹලාය. තවද, අල්ලාහ් වන ඔහු මය අවශ්‍යතාවන්ගෙන් තොර; ප්‍රශංසාලාභී." (ෆාතිර් 35:15)

"...තවද, කවරෙකු ප්‍රතික්ෂේප කළේ ද, සැබැවින් ම අල්ලාහ් ලෝවැසියන්ගෙන් (කිසිදු අවශ්‍යතා නොමැති) පොහොසතාය." (ආලු ඉම්රාන් 3:97)

## ගුප්ත දෑ පිළිබඳ යතුරු ඔහු සතුය.

“ගුප්ත දෑ හි යතුරු ඔහු සතු ව ඇත. ඔහු හැර වෙනත් කිසිවකු ඒවා නො දනී. තවද, ගොඩබිම හා මුහුදේ ඇති දෑ ඔහු දනී. ගසක කොළයක් පවා ඔහුගේ අනු දැනුමෙන් තොරව නො වැටෙයි. තවද, මහපොළොව අන්ධකාරය තුළ ඇති බීජය තෙතමනය හෝ වියළිභාවය ගැන පැහැදිලි පුස්තකයේ සඳහන් ව මිස නැත.”(අල් අනාම් 6:59)

## චතුර හැකියාව, බලය ඔහු සතුය.

“(නබිවරය) නුඹ පවසනු. සියලු රාජ්‍යවල අධිපතියාණනි! ඔබ අභිමත අයට රාජ්‍ය බලය පිරිනමන්නෙහිය. ඔබ අභිමත අයගෙන් රාජ්‍ය බලය ඉවත් කරන්නෙහිය. තවද, ඔබ අභිමත අය ව උසස් කරන්නෙහිය. ඔබ අභිමත අය ව පහත් කරන්නෙහිය. සියලු යහපත ඇත්තේ ඔබ අතෙහි ය. නියත වශයෙන් ම ඔබ සියලු දෑ කෙරෙහි ශක්තිවන්තයා ය.” "ඔබ, රාත්‍රිය දහවලෙහි ද දහවල රාත්‍රියෙහි ද ඇතුළු කරන්නේය. අජීවී දෙයින් ජීවී දේ ද, ජීවී දෙයින් අජීවී දේ ද, ඔබ උපදවන්නේය. තවද, ඔබ කැමති අයට කිසිදු ගණනයකින් තොර ව (අසීමිත ව) රිZස්ක් (ජීවත් වීමට අවශ්‍ය දෑ) ලබා දෙන්නේය." (27) (ආලු ඉම්රාන් 3:26,27)

# විශ්වය නිර්මාණය වූයේ කෙසේ ද?

"අහස් හි හා මහපොළොවේ උත්පාදකයා ය. ඔහු යම් කරුණක් තීන්දු කළ විට එය ට 'වනු' යැයි පවසනවා පමණ ය, එවිට එය සිදු වෙයි." (අල්-බකරා 2:117)

# පුපුරා වෙන්වීමෙහි අදියර

“නියත වශයෙන් ම අහස් හා පොළොව එකට තිබුනි. පසු ව අපි ඒ දෙක වෙන් කළ බවත්; තවද, ජීවමාන සෑම දෙයක් ම ජලයෙන් ඇති කළ බවත්; ප්‍රතික්ෂේප කළවුන් නො දුටුවෝ ද? එහෙයින් ඔවුහු විශ්වාස කළ යුතු නො වේ ද?” (අල් අන්බියා 21:30)

"අහස් හා මහපොළොව නිර්මාණය කළා වූ ද, පියාපත් දෙක බැගින් ද, තුන බැගින් ද, හතර බැගින් ද යුත් මලක්වරුන් (තම) දූතයින් බවට පත් කළා වූ ද අල්ලාහ්ට ම සියලු ප්‍රශංසා. ඔහු අභිමත කරන පරිදි එම මැවීම්හි වර්ධනය කරයි. නියත වශයෙන් ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි ශක්තිවන්තය."(ෆාතිර් 35:1)

පහත සඳහන් කරුණු සඳහන් වන අල්කුර්ආන් පාඨ තහවුරු කරයි.

"අල් අක්වාන්" (විශ්වය) එනම්: අහස් හා පොළොව එක ම කැබැල්ලක් සේ පිහිටා තිබිණි. ඒ ගැන විස්තර කර තිබුණේ බලවත් සේ එකිනෙකට බද්ධ වූ වස්තුවක් යන අදහස ගෙන දෙන "රතකා" නම් පදයෙනි.

## විශ්වයේ ප්‍රසාරණය "අහස"

"තවද, අපි අහස එය (අපගේ) බල ශක්තිය යොදා ඉදි කළෙමු. තවද, නියත වශයෙන් ම අපි ප්‍රසාරණය කරන්නන් වෙමු." (අද්-දාරියාත් 51:47)

## මහපොළොවේ පිහිටීම සහ අහසේ දුම් සම්භවය

"දින දෙකක් තුළ මහපොළොව මැවූ ඔහු ව නුඹලා ප්‍රතික්ෂේප කොට නුඹලා ඔහුට සමානයන් තබන්නෙහු ද? ලෝකයන්හි පරමාධිපති ඔහුය යැයි (නබිවරය!) නුඹ පවසනු." (9)

"තවද, ඊට ඉහළින් එහි (පොළොවෙහි) කඳු ඇති කළේය. තවද, එහි සමෘද්ධිය ඇති කළේය. දින හතරක් තුළ පෝෂණ සම්පත් නිර්ණය කළේය. මෙය ඒ ගැන විමසන්නන් හට සරිලන පිළිතුරකි." (10)

"පසු ව ඔහු අහස දෙසට යොමු විය. එය දුමක් මෙන් තිබීය. එවිට "ඔබ දෙදෙනා කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ පැමිණෙනුයි" එයට හා මහපොළොවට ඔහු පැවසීය. "අපි අවනත වන්නන් ලෙසින් පැමිණියෙමු" යැයි ඒ දෙක පැවසීය." (11)

"පසු ව ඒවා දින දෙකක් තුළ අහස් හතක් ලෙස පූර්ණවත් කළේය. තවද, සෑම අහසකට ම එහි න්‍යායය දන්වා සිටියේය. තවද, පහළ අහස අපි පහන් මඟින් අලංකාරවත් කළෙමු. තවද, (එය) ආරක්ෂාවක් වශයෙනි. එය සර්ව ඥානී සර්ව බලධාරියාණන්ගේ නිර්ණය කිරීමයි." (12) (ෆුස්සිලත් 41:9-12)

මෙම පාඨ පහත සඳහන් කරුණු පැහැදිලි කරයි: 1 වන හා 2 දින: පෘථිවි සංයුතිය.

3 වන හා 4 වන දින: කඳු ඒවාට ඉහළින් මුදුනේ සිට මතුවීම, එසේ ම පෘථිවි වාසීන්ගේ පෝෂණය නිර්ණය කිරීම. (එනම්, ශාක හා සතුන්)

අල් කුර්ආනය මීට වසර 1400 කට පෙර අහසේ දුම් සහිත සම්භවය ගැන කතා කර ඇත. නූතන යුගයේ ජර්මානුවන් දූවිලි අනාවරක නිපදවන තුරු අන්තර් තාරකා දූවිලි සොයා ගැනීමට නො හැකි විය. අන්තර් තාරකා දූවිලි සම්බන්ධයෙන් ගත් කල, අපගේ ලෝකය දූවිලි සහිත ලෝකයක් බව විද්‍යාඥයින් සොයාගෙන ඇති අතර, වර්තමාන විශ්වීය දූවිලි, අහසින් පිටවන දුමාරයේ කොටසක් පමණි.

අපගේ මන්දාකිණිය විශ්වයේ ඉහළ භාගයේ පිහිටා ඇති අතර ඉහළට නැඹුරුවකින් යුතුව එය ගමන් කරන බවත් අප සිටින්නේ විශ්වයේ ප්‍රසාරණය වන දිශාවට බවත් පර්යේෂණාත්මක විද්‍යාව තොරතුරු දන්වා ඇත.

## කාලය සහ අවකාශය නිර්මාණය කිරීම

"ඔහු වනාහි හිරු කාන්තිමත් ආලෝකයක් ලෙස ද, සඳු ආලෝකය විහිදුවන්නක් ලෙස ද මවා වර්ෂ ගණනය හා කාලපරිච්ඡේදය නුඹලා හඳුනා ගනු පිණිස එයට ස්ථානය නියම කළේය. එය සත්‍යයයෙන් යුතුව මිස අල්ලාහ් මැව්වේ නැත. දැනමුතුකම් ලබන ජනයාට මෙම වදන් ඔහු (මෙසේ) පැහැදිලි කරයි."(යූනුස් 10:5)

උත්තරීතර අල්ලාහ් තවදුරටත් මෙසේ පවසයි: "නියත වශයෙන් ම (අල්ලාහ් විසින්) අහස් හා මහපොළොව මැවීමෙහි ද, රාත්‍රිය හා දහවල මාරුවෙහි ද, ජනයාට ප්‍රයෝජනවත් දෑ රැගෙන මුහුදෙහි ගමන් කරන නැව්හි ද, අහසින් ජලය පහළ කර මහපොළොව මිය ගිය පසුව එය

එමඟින් ජීවමාන කොට, එහි සෑම සත්වයෙකු ම ව්‍යාප්ත කිරීමෙහි ද, සුළං හැමීමෙහි ද, අහස හා මහපොළොව අතර වසඟ කරනු ලැබූ වලාවන්හි ද අවබෝධ කරන ජනයාට සාධක ඇත." (අල්-බකරා 2:164)

## මැවීමෙහි අරමුණ කුමක් ද?

"ජින් වර්ගයා හා මිනිස් වර්ගයා මා නැමදීමට මිස අන් කිසිවක් උදෙසා මම නො මැව්වෙමි." (අද් දාරියාත් 51:56)

තවදුරටත් අල්ලාහ් මෙසේ පවසයි:

"ඔවුන් අතරින් ක්‍රියාවෙන් වඩාත් අලංකාර වනුයේ කවුරුන්දැයි අපි ඔවුන් පරීක්ෂා කරනු පිණිස මහපොළොව මත ඇති දෑ එයට අලංකරණයක් ලෙස ඇති කළෙමු." (අල්-කහ්ෆ් 18:7)

## මැවුම්කරුට මිනිසනුගෙන් අවශ්‍යතාවක් තිබේ ද?

"...නියත වශයෙන් ම අල්ලාහ් ලෝවැසියන්ගෙන් අවශ්‍යතා නොමැත්තෙකි." (අල්-අන්කබූත් 29:6)

## පරිණාමය පිළිබඳ සංකල්පය නිවැරදි කිරීම

මිනිසා සඳහන් කරන්නට තරම් වස්තුවක් ලෙස නො සිටියේය.

"(මෙසේ යැයි) පවසන්නට තරම් වස්තුවක් ලෙස මිනිසා නො සිටි කාලයක් මිනිසාට නො පැමිණියේ ද?" (අල්-ඉන්සාන් 76:1)

## ආදම්ගේ මැවීම ආරම්භයේ මැටියෙන් විය.

"සැබැවින් ම අපි මැටි සාරයෙන් මිනිසා මැව්වෙමු." (අල්-මුඃමිනූන් 23:12)

"ඔහු මැවූ සියලු දෑ අලංකාරවත් කළේය. තවද, මිනිසාගේ මැවීම මැටියෙන් ආරම්භ කළේය." (අස්-සජ්දා 32:7)

## මිනිස් පියා ආදම් ගරුත්වයට පත් කිරීම

“අහෝ ඉබ්ලීස්! මාගේ දෑතින් මා මැවූ දෑට නුඹ සුජූද් කිරීමෙන් නුඹ ව වැළැක්වූයේ කුමක් ද? නුඹ උඩඟු වූයෙහි ද, එසේ නැතහොත් උසස් අය අතරින් වූයෙහි දැ?”යි ඔහු(අල්ලාහ්) විමසීය." (සාද් 38:75)

"පසුව අපි මලක්වරුන්ට "ආදම් ට සිරස නමනු" යි පැවසූ විට ඉබ්ලීස් (ෂෙයිතාන්) හැර ඔවුන් (සියල්ලෝ ම) සිරස නැමූහ. ඔහු (එය ට) පිටුපෑවේ ය. උඩඟු විය. තව ද ඔහු දේව ප්‍රතික්ෂේපකයින් අතුරින් කෙනෙකු විය." (අල්-බකරා 2:34)

# ආදම්ගේ පරපුර මැවීම

"පසුව ඔහුගේ පරපුර නීච(ලෙස සළකන ධාතු) ජලයෙන් ඇති කළේය." (අස්-සජදා 32:8)

"පසු ව අපි ඔහු සුරක්ෂිත ස්ථානයක මිශ්‍ර වූ ශුක්‍රාණුවක් ලෙස තැන්පත් කළෙමු." (13)

"පසු ව අපි එම ශුක්‍රාණු ව එල්ලී පවතින ලේ කැටියක් බවට නිර්මාණය කළෙමු. පසු ව එම එල්ලී පවතින ලේ කැටිය මස් ගොබක් බවට නිර්මාණය කළෙමු. පසු ව එම මස් ගොබ අස්ථි බවට නිර්මාණය කළෙමු. පසු ව අපි එම අස්ථි මසින් ඇන්දෙව්වෙමු. පසු ව අපි ඔහු ව වෙනත් මැවීමක් ලෙසින් බිහි කළෙමු. එහෙයින් උත්පාදකයින්ගෙන් වඩාත් අලංකාර වූ අල්ලාහ් අති උත්කෘෂ්ට විය." (14) (අල් මුඃමිනූන් 23:13,14)

"තවද, ජලයෙන් මිනිසා මැව්වේ ඔහුය. පසු ව ඔහුට පරම්පරානුගත නෑකම් ද, විවාහ නෑකම් ද, ඔහු ඇති කළේය. තවද, නුඹගේ පරමාධිපති සර්ව බලධාරීය." (අල්-ෆුර්කාන් 25:54)

# ආදම්ගේ පරපුර ගරුත්වයට පත් කිරීම.

"තවද, සැබැවින් ම අපි ආදම්ගේ දරුවන් ගෞරවයට ලක් කළෙමු. තවද, ගොඩබිමෙහි හා මුහුදෙහි අපි ඔවුන් ඉසිලීමු. තවද, යහපත් දැයින් අපි ඔවුනට පෝෂණය කළෙමු. තවද, අප මැව්වා වූ දැයින් බොහෝ දෑට වඩා අපි ඔවුන්ව මහිමයට පත් කිරීමෙන් උසස් කළෙමු." (අල් ඉස්රා 17:70)

“(ඔහු) අහස් හා මහපොළොවේ නිර්මාපකයාය. නුඹලා තුළින් ම නුඹලා සඳහා වූ යුගල ද, එමෙන් ම ගොවිපළ සතුන් අතුරින් යුගල ද, ඔහු ඇති කළේය. එහි නුඹලා ව ඔහු බිහි කරයි. ඔහු මෙන් කිසිවෙක් නැත. තවද, ඔහු සර්ව ශ්‍රාවකය. සර්ව නිරීක්ෂකය.” (අෂ් ෂූරා 42:11)

## තෝරා ගැනීමේ නිදහස ආදම්ට පිරිනැමීම.

“අහෝ ආදම්! නුඹ ද, නුඹගේ සහකාරිය ද, ස්වර්ගයේ වාසය කරනු. නුඹලා දෙදෙනා එහි සිට කැමති දෑ කැමති පරිදි අනුභව කරනු. තව ද, නුඹලා දෙදෙනා මෙම ගස ට ළං නො වනු. එවිට නුඹලා දෙදෙනා අපරාධකරුවන් අතරින් වන්නෙහු යැයි අපි පැවසුවෙමු." (අල් බකරා 2:35)

"තවද, සත්‍යය නුඹලාගේ පරමාධිපතිගෙන් යැයි (නබිවරය) නුඹ පවසනු. එහෙයින් කවරෙකු අභිමත කළේ ද ඔහු විශ්වාස කරත්වා. තවද, කවරෙකු අභිමත කළේ ද, ඔහු ප්‍රතික්ෂේප කරත්වා...." (අල්-කහ්ෆ් 18:29)

## දැනුම හේතුවෙන් ආදම් තුමා වෙන්කර දැක්වීම

"ආදම් ට සියලු නාමයන් ඔහු ඉගැන් වීය. පසු ව ඒවා මලක්වරුන් වෙත ගෙන හැර පා ‘නුඹලා සත්‍යවාදීහු නම් මේවායෙ හි නාමයන් මට දැනුම් දෙනු යි’ ඔහු පැවසීය." (අල්-බකරා 2:31)

## වැරදි සිදු වීම තෝරා ගැනීමේ ප්‍රතිවිපාකයයි.

"පසු ව ආදම් තම පරමාධිපති ගෙන් වදන් (කිහිපයක්) හැදෑරුවේ ය. පසු ව ඔහු ඔහු ට පාප ක්ෂමා ව දුන්නේය. සැබැවින් ම ඔහු පශ්චාත්තාපය පිළිගන්නා, අසීමිත කරුණා වන්තය." (අල්-බකරා 2:37)

## මහපොළොවේ අනුප්‍රාප්තිය හඳුන්වා දීමේ කතාව

"තව ද නුඹගේ පරමාධිපති මලක්වරුන් (දේව දූතයින්) අමතා "සැබැවින් ම මම මහපොළොවේ නියෝජිතයකු පත් කරන්න ට යමි" යැයි පැවසූ අවස්ථාව සිහිපත් කරනු. 'අපි ඔබ ව ඔබගේ ප්‍රශංසාව තුළින් පිවිතුරු කරමින්, ඔබ ව සුවිශුද්ධ කරමින් සිටිය දී ඔබ එහි කලහකම් කරන, තව ද රුධිරය හළන පිරිසක් පත් කරන්නෙහි දැ'යි ඔවුහු පැවසූහ. 'නුඹලා නො දන්නා දෑ සැබැවින් ම මම දනිමි.' යැයි ඔහු පැවසීය." (අල් බකරා 2:30)

# මැවුම්කරුගේ පැවැත්ම සහ විද්‍යාත්මක නීති සහ න්‍යායන් සමඟ එහි සම්බන්ධය.

මැවුම්කරු ගැන සඳහන් නො කිරීමට, එකිනෙකට සම්බන්ධ පද්ධති අහඹු ස්වභාවයකට ආරෝපණය කෙරේ.

ඔවුන් මෙය කිසි විටෙක පිළිගෙන නැතත්, අදේවවාදී විද්වතුන් මැවුම්කරුව වෙනත් නම්වලින් (මව් ස්වභාවය, විශ්වයේ නීති, ස්වාභාවික තේරීම "ඩාවින්ගේ න්‍යාය", ආදී වශයෙන්) හඳුන්වන්නේ ආගමේ තර්කයෙන් සහ මැවුම්කරුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසයෙන් මිදීමට ගන්නා නිෂ්ඵල උත්සාහයකිනි.

"ඒවා නුඹලා හා නුඹලාගේ මුතුන් මිත්තන් ඒවාට නම් තැබූ (අර්ථ ශූන්‍ය) නාමයන් මිස වෙනකක් නැත. ඒවා පිළිබඳ කිසිදු සාධකයක් අල්ලාහ් පහළ නො කළේය. ඔවුහු අනුමානය හා සිත් ආශා කරන දෑ මිස වෙනෙකක් අනුගමනය නො කරති. ඔවුන්ගේ පරමාධිපතිගෙන් ඔවුන් වෙත සැබැවින් ම යහමග පැමිණ ඇත." (අන්-නජ්ම් 53:23)

**මා කිය වූ හා මා පුදුමයට පත් කළ කරුණ:**

නව ඩාවින්වාදය රඳා පවතින්නේ විකෘති හරහා ජීවීන්ගේ ගතිලක්ෂණවල වෙනස්වීම් ඇතිවීම මත ය. එමෙන් ම විකෘති යනු ජානමය ද්‍රවයවල ඇති (කඩාකප්පල්කාරී) දෑ මිස අන් කිසිවක් නො වේ.! අනුප්‍රාප්තික දෝෂ ජීවීන් තුළ අප දකින නිර්මාණශීලිත්වය ඇති කරන්නේ යැයි අපි විශ්වාස කළ යුතුයි! මෙය ළමයෙක් අවුරුදු ගාණක් පරිගණක පද්ධතියක සෙල්ලම් කරනවා වගේ පෙනේ මේ යතුරු පුවරුව මත ඇති අහඹු යතුරු පහරවල් ඉබේම අහඹු ලෙස වඩා හොඳ ක්‍රමයකින් නිර්මාණය වී ඇතැයි පවසන්නාක් මෙනි.

මහා පරිණාමයේ මූලධර්මයට සහ න්‍යායට ලබා දී ඇති අහඹු බව පිළිබඳ විස්තරයෙන් අදහස් වන්නේ අප මය:

පරිණාමය පිටුපස ඇත්තේ කුමක් ද? යි අපි නො දනිමු.

පරිණාමීය සංසිද්ධිවල යාන්ත්‍රනයන් අපි නො දනිමු.

එය අනුගමනය කරන රටාව කුමක්දැයි අපි නො දනිමු.

එහි සංසිද්ධීන් කුමක් දැයි අපට අනාවැකි කිව නො හැකිය.

මේ සියලු (non-cognitive)"ඥානාත්මක නො වන" දෑ තිබියදීත්, මහා පරිණාමය යනු ආරෝග්‍යමත් විද්‍යාත්මක න්‍යායක් බව සමහරු විශ්වාස කරති. නමුත් දේවත්වය විශ්වාස කරන්නාට, මහා පරිනාමය "කළු පෙට්ටි" (Black Box system) පද්ධතියකි.

පරිණාමය දන්නා කරුණක් වන නමුත්, එහි ක්‍රමය නො දන්නා කරුණකි. ඒ ගැන විශ්වාස කිරීම එය අනුගමනය කරන්නන්ගේ අනිවාර්ය යුතුකමකි. ඒ ගැන විමසීම මතභේදයකින් හෝ විවාදයකින් තොරව විද්‍යාත්මක නවෝත්පාදනයකි.

විශ්වයේ නීතිවල මූලාශ්‍රය තේරුම් ගැනීමට ඇති අකමැත්ත, පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමට නිදහසට කරුණක් ලෙස ගනු ලැබේ.

"එසේ නො ව, ඔවුහු ඒ පිළිබඳ දැනුමෙන් ග්‍රහණය කළ නො හැකි දෑ ද, එහි විග්‍රහය ඔවුන් වෙත නො පැමිණි දෑ ද ඔවුහු බොරු කළෝය. මෙලෙස ම ඔවුනට පෙර සිටියවුන් ද බොරු කළෝය. එබැවින් අපරාධකරුවන්ගේ අවසානය කෙසේ වී දැයි නුඹ විපරම්ශීලිව බලනු." (යූනුස් 10:39)

ඔවුහු මෙසේ පවසා සිටිති: දේවත්වය විශ්වාස කරන්නන් වන ඔබ "හිඩැස්වල දෙවිඳා" යන මූලධර්මය අනුගමනය කරන්නෙහුය. එනම්, ඔබ දැනුමේ හිඩැසක් සොයාගත් විට, එය සෑදීමට ඔබ දෙවියන්ට ආරෝපණය කරන්නේය.

අපි ඔවුන්ට පවසා සිටිනුයේ: "විශ්වයේ නීතිවල මූලාශ්‍රය ප්‍රභවයේ පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමට නිදහසට කරුණක් ලෙස වටහා ගැනීමට ඇති කැමැත්ත හෝ නො හැකියාව, ඇත්ත වශයෙන් ම සංජානනය සහ තර්ක ශාස්ත්‍රයේ (percetion and logic) විශාලත ම පරතරය වන "හිඩැස්වල අදේවවාදය" වේ.

## මැවුම්කරු කෙරෙහි විශ්වාස කිරීම අනිවාර්ය සාක්ෂි සමඟ අනුකූල වේ.

මැවිල්ලට අණ දුන් සහ නිර්මාණය කළ තැනැත්තා හැර, කිසිවෙක් මැවුම්කරු යැයි කියා සිටියේ නැත. ඔහු තම පණිවිඩකරුවන් මිනිස් වර්ගයා වෙත යවන විට මෙම සත්‍යය හෙළි කළේය. පොදු ස්ථානයක බෑගයක් හමු වූ විට, එම බෑගයේ සහ එතුළ ඇති දෑ ගැන තොරතුරු සපයන එක් අයෙකු හැර කිසිවකු බෑගයේ හිමිකරු තමා බව පැවසීමට නො පැමිණෙයි. හිමිකම් පාන වෙනත් කෙනෙක් ප්‍රතිවිරුද්ධ ලෙස පෙනී සිටින තුරු, බෑගය ඔහුගේ අයිතිය බවට පත්වනු ඇත. මෙය මානව නීතිවලට අනුගතය.

“අල්ලාහ්ගෙන් තොර ව නුඹලා විශ්වාස කළවුන් නුඹලා ඇරයුම් කරනු. අහස්හි හා මහපොළොවේ අණුවක තරම් ප්‍රමාණයක් හෝ ඔවුන් සතුව නැත. තවද, ඒ දෙකෙහි කිසිදු හවුලක් ද ඔවුනට

නොමැත. ඔවුන් අතරින් කිසිදු උරදෙන්නකු හෝ ඔහුට නැතැයි (නබිවරය!) ඔබ පවසනු.” (සබඃ 34:22)

"(අහස හා පොලොව) ඒ දෙකෙහි අල්ලාහ් හැර තවත් දෙවියකු සිටියේ නම් ඒ දෙක ම අර්බුදයට පත්වනු ඇත. එහෙයින් ඔවුන් වර්ණනා කරන දැයින් (අර්ෂ් හෙවත්) රාජධානියේ හිමිපාණන් වූ අල්ලාහ් සුවිශුද්ධය." (අල්-අන්බියා 21:22)

## මැවුම්කරුවෙකුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය, අභිප්‍රාය සහ අරමුණ පිළිබඳ සාක්ෂිවලට අනුකූල වේ.

"ජින් වර්ගයා හා මිනිස් වර්ගයා මා නැමදීමට මිස අන් කිසිවක් උදෙසා මම නො මැව්වෙමි." (56)

“ඔවුන්ගෙන් කිසිදු පෝෂණ සම්පතක් මම අපේක්ෂා නො කරමි. එමෙන් ම ඔවුන් මට ආහාර ලබා දිය යුතු යැයි ද මම අපේක්ෂා නො කරමි.” (57)

"සැබැවින් ම අල්ලාහ් (සියල්ලන්ට ම) ආහාර සපයන්නා සහ මහා බලසම්පන්නයා වේ." (අද් දාරියාත් 51:56-58)

# ප්‍රඥාවන්ත මැවුම්කරුවකු පිළිබඳ විශ්වාසය වනාහි එය අනුකූලතාව සහ පිළිවෙල පිළිබඳ සාක්ෂිවලට අනුකූල වේ.

"ඔහු වනාහි අහස් සත ම (එකිනෙක උඩ පිහිටන සේ) තට්ටු වශයෙන් මැව්වේය. කරුණාවන්තයාගේ මැවීම්හි පරස්පරතාවන් නුඹ නො දකිනු ඇත. එහෙයින් යම් පැලීමක් නුඹ දකින්නේ දැයි නෙත් යොමු කර බලනු." (අල්-මුල්ක් 67:3)

"නියත වශයෙන් ම අපි සෑම දෙයක් ම ප්‍රමාණයකින් යුතු ව මවා ඇත්තෙමු." (අල්-කමර් 54:49)

විශ්වයේ ව්‍යසන සහ රෝග පැවතීම පරිපූර්ණත්වයේ පැවැත්ම ප්‍රතික්ෂේප නො කරයි. අපි විශ්වයේ පරිපූර්ණත්වය කිසිසේත් සොයා නො ගත්තේ නම්, අසම්පූර්ණ දේවල්හි පැවැත්ම අපට අවබෝධ නො වනු ඇත. නිර්මාණයේ දෝෂයක් ඇතැයි පැවසීම එම කරුණුවල ප්‍රඥාව අවබෝධ කර නො ගැනීමක් මිස අන් කිසිවක් නො වේ. විශ්වයේ මැවුම්කරුවෙකුගේ පැවැත්ම විශ්වාස කරන්නා අරමුණකින් තොරව විශ්වයේ කිසිවක් සිදු නො වන බව විශ්වාස කරයි. එසේ නම් මෙලොව ජීවිතය යනු පුද්ගලයෙකු මරණින් මතු නැවත නැඟිටීම හා විනිශ්චය කිරීම සමඟ නැවත ආරම්භ කරන සදාකාලික ගමනක ආරම්භයයි. තවද, අප මෙලොව සිටීම අරමුණක් සහ උසස් ඉලක්කයක් සඳහා වන අතර, එනම් එය සර්වබලධාරී දෙවියන්ව දැන ගැනීම, ඔහුට නැමදුම් ඉටු කිරීම සහ ප්‍රාර්ථනා කරමින් හා අයැදිමින් ඍජුව ඔහු වෙතට නැඹුරු වීම, දුෂ්කර අවස්ථාවන්හි ඉවසීම සහ සතුටුදායක අවස්ථාවන්හි ස්තුති පුද කිරීම යනාදිය වේ.

## දේව බලය හා දේව ප්‍රඥාව තුළින් විශ්වය මිනිසාට වසඟ කර දී ඇත.

"තවද, ගොවිපළ සතුන් ද, ඔහු ඒවා නුඹලා වෙනුවෙන් මැව්වේය. එහි නුඹලාට ආරක්ෂිත ඇඟලුම් හා ප්‍රයෝජන ඇත. තවද, නුඹලා එවායින් අනුභව කරන්නෙහුය." (5),

"තවද, ගාල් කරන්නට සවසට දක්කාගෙන එන විට ද තණ බුදින්නට (උදෑසන) දක්කාගෙන යන විට ද නුඹලාට එහි අලංකාරය ඇත." (6),

"නුඹලා අසීරුවෙන් මිස ඒ වෙත ගෙන යාමට නො හැකි වූ ගමක් වෙත උන් නුඹලාගේ බඩුබාහිරාදිය උසුලාගෙන යති. නියත වශයෙන් ම නුඹලාගේ පරමාධිපති සානුකම්පිතය. මහා කාරුණිකය." (7)

"තවද, අලංකාරයක් ලෙස ද ඒවායෙහි නැග ප්‍රවාහනය කරනු පිණිස ද අශ්වයින් කොටළුවන් හා බූරුවන් ද (ඔහු මැව්වේය.) තවද, නුඹලා නො දන්නා දෑ ද ඔහු මවනු ඇත." (8) (අන්-නහ්ල් 16:5-8)

## දේව අධීක්ෂණය හා දේව දයාව තුළින් මිනිසාගේ බිහිවීම (වර්ධනය) සඳහා විශ්වයේ යෝග්‍යතාව

"අල්ලාහ් වනාහි ඔහු අහස් හා මහපොළොව මැව්වේය. තවද, අහසින් ජලය පහළ කළේය. එමගින් ඔහු නුඹලාට පෝෂණය වශයෙන් බවභෝග මතු කළේය. තවද, ඔහුගේ අනුමැතියෙන් මුහුදේ ගමන්

කරනු වස් නුඹලාට නැව් වසඟ කර දුන්නේය. තවද, නුඹලාට ගංගාවන් ද වසඟ කර දුන්නේය." (ඉබ්රාහීම් 14:32)

## දේව ප්‍රඥාව සහ දයාව තුළින් විශ්වයේ මැවීම් සඳහා ශ්‍රේෂ්ඨත ම ස්වරූපය නියම කිරීම.

"නුඹලා පානය කරන ජලය දෙස නුඹලා සිතා බැලුවෙහු ද?" (68)

"එය වලාකුළෙන් පහළ කළේ නුඹලා ද? එසේ නැතහොත් (එය) පහළ කරන්නෝ අපි ද?" (69)

"අපි අභිමත කර ඇත්නම් එය ලුණු බවට පත් කරන්නට තිබුණි. එහෙයින් නුඹලා (අල්ලාහ්ට) ගුණගරුක විය යුතු නො වේ ද?" (70)

(අල්-වාකිආ 56:68)

"නුඹගේ පරමාධිපති ඔහු හෙවණැල්ල කෙසේ දිගු හැරියේ දැයි නුඹ නො බැලුවෙහි ද? තවද, ඔහු අභිමත කළේ නම් එය එක්තැන් වූවක් බවට ඔහු පත් කරන්නට තිබුණි. පසු ව අපි ඒ වෙත සාධකයක් බවට හිරු පත් කළෙමු." (අල්-ෆුර්කාන් 25:45)

# ජීවීන් අතර පවතින යුගල මැවුම්කරුගේ පැවැත්ම සහතික කරන, පරිණාමවාදය අර්ථවිරහිත කරන සාක්ෂියකි.

"මහපොළොවේ හට ගන්වන දැයින් ද ඔවුන් තුළින් ද එමෙන් ම ඔවුන් නො දන්නා දැයින් ද ඒ සියලු යුගලයන් මැවූ ඔහු සුවිශුද්ධය."

(යාසීන් 36:36)

ස්වයං-නිර්මාණය, ඒක සෛලික ජීවීන් තුළ සොයාගත හැකි නමුත් පළමු සෛලය පවතින බව උපකල්පනය කිරීමෙන් එය ප්‍රජනන ක්‍රමයක් වන අතර ස්වයං-ප්‍රජනක ජීවියෙකු පරිණාමය විය හැකි බවට තර්කයක් සඳහා අප පිළිගන්නේ නම්, එය සිදුවිය හැකිය. නමුත් එය යුගලත්වයට අදාළ නො වේ. මක්නිසාද යත්, සජීවී ජීවියාගේ සංයුතිය සහ සංසර්ගය සඳහා එය නිර්මාණය කිරීම සඳහා එක් එක් යුගලය ඉන්ද්‍රියයන්ගේ  සංයුතියේ වෙනස, ඒවායේ ක්‍රියාකාරිත්වය, පිහිටීම සහ බොහෝ තොරතුරු යනාදී ලෙසින් සම්පූර්ණ නිරවද්‍යතාවෙන් වර්ධනය වීමට අවශ්‍ය දේ පිළිබඳ දැනුම අවශ්‍ය වන්නේය.

# මැවුම්කරු කෙරෙහි විශ්වාසය හේතු කාරක නීතියට අනුකූල වේ.

"එසේ නැතහොත් කිසිවක් නොමැති ව ඔවුන් මවනු ලැබුවෝ ද? එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ම ද?" (35)

"එසේ නැතහොත් ඔවුහු අහස් හා මහපොළොව මැව්වෝ ද? එසේ නො වේ, ඔවුහු තරයේ විශ්වාස නො කරති." (36)

"එසේ නැතහොත් ඔවුන් අබියස නුඹගේ පරමාධිපතිගේ භාණ්ඩාගාර තිබේ ද? එසේ නැතහොත් (ඒ මත) ආධිපත්‍යය දරන්නෝ ඔවුහු ද?"(37)

(අත්-තූර් 52:35-37)

විශ්වයේ නිර්මාතෘවරයෙකු නොමැතිකම පිළිබඳ උපකල්පනය, අප අවට ඇති බොහෝ ස්වාභාවික නීතිවලට පටහැනි වේ. සරල උදාහරණයක් නම් ඊජිප්තුවේ පිරමිඩ කිසිවක් නොමැති (ශූන්‍යයෙන්) සොයා ගන්නා ලදී යැයි පවසන්නාක් මෙනි. මෙම උදාහරණය, එම මතය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත්ය.

ස්වයං-නිර්මාණය යනු තාර්කික හා ප්‍රායෝගිකව සිදුවිය නො හැකි දැයකි. එයින් අදහස් වන්නේ යමක් එකවර තිබූනි සහ නො තිබූනි බවයි. මිනිසා තමාව නිර්මාණය කළ බව පැවසීමෙන් අදහස් කරන්නේ ඔහු පැවතිමට පෙර ඔහු සිටි බවත්ය. එය විය නො හැකි එකකි.

## විශ්වය විනාශ වී ඇත යන ඇත්ත, විනාශය තීරණය කරන තාප ගති විද්‍යාවේ දෙවන නියමයට අනුකූල වේ.

**(The fact that the universe is annihilated is consistent with the second law of thermodynamics, which determines annihilation)**

"ඒ (මහපොළොව) මත ඇති සියල්ල විනාශ වී යන්නක්ය." (අර්-රහ්මාන් 55:26)

මෙම නීතිය පවසන්නේ, "සියලු ශරීර උෂ්ණත්වය සමාන වන විට විශ්වය දැන් තාප මරණය කරා ගමන් කරන බවයි". විද්‍යාඥයන් පවසන පරිදි, 'විශ්වය සරල කිරීම සහ විසුරුවා හැරීම දෙසට ගමන් කරමින් පවතී. පසුව විශ්වය සහ එහි අඩංගු දේ විනාශ වී යයි.' ඒ අතර, 'විශ්වය සංකීර්ණත්වය සහ සංවර්ධනය කරා ගමන් කරන බව' අදේවවාදය පවසයි. එබැවින් මෙම නියමය ඩාවින්ගේ න්‍යාය විනාශ කරන බව විද්‍යාඥයෝ සලකති.

## මැවුම්කරු කෙරෙහි ඇති විශ්වාසය බාර්ක්ලේ මූලධර්මයට අනුකූල වේ. එය දේවල්වලට සාක්ෂි දරන මනස පැවැත්ම අවශ්‍ය වේ.

"...නියත වශයෙන් ම ඔහු සියලු දෑ කෙරෙහි සාක්ෂිකරුය යන්න නුඹේ පරමාධිපති ප්‍රමාණවත් නො වී ද?" (ෆුස්සිලත් 41:53)

මිනිසුන් වන අප ඉන්ද්‍රිය සංජානන පිළිබඳ අපගේ මනසේ ඇති දේ හැර බාහිර ලෝකය ගැන නො දන්නා බව මෙම මූලධර්මයේ සඳහන් වන අතර, මනසට අවශ්‍ය වන්නේ සියලු දේ අවශෝෂණය කර ඒවාට සාක්ෂි දරන සාකල්‍ය. මනසක (holistic mind) පැවැත්මයි, (එනම් මිනිසුන්ට වඩා වෙනස් බාහිර බලයක් තිබේ යන්නයි).

## මැවුම්කරු කෙරෙහි විශ්වාසය, මිනිස් අයිතිවාසිකම් සහතික කරයි.

"අහෝ මිනිසුනි! නියත වශයෙන් ම අපි පිරිමියකුගෙන් හා කාන්තාවකගෙන් නුඹලා ව මවා ඇත්තෙමු. තවද, නුඹලා එකිනෙකා හඳුනා ගනු පිණිස නුඹලා විවධ ජනවාර්ගිකයින් හා ගෝත්‍රිකයින් බවට අපි පත් කළෙමු. නියත වශයෙන් ම අල්ලාහ් අබියස නුඹලාගෙන් වඩාත් උතුම් වනුයේ නුඹලා අතරින් වඩාත් බියබැතිමත් වූවන්ය. නියත වශයෙන් ම අල්ලාහ් සර්ව ඥානීය; මහා අභිඥානවන්තය." (අල් හුජුරාත් 49:13)

## මැවුම්කරු පිළිබඳ වූ විශ්වාසය වනාහි, එය උපකල්පිත ජීවිතය සහ ඉලෙක්ට්‍රොනික් ක්‍රීඩාවක් වීම ප්‍රතික්ෂේප කරයි.

"තවද, අහස් හා මහපොළොව ද ඒ දෙක අතර ඇති දෑ ද හාස්‍යයක් ලෙස අපි නො මැව්වෙමු." (16)

"අපි හාස්‍යයට ගන්නට සිතුවේ නම්, එය එසේ සිදු කරන්නන් ලෙස සිටියෙමු නම් අප වෙතින් ම එය ගන්නට තිබුණි." (17)

"නමුත් අපි සත්‍යය ගෙන අසත්‍යයට එරෙහි ව පහර දෙන්නෙමු. එය (සත්‍යය), එවිට එය(අසත්‍යයට) පහ කර දමයි. එවිට එය විනාශ වී යන්නකි. තවද, නුඹලා වර්ණනා කරන දෑ හේතුවෙන් නුඹලාට විනාශය ඇත." (18)

"තවද, අහස්හි හා මහපොළොවෙහි සිටින්නන් ද, ඔහු අබියස සිටින්නන් ද, ඔහු සතුය. ඔහුට වන්දනාමානය කිරීම සම්බන්ධයෙන් ඔවුහු උඩඟු නො වෙති. තවද, ඔවුහු විඩාවට පත් නො වෙති." (19)

"රාත්‍රියෙහි හා දහවලෙහි ඔවුහු සුවිශුද්ධ කරති. තවද, ඔවුහු වෙහෙසට පත් නො වෙති." (20)

(අල්-අන්බියා 21:16-20)

මිනිස් ජීවිතය යථාර්ථය අනුකරණය කරන ඉලෙක්ට්‍රොනික් ක්‍රීඩාවක් බව පැවසීම තාර්කික නොහැකියාවකි. නමුත් ඉලෙක්ට්‍රොන සිය ගණනකට පමණක් ඇතැම් හැසිරීම් අනුකරණය කිරීමට අවශ්‍ය තොරතුරු ගබඩා කිරීම සඳහා විශ්වයේ ඇති පරමාණුවලට වඩා අධික පරමාණු අවශ්‍ය බව සොයා ගන්නා ලදී. අපට සිතාගත හැකි විශාලත ම පරිගණකයක වුවද, ක්වොන්ටම් භෞතික විද්‍යාව (Quantom Physics) සහ එහි සංකීර්ණ මූලධර්ම අප දන්නා ඕනෑ ම දියුණු තාක්ෂණයකින් ආකෘතිගත කිරීමට සහ අනුකරණය කිරීමට අපට නො හැකිය.

මිනිස් මනස පරිගණකයක යන්ත්‍රයක් නො වන අතර, එහි වෙනස පවතින්නේ එහි දැනුවත්භාවය තුළ ය.

"ඔවුන් මහපොළොවේ ගමන් කර නැති ද? එසේ (ගමන් කළේ) නම් එමඟින් වටහා ගත හැකි සිත් හා එමඟින් සවන් දිය හැකි කන් ඔවුන්ට පිහිටනු ඇත. නිසැකව ම දෘෂ්ඨීන් අන්ධ නො වෙයි. නමුත් ඔවුන් තුළ ඇති සිත් අන්ධ වෙයි." (අල්-හජ් 22:46)

"තවද, නුඹලාට ශ්‍රවණය ද දෘෂ්ටීන් ද හදවත් ද නිර්මාණය කළේ ඔහුමය. නුඹලා කෘතඥ වනුයේ ස්වල්පයකි." (අල්-මුඃමිනූන් 23:78)

# මිනිස් මනස යනු, එහි සංරචක (උපාංග) අසමත් වීම නිසා වැඩ නතර කරන පරිගණකයක් නො වේ.

"මෙලොව ජීවිතයේ මතුපිටින් වූ දෑ ඔවුහු දනිති. නමුත් මතු ලොව පිළිබඳ ව ඔවුහු අනවධානීන් ලෙස ම සිටිති." (අර්-රූම් 30:7)

ප්‍රසිද්ධ අදේවවාදියෙකු වන ස්ටීවන් හෝකින්ස් පැවසුවේ, 'නැවත නැඟිටුවනු ලබන දිනය ප්‍රතික්ෂේප කිරීමට නිදහසට කරුණක් ලෙස එහි සංරචක අසමත් වූ විට ක්‍රියා විරහිත වන පරිගණක යන්ත්‍රයක් මෙන් ජීවිතයේ අවසානය මනසේ හානිය සමඟ සම්බන්ධ වී ඇති' බවයි.

අපි ඔහුට මෙසේ කියමු: නිරෝගී මනසක් මළ සිරුරක හදවත ස්පන්දනය කර එහි පෙණහලු ආශ්වාස කරයි ද? සත්තකින් ම නැත. මන්ද මෙම මැරුණ පුද්ගලයාට බද්ධ වී ඉන් බැහැර වූ ආත්මයෙන් තොර වටිනාකමක් ඔහුට නොමැති නිසාවෙනි. ඒ නිසා අපි හොයන්නේ ආත්මයත් සමඟ ගැහෙන ශ්වසන පෙනහළු සහිත

හදවතක් ඇති ප්‍රාණය තියෙන ශරීරයකි. අදේවවාදියෙකු එහි පැවැත්ම හෝ එහි නිර්මාතෘවරයාගේ කරුණාව නො පිළිගෙන ඔහු සොයන ආත්මය හඳුනා නො ගත්ත ද, මොළය හෝ හිස මාරු කිරීමේ ක්ෂේත්‍රයේ සේවය කරන විද්‍යාඥයින්ගේ අත්දැකීම් ඒ බව පිළිගැනීම ප්‍රමාණවත්ය.

"නියත වශයෙන් ම අපි නුඹලා නිකමට මවා ඇතැයි ද, නියත වශයෙන් ම නුඹලා අප වෙත නැවත හැරී නො එනු ඇතැයි ද නුඹලා සිතුවෙහු ද?" (අල්-මුඃමිනූන් 23:115)

## මිනිස් මනස පරිගණක යන්ත්‍රනයට සංසන්දනය කිරීම අදේවවාදයට එරෙහි තර්කයකි.

පරිගණක යන්ත්‍රනය හැදුවේ ඉතා සීමිත මනසක් ඇති පුද්ගලයෙකි. එය අහම්බෙන් ඇති වූවක් නො වේ. මෙම පුද්ගලයා පරිගණක යන්ත්‍රනයට නිෂ්පාදනය කළ තැනැත්තාය. එය වඩාත් සංකීර්ණය. එමෙන් ම මිනිසා මෙලොවට පැමිණියේ අහම්බෙන් නො වේ, ඔහුට නිර්මාපකයෙකු සිටිය යුතුය. අදේවවාදියෙකු ළඟ පරිගණකය වූයේ නම් නැවත ජීවය ලබා දීමට කෙනෙකු සොයා නො ගනු ඇත. මෙයට හේතුව එහි නිර්මාතෘගේ හැකියාවන්ගේ දුර්වලතාවයි. ඔහු තමාව නිර්මාණය කර ඔහු වටා විශ්වය නිර්මාණය කිරීමට සමත් වුවද, එහි අපූරු නිර්මාණ සමඟ, ඔහුගේ මැවුම්කරුගේ බලය පිළිබඳ නිසැක වීමට සහ එය විනාශ කිරීමෙන් පසු එය යථා තත්ත්වයට පත් කිරීමට ඔහුට ඇති හැකියාව පිළිබඳව සහතික වනු ඇත.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:

"නියත වශයෙන් ම අල්ලාහ් අහස් හා මහපොළොව සත්‍යය මත මැවූ බව නුඹ නුදුටුවෙහි ද? ඔහු අභිමත කරන්නේ නම් නුඹලා ව ඉවත් කොට නව මැවීමක් ගෙන එනු ඇත." (ඉබ්රාහීම් 14:19)

මිනිස් මනස පරිගණකයකට සංසන්දනය කිරීමෙන් නැවත නැඟිටීම තහවුරු වේ.

පරිගනක යන්ත්‍ර නිෂ්පාදකයා තමන් මුල් වරට නිපද වූ උපකරණයට වඩා තමන්ට පහසු ආකාරයට පරිගණක යන්ත්‍ර උපාංග බිලියන ගණනින් යළි නිර්මාණය කර ඊට වඩා හොඳ දෙයක් නිර්මාණය කළ හැකි නම්, දෙවිඳා සතු පරමාදර්ශය කෙතරම් උසස් ද? මේ අතිවිශාල හැකියාවන්ගෙන් යුත් මුළු විශ්වය ම නිර්මාණය කළ, මිනිසාගේ මැවීම ආරම්භ කළ තැනැත්තාට මිනිසා හෝ විශ්වය තනියම යළි නිර්මාණය කරන්නට හෝ ඊට වඩා හොඳ දෙයක් නිර්මාණය කරන්නට හෝ නො හැකි වන්නේ කෙසේ ද?

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත: "තවද, මැවීම ප්‍රථමෝත්පාදනය කර, පසු ව එය යළි උත්පාදනය කරනුයේ ඔහුය. එය ඔහුට පහසු කාර්යයකි. තවද, අහස්හි හා මහපොළොවෙහි උසස් උපමාවන් ඔහු සතුව ඇත. තවද, ඔහු සර්වබලධාරීය; මහා ප්‍රඥාවන්තය." (අර් රූම් 30:27)

## මිනිසාගේ මනස පරිගණක යන්ත්‍රයට සංසන්දනය කිරීමෙන් සත්‍යය අවබෝධ වේ.

අදේවවාදියා පරිගණක යන්ත්‍රය සහ මිනිසා අතර හොඳින් සංසන්දනය කර බලන්නේ නම්, එහි භෞතික සංරචක සහිත

පරිගණකයට ශක්තියෙන් තොරව වටිනාකමක් නොමැති බවත්, එය වටා ඇති විද්‍යාත්මක යෙදවුම් සමඟ සම්බන්ධ කරන මෙහෙයුම් වැඩසටහනක් බවත් ඔහුට වැටහෙනු ඇත. එලෙස ම, මිනිසාට ඔහුව චලනය කර ඔහුට ජීවය ලබා දීමටත්, තමා සහ තමා අවට ඇති දේ හඳුනා ගැනීමටත්, ඔහුව ගල්, ගස් සහ අනෙකුත් සතුන්ගෙන් සංජානනය හා හැකියාවන්ගෙන් විශාල වෙනසක් ඇති කිරීමටත් ශක්තියක් තිබිය යුතුය. මේ ශක්තිය ඔහුගෙන් නොමැති නම්, දැනුවත්භාවය නැති වී යයි. ගැබ්ගැනීමේ මුල් මාසවල මව් කුසේ සිටින කලලරූපය තුළ, එය සංජානනය නොමැති මස් ස්කන්ධයක් බවට පත් වූ විට, අප දකින දේ එයයි. මරණයෙන් පසු පුද්ගලයෙකු අවබෝධයක් නොමැති මස් ස්කන්ධයක් බවට පත් වූ විට ඔහු තුළ අප දකින්නේ ද එයයි. ඒ අතර ඇති දේ ජීවයෙන් හා අවබෝධයෙන් පිරී ඇති බව අපට පෙනේ. ජීවය සහ දැනුවත්භාවය ලබා දෙන දෙයකින් ජීවත්ව සිටින තැනැත්තා මළවුන්ට වඩා උතුම් බව මනස නියම කරයි. එය බල ශක්තියෙන් ක්‍රියා නො කරන පරිගණකයට වඩා ක්‍රියා කරන පරිගණකයක් ශ්‍රේෂ්ඨ වන්නා සේය. අදේවවාදියා "විඥ්ඥාණය" ලෙසින් හැඳින්වූ මෙය, දෙවිඳා වහන්සේ "ආත්මය" ලෙසින් නම් කළේය.

"තවද, ඔවුහු රූහ් (හෙවත් ප්‍රාණය) පිළිබඳ නුඹගෙන් විමසති. 'රූහ් (පිළිබඳ දැනුම) මාගේ පරමාධිපතිගේ නියෝගයෙන් වූවකි. තවද, දැනුමෙන් නුඹලා වෙත පිරිනමනු ලැබ ඇත්තේ ස්වල්පයක් මිස නැතැයි' නුඹ පවසනු." (අල්-ඉස්රා 17:85)

# පරස්පර විරෝධී නිරපේක්ෂ බලය ප්‍රතික්ෂේප කිරීම

ඔවුහු මෙසේ පවසති: "මැවුම්කරුට, ඔසවන්නට නො හැකි විශාල පර්වතයක් නිර්මාණය කළ හැකිද?"

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රතිචාර දක්වයි: "තවද, ඔබේ පරමාධිපති ඔහුට අභිමත දෑ මවන්නේය. ඔහු තෝරා ගන්නේය. තෝරා ගැනීමේ (අයිතිය) ඔවුනට නොමැත. අල්ලාහ් සුවිශුද්ධය. ඔවුන් ආදේශ කරන දැයින් ඔහු උත්තරීතරය." (අල්-කසස් 28:68)

"අහෝ ජනයිනි! උපමාවක් ගෙන හැර පෙන්වන ලදී. එහෙයින් නුඹලා එයට සවන් දෙනු. නියත වශයෙන් ම අල්ලාහ් හැර දමා, නුඹලා ඇරයුම් කරන අය වනාහි ඔවුන් සියලු දෙනා එකතු වුවද මැස්සෙකු පවා ඔවුනට මැවිය නොහැක්කේමය. මැස්සා ඔවුන්ගෙන් යමක් පැහැර ගත්තේ නම් උගෙන් එය ඔවුන් මුදවා ගන්නට පවා ඔවුනට නො හැකිය. අයැදින්නා හා අයැදිනු ලබන්නා දුර්වල විය." (73)

"අල්ලාහ් ව ගරු කළ යුතු ප්‍රමාණයට ඔවුහු ඔහුට ගරු නො කළෝය. නියත වශයෙන් ම අල්ලාහ් අති බලවත්ය; සර්ව බලධාරීය." (74)

(අල්-හජ් 22:73,74)

"තවද, අල්ලාහ් ව නියම අයුරින් මහිමයට පත් කළ යුතු ආකාරයට ඔවුහු ඔහුව මහිමයට පත් නො කළෝය. තවද, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ මහපොළොව මුළුමණින් ම ඔහුගේ ග්‍රහණයේ පවතී. තවද, අහස් ඔහුගේ දකුණතෙහි ඔතනු ලැබ තිබේ. ඔවුන් ආදේශ කරන දැයින් ඔහු උත්තරීතරය; සුවිශුද්ධය." (අස් සුමර් 39:67)

නිර්මාතෘවරයාට ඔහුට වඩා විශාල පර්වතයක් නිර්මාණය කිරීමට ඇති හැකියාව ගැන අදේවවාදීන් නැවත නැවතත් කරන ප්‍රශ්නය දූෂිත ය. එය කෙනෙකුගෙන් ත්‍රිකෝණාකාර කවයක් ඇඳීමේ හැකියාව ගැන විමසීමක් වැනි ය. නිර්මාතෘ, එක ම දෙවිඳුන් වේ. ඔහුගේ මහිමය උත්කෘෂ්ටය. ඔහු ඔහුගේ මහිමයට නුසුදුසු දේ නො කරන අතර, උත්තරීතර ඔහු ඊට වඩා බෙහෙවින් උසස් ය.

පරමාදර්ශය අල්ලාහ් සතුය. ඕනෑ ම පූජකයෙකු හෝ ආගමක උසස් තරාතිරමක පුද්ගලයෙකු නිරුවතින් පොදු වීදිවලට නො යනු ඇත; ඔහුට එසේ කිරීමට හැකි වුවද, ඔහුට මේ ආකාරයෙන් මහජනයා අතරට යා නො හැකිය. මක්නිසාද යත් මෙම හැසිරීම ඔහුගේ ආගමික තරාතිරමට නොගැලපෙන බැවිනි.

## බහුවිශ්ව උපකල්පනයට මැවුම්කරුවෙකුගේ පැවැත්ම අවශ්‍ය වේ.

විශ්වයේ නිර්මාතෘවරයෙකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමට නිදහසට කරුණක් ලෙස අදේවවාදීන් වෙනත් විශ්වයන් පවතින බවට පැතිර යන උපකල්පනය, ඔවුන්ට ම එරෙහි තර්කයකි. මෙය තර්කයක් ලෙස පිළිගන්නේ නම්, මෙම විශ්වයටද මැවුම්කරුවෙකු සිටිය යුතුමයි.

"අහස් හා මහපොළොව මැවූ අය, ඔවුන් මෙන් දෑ මැවීමට ශක්තිය ඇත්තකු නො වේ ද? එසේ නො ව; ඔහුය සර්වඥානී, මහා මැවුම්කරු වන්නේ." (36:81)

"නියත වශයෙන් ම ඔහුගේ නියෝගය වනුයේ ඔහු යමක් (නිර්මාණය කිරීමට) අදහස් කළ විට එයට 'වනු' යැයි පැවසීම පමණය. එවිට එය සිදුවනු ඇත." (82)

"එහෙයින් සියලු දෑහි ආධිපත්‍යයන් තම අතෙහි වූ ඔහු සුවිශුද්ධ විය. තවද, ඔහු වෙතට මය නුඹලා යොමු කරනු ලබනුයේ." (83)

(යාසීන් 36:81-83)

## සරල ම පැහැදිලි කිරීම නිවැරදි බව පවසා සිටි ඔක්කාම්ගේ මූලධර්මය විශ්වාසයට අනුකූල වේ.

"එහෙයින් ඔබේ මුහුණ දහම වෙත ඔබ අවංක ව ස්ථාපිත කරනු. (එය) මිනිසා ඒ මත, මැවූ අල්ලාහ්ගේ ස්වභාව ධර්මයයි. අල්ලාහ්ගේ නිර්මාණයේ කිසිදු වෙනස් කිරීමක් නොමැත. එය ඍජු ධර්මයයි. නමුත් ජනයාගෙන් බහුතරයක් දෙනා එය නො දනිති." (අර් රූම් 30:30)

ආගම් අදහන ජනතාව අතරේ "මැවුම්කරු එක ම දෙවි කෙනෙක්" යැයි අප පැවසීම ප්‍රමාණවත්ය. ඔවුන් එක හඬින් "ඔව්, ඔව්, මැවුම්කරු එක් කෙනෙකි" යැයි පිළිතුරු දෙනු ඇත. නමුත් ඔවුන් වෙනස් විය හැකි අතර එක් කරුණක් මත එකිනෙකා මරා ගන්නට හැකිය. එනම්, මැවුම්කරු මූර්තිමත් කර ඇති රූපයයි. ඔවුන්ගෙන් සමහරු පවසන්නේ, 'මැවුම්කරු එක් කෙනෙක්, නමුත් ඔහු පුද්ගලයන් තිදෙනෙකු තුළ සිටින බව හෝ පුතෙකු සිටින' බවයි. ඔවුන්ගෙන් තවත් සමහරු පවසන්නේ: මැවුම්කරු සතෙකුගේ හෝ පිළිමයක

ස්වරූපයෙන් පැමිණෙන බවයි. මැවුම්කරු ඊට වඩා බොහෝ ඉහළින් සිටියි.

උදාහරණයක් ලෙස: ඉන්දියාවේ බ්‍රිතාන්‍යය රජයට ඉදිරිපත් කළ වාර්තාවේ මෙසේ සඳහන් විය.

"පර්යේෂණ කමිටුව විසින් පළ කළ සාමන්‍යය නිගමනය වන්නේ, ඉන්දියානුවන්ගෙන් බහුතරයක් එක් උත්තරීතර කෙනෙකු කෙරෙහි දැඩි ලෙස මුල් බැසගත් නිගමනය විශ්වාස කරන බවයි."[3]

පැස්කල්ගේ ඔට්ටුව සහ මැවුම්කරුවෙකුගේ පැවැත්ම පිළිබඳ නිශ්චිතභාවය.

සමහර අදේවවාදීන් විසින් මතු කරන කරුණු අතර, ඔවුන් දෙවිඳා වහන්සේව විශ්වාස කිරීමට සහ එම ආගම සඳහා පිළිවෙතක් සහ ශුද්ධ වූ ග්‍රන්ථයක් අනුගමනය කළ යුතු නම්, ඔවුන් විශ්වාස කළ යුත්තේ කුමන දෙවිඳා ද? කුමන ආගම ද? සහ කුමන පොත ද? යන්නයි.

"නුඹලාගේ දෙවිඳා එක ම දෙවිඳාය. එහෙයින් පරමාන්ත දිනය පිළිබඳ ව විශ්වාස නොකරන්නන් වන ඔවුන්ගේ හදවත් (එය විශ්වාස කිරීමට) පිළිකුල් කරයි. තවද, ඔවුහු අහංකාරකම් පාන්නෝ වෙති." (16:22)

"ඔවුන් සඟවන දෑ ද ඔවුන් හෙළි කරන දෑ ද නියත වශයෙන් ම අල්ලාහ් දන්නා බවට කිසිදු සැකයක් නැත. නියත වශයෙන් ම ඔහු අහංකාරකම් පාන්නන් ප්‍රිය නො කරයි." (16:23) (අන්-නහ්ල් 16:22,23)

---

[3] ශිෂ්ටාචාරයේ කතන්දරයේ විශ්වකෝෂය, විල් ඩුරන්ට්, වෙළුම 3 පිටු අංක 209.

මැවුම්කරු කෙරෙහි විශ්වාසය, සම්භාවිතාව මත පදනම් නො වී සම්පූර්ණ නිසැක විය යුතුය. ඔහුගේ ආධිපත්‍යයේ හවුල්කරුවෙකු නොමැති, දරුවන් නොමැති, විශ්වයේ සහ එහි අඩංගු දෑහි එක ම මැවුම්කරු ඔහුය. එය පිළිමය, මනුෂ්‍ය හෝ සතෙකුගේ ස්වරූපයෙන් මූර්තිමත් නො වේ. ඔවුන් කැමති වුවත් නැතත්, හිතාමතා හෝ නොදැනුවත්වම, විපත්තිවල දී සියලු මිනිසුන් යොමු වන එක ම මැවුම්කරු ඔහු ය.

"නුඹලාගේ දෙවියා එක ම දෙවියාය. අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත ඔහු හැර වෙනත් දෙවියෙකු නැත." (අල් බකරා 2:163)

පැස්කල්ගේ සුප්‍රසිද්ධ ඔට්ටු න්‍යායේ ප්‍රවර්ධකයින් එහි අනුගාමිකයින්ට සෑම තත්ත්වයක දීම දෙවිඳා වහන්සේව විශ්වාස කරන ලෙස අවවාද කරයි.

පැස්කල්ගේ ඔට්ටු ඇල්ලීමේ න්‍යාය මෙසේ සඳහන් කරයි.

'ඔබ දෙවිඳා විශ්වාස කරන්නේ නම් සහ දෙවිඳා සිටී නම්, ඔබේ විපාකය ස්වර්ගයේ සදාකාලික වනු ඇත, මෙය අසීමිත ලාභයකි.'

'ඔබ දෙවිඳා විශ්වාස නො කරන්නේ නම්, සහ දෙවිඳා සිටී නම්, ඔබේ විපාකය නිරයේ සදාකාලික වනු ඇත, මෙය අසීමිත පාඩුවකි.'

'ඔබ දෙවිඳා විශ්වාස කරන්නේ නම්, හා දෙවියන්ට පැවැත්මක් නැති නම්, ඔබට ඒ සඳහා විපාක නො ලැබෙන අතර මෙය සීමිත අලාභයකි.'

'ඔබ දෙවිඳා විශ්වාස නො කරන්නේ නම්, දෙවිඳා නො පවතී නම්, ඔබට දඬුවම් නො ලැබෙනු ඇත, නමුත් ඔබ ඔබේ ජීවිතය ගත කරනු ඇත, එය සීමිත ලාභයකි.'

අදේවවාදියා පවසන්නේ, “මට මෙම න්‍යාය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය නම්, මා නමස්කාර කළ යුත්තේ කුමන දෙවියාට ද? කිතුනුවන්ගේ දෙවිඳා ක්‍රිස්තුට ද, හින්දුවරුන්ගේ දෙවිඳා ක්‍රිෂ්ණාට ද, බෞද්ධයන් වඳින බුදුන්ට ද, නැතිනම් මුස්ලිම්වරුන්ගේ දෙවියන්ට ද?”

අපි ඔහුට මෙසේ පවසමු. 'සෑම කෙනෙකු ම විපත්තිවල දී යොමු වන බුදුන්, ක්‍රිෂ්ණ, ක්‍රිස්තුස් ඇතුළු සියලු මනුෂ්‍ය වර්ගයාගේ මැවුම්කරු වන, ඔබව නිර්මාණය කර ඔබව මරණයට පත් කරන්නා ඔබ විශ්වාස කර, ඔහුට නැමදුම් කළ යුතුය. එහි අඩු පාඩු තිබේනම් ඔහු එය දෙන්නේ නැත. ඉල්ලීම් කිරීමේ දී, රජු කෙනෙක් සාමාන්‍ය ජනතාවට සමාන කිරීම සාධාරණ ද?

"අහෝ ජනයිනි! මාගේ දහම පිළිබඳ සැකයෙහි නුඹලා පසුවන්නෙහු නම්, එවිට (දැන ගනු) අල්ලාහ් හැර දමා නුඹලා නැමදුම් කරන අයට මම නැමදුම් නො කරමි. නමුත් නුඹලා ව මරණයට පත් කරන අල්ලාහ්ට නැමදුම් කරමි. දේවත්වය විශ්වාස කරන්නන් අතරින් වන්නට මා අණ කරනු ලැබුවෙමි යැයි (නබිවරය!) නුඹ පවසනු." (යූනුස් 10:104)

අදේවවාදියා ඔහු කැමති වුවත් නැතත් දේව විශ්වාසියෙකි. එහෙත් ඔහු ප්‍රතික්ෂේපය ප්‍රදර්ශන කරන අතර අසාධාරණ හා උඩඟු ලෙසින් දේව විශ්වාසය සඟවා ගනියි.

"තවද, ඔවුන්ගේ ආත්මයන්, එය පිළිගන්නා තත්ත්වයේ තිබියදීත්, අසාධාරණ ලෙසින් හා පුහුමානයෙන් යුතු ව ඔවුහු එය ප්‍රතික්ෂේප කළෝය. එහෙයින් කලහකාරීන්ගේ අවසානය කෙසේ වී දැයි නුඹ අවධානයෙන් බලනු." (අන්-නම්ල් 22:14)

උදාහරණයක් ලෙස: ගුවන් යානයක මගීන්ට එහි වැළැක්විය නො හැකි අනතුර වැටහෙන විට, ඔවුන් ඔවුන්ගේ විවිධ ආගම් සහ නිකායන් ගැන නො සලකා, අදේවවාදීන් පවා අහසේ ශක්තිය හිමියා වෙත හැරෙනු දකින්නට ලැබේ. මේ මොහොතේ, ඔවුන් ඉස්ලාම් ආගම මත එක්සත් වී ඇත. නමුත් ඔවුන්ගේ ආරක්ෂාව ගැන ඔවුන් ස්ථිර වූ විට, ඔවුනොවුන්ගේ මැදිහත්කරුවන් වෙතට ඔවුන් නැවත විසුරුවා හැරී යති.

"ඔවුහු නැවට ගොඩ වී ගමන් ගත්තේ නම්, (විපතෙන් මිදීමට) දහම ඔහු වෙත පමණක් පුද කරමින් අවංකයින් ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරති. පසු ව ඔවුන් මුදවා ගෙන ගොඩබිම වෙත පැමිණි කල්හි ,එවිට ඔවුහු (ඔහුට) ආදේශ කරන්නෝ වෙති." (අල්-අන්කබූත් 29:65)

විශ්වයේ මැවුම්කරුවෙකු විශ්වාස නො කරන ප්‍රකාශ කිරීම මුරණ්ඩුකම සහ උඩඟුකම මිස අන් කිසිවක් නො වන බව අල් කුර්ආනය තහවුරු කරයි.

"නියත වශයෙන් ම තමන් වෙත පැමිණි කිසිදු අධිකාරී බලයක් නො තිබිය දී අල්ලාහ්ගේ වදන් සම්බන්ධයෙන් තර්ක කරන්නන් වන ඔවුන්ගේ සිත් තුළ උඩඟුකම මිස වෙනෙකක් නැත. ඔවුහු එය ලබන්නන් නො වෙති. එහෙයින් නුඹ අල්ලාහ්ගෙන් ආරක්ෂාව අයැද සිටිනු. නියත වශයෙන් ම ඔහු සර්ව ශ්‍රාවකය; සර්ව ඥානීය." (ගාෆිර් 40:56)

සෑම කෙනෙකු ම විපත්තියේ දී ඍජුව ම මැවුම්කරු දෙසට හැරුණාක් මෙන් හොඳ සහ නරක කාලවලදී ද කෙලින්ම ඔහු වෙත යාමට ඔවුන්ට සිදු වේ. නමස්කාර කිරීමටත් ඔහුගේ දූතයන් අතරින් මුද්‍රාව

වන මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විශ්වාස කිරීමටත් ඔහුගේ ශුද්ධ වූ ග්‍රන්ථය වන උතුම් අල් කුර්ආනය විශ්වාස කිරීමටත් ඉස්ලාම් ආගම ඇරයුම් කරමින් සිටින දෙවිඳා වන අල්ලාහ් මොහුය.

“අපි අල්ලාහ් ව විශ්වාස කරමු. තව ද අප වෙත පහළ කරනු ලැබූ දෑ ද ඉබ්රාහීම්, ඉස්මාඊල්, ඉස්හාක්, යඃකූබ් හා ඔවුන්ගේ පරපුර වෙත පහළ කරනු ලැබූ දෑ ද මූසා හා ඊසා වෙත පිරිනමනු ලැබූ දෑ ද තම පරමාධිපතිගෙන් නබිවරුන් ට පිරිනමනු ලැබූ දෑ ද විශ්වාස කරමු. ඔවුන් අතුරින් කිසිවෙකු ව අපි වෙන් නො කළෙමු. තවද අපි ඔහු ට අවනත වූවෝ වෙමු.” යැයි නුඹලා පවසනු." (අල් බකරා 2:136)

එසේ ම, මැවුම්කරු විසින් විවිධ ජාතීන් වෙත යවන ලද බොහෝ වක්තෘවරුන් සහ පණිවිඩකරුවන් වෙති. ශුද්ධ වූ අල් කුර්ආනයේ (ක්‍රිස්තුස්, මෝසෙස්, ආබ්රහම්, නෝවා, ඩේවිඩ්, සොලමන්, ඉස්මායිල්, ඉස්හාක් සහ ජෝසප් යනාදී ලෙසින්) ඔවුන් සමහරුන්ගේ නම් සඳහන් කරනු ලැබ ඇත. සඳහන් නො කළ තවත් අය ද වෙති. ධනාත්මක ආගම්වල සමහර පූජනීය ආගමික සංකේතවල මූලාරම්භය අල්ලාහ් හැර දමා කාලයාගේ ඇවෑමෙන් තම ජනතාව විසින් වන්දනාමාන කළ ශුද්ධ වූ අනාගත වක්තෘවරුන් බව බැහැර නො කෙරේ. අල්ලාහ්ගේ නබිවරයකු වූ නූහ්ගේ ජනතාව ඔවුන් අතර සිටි ධර්මිෂ්ඨයන් විශුද්ධ කර නමස්කාර කළ විට සිදු කර සිටියාක් මෙනි.

"ඇතැම් රසූල්වරුන්, ඔවුන් ගැන මීට පෙර අපි නුඹට පවසා ඇත. තවද, ඇතැම් රසූල්වරුන්, ඔවුන් ගැන අපි නුඹට පවසා නැත..." (අන්-නිසා 4:164)

Ali Izetbegovic මෙසේ පවසයි:

ඇරිස්ටෝටල් විසින් ස්වාභාව ධර්මය, අහස් හා පොළව සම්බන්ධයෙන් විද්‍යාත්මක ග්‍රන්ථ තුනක් ලියා ඇත. මෙම පොත් තුනෙහි අද විද්‍යාත්මකව නිවැරදි ප්‍රකාශයක් දක්නට නැත. විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් බලන විට පොත් තුන දහයෙන් බිංදුවට සමාන වී ඇත. අල් කුර්ආනය පිළිබඳ සලකා බලන විට, මොරිස් බුකේල් “කුර්ආනය, බයිබලය සහ තෝරාව, නවීන විද්‍යාවේ දෘෂ්ටිකෝණයෙන්” යන ඔහුගේ සුප්‍රසිද්ධ ග්‍රන්ථයේ පවසන පරිදි: “සත්‍යය නම්, ශුද්ධ වූ අල් කුර්ආනයේ විද්‍යාත්මක කරුණකට පටහැනි එක වාක්‍යයක් මා හට හමු නො වීය. එසේ නො ව, බොහෝ පැතිකඩවල දී නවීන විද්‍යාවට වඩා අල් කුර්ආනය පෙරමුණ ගෙන ඇත. එම කාලයේ පැවති බොහෝ විද්‍යාත්මක න්‍යායන් එය නිවැරදි කළේය, උදාහරණයක් ලෙස, භූගත ජලය සෑදී ඇත්තේ මහාද්වීප පතුලේ ඇති ගැඹුරු අගාධයකින් සාගරවල සිට පෘථිවියේ ගැඹුරට භූගත ජලය ප්‍රවාහනය කිරීමෙනි යන මතවාදය ගත හැකිය. එම යුගයේ පැවති මෙම විද්‍යාත්මක මිථ්‍යාව අල් කුර්ආනය සනාථ කළේ ද? එසේ නො ව, ඔහු මෙසේ කීවේය.

"නියත වශයෙන් ම අල්ලාහ් අහසින් ජලය පහළ කොට එය මහපොළොවේ උල්පත් ලෙස ගලා යන්නට සලස්වා, එමඟින් (විවිධ වර්ණවලින් යුත්) විවිධ වර්ගයේ බෝග හට ගන්වා පැහෙන්නට සලස්වයි..." (අස්-සුමර් 39:21)

භූගත ජලයේ මූලාශ්‍රය වර්ෂාවෙන් හටගත් උල්පත් මිස ඒ කාලයේ පැවති ඇරිස්ටෝටල්ගේ ගැඹුරු මහාද්වීප පරතරය (මතය) නො වේ.

# කල්පනා කොට බැලීම.

සෑම දෙයකට ම ප්‍රභවයක් (source) ඇති බවත්, මෙම ප්‍රභවයට මූලාශ්‍රයක් ඇති බවත්, මෙම අනුපිළිවෙල සැමවිටම පවතින්නේ නම්, අපි මූලාරම්භයට හෝ අවසානයට ළඟා වීම තර්කානුකූලයි. මූලාශ්‍රයක් නොමැති මූලාශ්‍රයකට අප පැමිණිය යුතු අතර, මෙය අපි "මූලික හේතුව" ලෙස හඳුන්වමු, එය ප්‍රධාන සිදුවීමට වඩා වෙනස් ය, උදාහරණයක් ලෙස, මහා පිපිරුම (Big bang) ප්‍රධාන සිදුවීම යැයි අප පිළිගන්නේ නම්, මෙම සිදුවීමට හේතු වූ ප්‍රධාන හේතුව නිර්මාතෘවරයායාය.

ඔහු මැවුම්කරුවෙකු වුවද, විශ්වයේ මැවුම්කරුට මැවුම්කරුවෙකු අවශ්‍ය බව පැවසීම, 'ලුණු රස තිබුණද, එසේ ලුණ රස තිබීමට ලුණු අවශ්‍ය' බව පැවසීම වැනිය. "දෙවිඳා වහන්සේ මැව්වේ කවු ද?" යන ප්‍රශ්නය "එයට පෙර කිසිවක් නො වූ දෙයට පෙර වූයේ කුමක් ද? යන ප්‍රශ්නයට සමාන වේ. "ආරම්භයක් නැති දෙයක ආරම්භය කුමක් ද?" යන ප්‍රශ්නය "කහ සුවඳ යනු කුමක් ද?" යන ප්‍රශ්නයට සමාන වේ. කහ වර්ණය සුවඳ දැනෙන දේවල්හි ලැයිස්තුවට නො වැටෙන ආකාරයට ම මැවුම්කරු මැවීම් ලැයිස්තුවට වැටෙන්නේ නැත. අල්ලාහ් සතුව පරමාදර්ශයන් ඇත.

විශ්වයට මැවුම්කරුවෙකු සිටින අතර ඔහු එක් අයෙකි, "මැවුම්කරු මැව්වේ කවු ද?" යන ප්‍රශ්නය අදාල නැත. උදාහරණයක් ලෙස, අපි සොල්දාදුවාගේ සහ උණ්ඩයේ උදාහරණය ගනිමු. සොල්දාදුවාට වෙඩි තැබීමට අවශ්‍යයි, නමුත් වෙඩි තැබීම සඳහා, සොල්දාදුවා තම පිටුපස සිටින සොල්දාදුවාගෙන් අවසර ඉල්ලා සිටිය යුතු අතර, එම සොල්දාදුවා ද තමා පිටුපස සිටින සොල්දාදුවාගෙන් අවසර ඉල්ලා

සිටිය යුතුය. මෙසේ නිමක් නැතිව එය පවතිනු ඇත. ප්‍රශ්නය නම්: සොල්දාදුවා වෙඩි තබයිද? නැත; මක්නිසාද යත් වෙඩි තැබීමට අවසර දෙන සොල්දාදුවා වෙත එය සේන්දු නො වන බැවිනි. නමුත් එම නියෝගය එක් පුද්ගලයකින් අවසන් වී වෙඩි තැබීමට අවසර දීම සඳහා ඔහුට ඉහළින් වෙනත් කිසිවෙකු නොමැති නම්, වෙඩි උණ්ඩය පත්තුවනු ඇත. මෙම එක් පුද්ගලයා නො ව, බොහෝ අය එහි සිටිති. එහෙයින් උන්ඩය පත්තු නො වේ. එසේ නො ව, නිමක් නැති සීමාවට ළඟා වුවහොත් ඔවුන් බිංදුව හා සමාන වේ. 1 හෝ ඊට වැඩි අංකයක් ඔවුන් ඉදිරියේ තැබුවහොත් මිස ඒවා කිසිවක් වටින්නේ නැත.

නිදසුනක් ලෙස, ආයතනයක් රූපවාහිනිය හෝ ශීතකරණය වැනි භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. භාණ්ඩ භාවිතය සඳහා නීති සහ රෙගුලාසි සකසයි. එමෙන් ම භාණ්ඩය භාවිත කරන ආකාරය විස්තර කරන අත්පොතක මෙම උපදෙස් ලියා ඒ සමඟ තබයි. නිෂ්පාදකයා මෙම නීතිවලට යටත් නො වන අතර, අවශ්‍ය පරිදි භාණ්ඩයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට අවශ්‍යය නම් පාරිභෝගිකයා මෙම උපදෙස් පිළිපැදිය යුතු අතර ඒවා අනුගමනය කළ යුතුය. පරමාදර්ශය දෙවිඳා සතුය. ඔහු හේතුඵල නියාමය නිර්මාණය කළ තැනැත්තා වන අතර ඔහුව, ඔහුම නිර්මාණය කළ නීතියට යටත්ව සැලකිය නො හැකිය. ඔහුට මනා බලයක් තිබුණ ද, ඔහු සිතන දේ පමණක් සිදු කරන්නාය.

පුද්ගලයෙකු තම කාමරයට ඇතුළු වී, ජනේල වීදුරුව කැඩී ඇති බව දුටුවහොත්, ඔහු ජනෙල් වීදුරුව කැඩුවේ කවුදැයි ඔහුගේ පවුලේ අයගෙන් විමසනු ඇත. එවිට ඔවුන් ඔහුට එය අහම්බෙන් කැඩී ගොස් ඇතැයි පිළිතුරු දෙනු ඇත. මෙහිදී පිළිතුර වැරදිය. හේතුව ඔහු විමසන්නේ, ජනේලය කැඩුනේ කොහොමදැ?යි නො ව ජනේලය කැඩුවේ කවු ද? යන්න. අහඹු සිදුවීම යනු ක්‍රියාව පිළිබඳ විස්තරයක්

මිස සිදු කළ පුද්ගලයා නො වේ. විශ්වය නිර්මාණය කළේ කවුරුන් ද? යන ප්‍රශ්නයට අහඹු යන වචනයෙන් පිළිතුරු දීම නිවැරදිය. යමෙකු ඔහුගේ කාමරයට ඇතුළු වී ජනෙල් වීදුරුව කැඩී ඇති බව දැක ඔහු එය කැඩුවේ කවුදැයි ඔහුගේ පවුලේ අයගෙන් ඇසුවහොත්, ඔවුන් අසවල් පුද්ගලයකු, අහම්බෙන් කඩා දැමුවේ යැයි පිළිතුරු දුන්නේ නම්, මෙම පිළිතුර පිළිගත හැකි සහ සාධාරණ ය. මන්ද වීදුරු කැඩීම අහඹු සිදුවීමක් මෙන් ම වැරදීමකින් සිදුවිය හැකි බැවිනි. නමුත් එම පුද්ගලයාම පසුදින ඔහුගේ කාමරයට ඇතුළු වී ජනේල වීදුරුව අලුත්වැඩියා කර ඇති බව දැක ඒ ගැන ඔහුගේ පවුලේ අයගෙන් විමසා සිටි විට අහඹු පුද්ගලයෙක් එය අලුත් වැඩියා කළේ යැයි ඔවුන් පිළිතුරු දුන්නේ නම්, එම පිළිතුර පිළිගත නො හැකි ය. එය සාධාරනව විය නො හැකි ය. මන්ද වීදුරු අලුත්වැඩියා කිරීමේ ක්‍රියාව අහඹු ක්‍රියාවක් නො වන බැවිනි. එබැවින් අපි මෙසේ පවසා සිටිමු: විශ්වය සහ ජීවීන් හිතාමතාම නිර්මාණය කරන ලද ඒවා වේ. ඒ වෙනුවට අහම්බෙන් නිර්මාණය වී තිබීම යැයි පැවසීම තර්කානුකූලව විය නොහැක්කකි. මේ ආකාරයෙන්, විශ්වය නිර්මාණය කිරීමේ ගැටලුවෙන් අහඹු සිදුවීම සම්පූර්ණයෙන් ම බැහැර කර ඇත.

එය Dr. රොබට් වයිට්, 1960 සිට මොළය හෝ හිස බද්ධ කිරීමේ ක්ෂේත්‍රයේ දායකත්වය පිරිනැමූ ප්‍රධානතම වෛද්‍යවරයෙකි. ඔහු සුවිශේෂී අත්හදා බැලීම් හා විශේෂ යන්ත්‍රය භාවිතයෙන් වඳුරෙකුගේ මොළය ශරීරයෙන් පිටත පණපිටින් තබා ගැනීමට සමත් විය. කෘතිම හදවතකට සමාන ආකාරයකින් මෙම මොළයට රුධිරය ලබා දීමට කටයුතු කළ අතර, එමඟින් මොළය යහපත් තත්ත්වයේ තබා, වෙනත් කෙනෙකුගේ ශරීරයට මාරු කිරීමට හැකි විය. වඳුරා මිය ගියත් මොළයට හානියක් නොවුණි. මොළයට හානි වීමෙන් ජීවිතය අවසන් වන බව පවසන අදේවවාදියාට මෙම අත්දැකීම සුදුසු පිළිතුරු දක්වයි.

මෙම නිරෝගී මොළය, මිය ගිය එම වඳුරාගේ ශරීරයට ආපසු බද්ධ කර, ඌ ජීවත් කරවන්නට මහපොළොවේ වෙසෙන විද්‍යාඥයින්ට හැකි ද? ඇත්ත වශයෙන් ම එය සිදු විය නොහැක්කකි.

විද්‍යාත්මක ආදානය (input) පිළිබඳ පරිගණකයේ සංජානනය මිනිසුන්ගේ පෙර ක්‍රමලේඛනයේ ප්‍රතිඵලයක් බව දන්නා කරුණකි. එබැවින් පුද්ගලයෙකුට පෙර ක්‍රමලේඛනයකින් තොරව තමා අවට ඇති දේ අවබෝධ කර ගත හැකි ද? පංචේන්ද්‍රයන් මඟින් අපට සම්ප්‍රේෂණය කරන්නේ ඉන්ද්‍රීයයන්ගෙන් ස්නායු හරහා මනසට ගමන් කරන විද්‍යුත් සංඥා මිස අන් කිසිවක් නො වේ. එබැවින් ඒවා මනසින් හඳුනා ගනී. මේ විශ්වයෙන් අපට දැනෙන සෑම දෙයක් ම මොළය තුළ ඇති විද්‍යුත් සංඥා මිස අන් කිසිවක් නො වේ. මෙය විශාලය; මෙය කුඩාය, මෙය කහ ය; මෙය කොළ ය, මෙය මිහිරි හඬකි; මෙය අමිහිරි හඬකි යනුවෙන් ඉන්ද්‍රීයයන්ට දැනෙන සහ ඒවා අතර වෙනස ඉතා නිවැරදිව හඳුනා ගැනීමට මොළයට සැලැස්වූයේ කුමක් ද? උපතින් පසුව පමණක් නො ව ඉපදීමට පෙරද සංවේදී දෑ සියල්ල වෙනස් කම් තුළින් අවබෝධ කර ගැනීමට අප තුළ ක්‍රියාත්මක වන යන්ත්‍රය කුමක් ද? ආත්මයේ හුස්මෙන් පසු මවගේ කුසේ සිටින කලලයට තමාව දැනෙන අතර සිනාසෙමින් මුඛය තුළට ඇඟිල්ලක් තබා තම අවයව චලනය කරයි. එය අන් අයට දැනෙන පරිදිය. ශබ්ද ඇසීමට, ප්‍රතිචාර දැක්වීමට සහ මවගේ සතුට සහ දුක අතර වෙනස හඳුනා ගැනීමට හැකියාව එය ලබනු ඇත. ඒ සියල්ල සිදු කරනුයේ ඔහුගේ දැනුම සහ ක්‍රමලේඛනය තුළිනි.

ස්වභාවධර්මය විශ්වයේ නිර්මාතෘ විය නො හැකිය, ස්වභාවධර්මය කාලය, ස්ථානය සහ ශක්තියෙන් සමන්විත වෙයි. මෙම සාධක නිර්මාණය කළ අය නොමැති අතර මෙම අතිශය සංකීර්ණත්වය සහ

එහි සංරචක සහ විවිධ ස්වභාවයන් සහ වර්ණ අතර ඇති විශාල වෙනස්කම්, එසේ වූයේ කෙසේ ද? ඉන්ද්‍රීයයන්ගෙන් මොළයට සම්ප්‍රේෂණය වන විද්‍යුත් සංඥාවලට වඩා වැඩි යමක් නො වුණත්, විශ්වයේ තොරතුරු ඔහුට දේවල් අතර වෙනස හඳුනා ගන්නා සංජානන යන්ත්‍රයක් ලබා දී ඇති මේ සියලු භයානක ප්‍රමාණය කෙරෙහි මිනිස් මනස අවධානය යොමු කළ යුතු බව සොබාදහම තේරුම් ගනී. ලෝකයේ සංකීර්ණත්වය සහ සංජානනයේ සංකීර්ණත්වය අතර සම්බන්ධය ක්‍රමලේඛනය කළ යුත්තේ අහම්බෙන් නො ව නිරවද්‍ය ගණනය කිරීම් වලින් ය. එය අහම්බයක් නම්, ස්වභාවධර්මය ඔහුට එහි ඇති සියල්ල වටහා ගැනීමට හැකි වනු ඇත, ඉන් කිසිවක් ඔහුගෙන් සැඟවී යන්නේ නැත. එසේ නැතහොත් ස්වභාවධර්මය ඔහුට කිසිවක් වටහා ගැනීමෙන් වළක්වනු ඇත. නමුත් සංජානන යන්ත්‍රය ක්‍රමලේඛනය කර ඇති නිසා, එය නිශ්චිත රාමුවක් තුළ ක්‍රියා කරයි. ඒ නිසා සෑම ජීවියෙකුට ම තමන්ගේම ක්‍රමලේඛනයක් ඇත. එමඟින් යම් යම් දේවල් දැන ගැනීමට හැකි වන අතර අනෙකුත් දෑ ඔහුගෙන් සැඟවී යනු ඇත.

මිනිසුන්ගේ පියා වන ආදම්ට ගෞරව කිරීම යනු ඔහුව මැටියෙන් ස්වාධීනව මවා ඇති බව පමණක් නො ව, ඔහුව සර්ව ලෝකයන්හි ස්වාමියාගේ දෑතින් කෙලින් ම මවනු ලැබ තිබීම හා අල්ලාහ්ට කීකරු වෙමින්, ආදම්ට සුජූද් කරන මෙන් දේවදූතයන්ගෙන් අල්ලාහ් කළ නියෝගයයි.

අල්ලාහ් ආදම්ගෙන් පැවතෙන්නන් නින්දා සහගත ජලයෙන් ආරම්භයක් බවට පත් කළේ මැවීමේ මූලාශ්‍රයේ එකමුතුකම සහ මැවුම්කරුගේ ඒකීයත්වය සංකේතවත් කිරීමටය. එමෙන් ම මිනිසාට ගෞරවයක් වශයෙන් සහ ඔහුව මිහි මත කලීෆාවරයෙකු ලෙස

පත්කිරීමේ ලෝකයේ ස්වාමියාගේ ප්‍රඥාව අවබෝධ කර ගැනීම සඳහා ඔහුගේ ස්වාධීන මැවීම මඟින් ඔහු ආදම්ව අනෙකුත් සියලු ම, ජීවීන්ගෙන් වෙන් කළේය. තවද, පියෙකු හෝ මවක් නොමැතිව ආදම්ගේ මැවීම අල්ලාහ්ගේ සර්වබලධාරිත්වය පෙන්නුම් කරයි. එමෙන් ම පියකුගෙන් තොරව ජේසු තුමාගේ බිහිවීමට තවත් උදාහරණයක් එමඟින් ලබා දුන්නේය. එය මිනිසුනට සංඥාවක් හා සර්වබලධාරිත්වය මත පදනම් වූ ප්‍රාතිහාරයයක් වනු පිණිසය. පරිණාමවාදයේ දී අදේවවාදීන් ප්‍රතික්ෂේප කිරීමට කරන උත්සාහය, ඔවුන්ට ම එරෙහි සාක්ෂියකි.

“නියත වශයෙන් ම අල්ලාහ් ඉදිරියේ ඊසාගේ උපමාව ආදම්ගේ උපමාව මෙනි. ඔහු ව පසින් මවා, පසු ව ඔහුට ‘වනු‘ යැයි ඔහු පැවසුවේය. එවිට ඔහු ඇති විය.” (ආලු ඉම්රාන් 3:59)

මිනිසෙක් තමා ඉතා ධනවත් හා ත්‍යාගශීලී බව දුටු විට, ඔහු මිතුරන්ට සහ ආදරණීයයන්ට කෑමට බීමට ආරාධනා කරයි. අපගේ මෙම ගුණාංග අල්ලාහ් අබියස ඇති දෙයින් කුඩා කොටසක් පමණි. මැවුම්කරු අල්ලාහ්ට, තේජස හා අලංකාරයේ ගුණාංග ඇත. ඔහු දයාවන්තය, මහාකාරුණිකය, ත්‍යාගශීලීය, දානපතිය. ඔහුට නැමදුම් කිරීම සඳහා ඔහු අප නිර්මාණය කර ඇත. අපි ඔහුට අවංක ව නැමදුම් කර ඔහුට අවනත වී, ඔහුගේ නියෝග පිළිපදින්නේ නම් ඔහු අපට කරුණා ව දක්වනු ඇත. අපව සතුටට පත් කරනු ඇත. අපට පිරිනමනු ඇත. සියලු සුන්දර මානව ගුණාංග ඔහුගේ ගුණාංගවලින් බිඳී ආ දෑ වේ. ඔහු අපව නිර්මාණය කර, තෝරා ගැනීමේ හැකියාව අපට ලබා දී ඇත. එක්කෝ අපි කීකරුකමේ සහ නැමදුමේ මාර්ගය තෝරා ගනිමු, නැතහොත් අපි ඔහුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කර ප්‍රචණ්ඩත්වයේ සහ පිටුපෑමේ මාවත තෝරා ගනිමු.

ජින් සහ මනුෂ්‍ය වර්ගයාට තෝරා ගැනීමේ නිදහස පිරිනමා තිබීමෙන් අනෙකුත් සියලු ම ජීවීන්ගෙන් අල්ලාහ් ඔවුන් වෙන් කර ඇත. මිනිසාගේ වෙනස නම් සාන්තවරයෙකු හෝ පූජකයෙකු හෝ මඟින් නො ව, සර්ව ලෝකයේ ස්වාමියා වෙත ඔහු සෘජුව මග පෙන්වීමයි. මිනිසාගේ නිර්මල කැමැත්තෙන් අල්ලාහ්ට තම වහල්භාවය පුද කිරීමෙන් සහ අල්ලාහ්ට සහකරුවෙකු හෝ දරුවෙකු හෝ නොමැති බවත් පුද්ගලයෙකු, සතෙකු, පිළිමයක් හෝ ගල් ස්වරූපයෙන් මූර්තිමත් නො වන බවත් සම්පූර්ණයෙන් විශ්වාස කිරීමයි. මේ අනුව, ඔහු මැවුම්කරුගේ ප්‍රඥාව සාක්ෂාත් කර ගෙන ඇත්තේ මිනිසා මැවිල්ලේ ප්‍රධානත්වයට පත් කරමිනි.

තෝරා ගැනීමේ අධිෂ්ඨානය සහ හැකියාව නිසි ලෙස හා නිවැරදි ලෙස භාවිත කර මෙහෙයවන්නේ නම් එය ම ආශිර්වාදයක් වන අතර එය දූෂිත චේතනා සහ දූෂිත අරමුණු සඳහා යොදවන්නේ නම් එය ශාපයකි.

මැවුම්කරුට කීකරු වීමට හා නමස්කාර කිරීමට අපව බල කිරීමට හැකිව තිබුණු නමුත්, බල කිරීම මිනිස් මැවීමේ අපේක්ෂිත ඉලක්කය සපුරා නො ගනී.

තහනම් ගහෙන් අනුභව කළ හේතුවෙන් ආදම්ගේ පසුතැවිල්ල පිළිගත් අවස්ථාවේ, අල්ලාහ් මනුෂ්‍යත්වයට ඉගැන්වූ පාඩම ලෝක ස්වාමියාගේ පළමු සමාව මනුෂ්‍යත්වයට පිරිනැමීම ය. පාපයක් උරුම වී තේරුමක් නැති දැයකි. කිසිවෙක් වෙනත් කෙනෙකුගේ පාපයේ බර උසුලන්නේ නැත. සෑම කෙනෙකු ම තමන්ගේ පව් බර තනිව ම ඉසිලිය යුතු වේ. මෙය සර්ව ලෝක පරමාධිපතියාණන්ගෙන් වූ දයාවකි. සැබැවින් ම පුද්ගලයෙකු පාපයකින් තොරව නිර්මලව උපත

ලබයි. වැඩිවියට පැමිණීමේ වයසේ සිට ඔහුගේ ක්‍රියාවන් සඳහා ඔහු වගකිව යුතු වේ.

කිසිවෙක් තමා නො කළ පාපයකට වගකියනු නො ලැබේ. ඔහුගේ විශ්වාසයෙන් හා යහපත් ක්‍රියාවෙන් මිස ඔහුට සාර්ථකත්වය නො ලැබේ. අල්ලාහ් මිනිසාට ජීවිතය ලබා දී ඔහුට පරීක්ෂා කිරීම සඳහා සහ විභාග කිරීම සඳහා (තෝරා ගැනීමේ නිදහස) ලබා දුන් අතර, ඔහු වගකිව යුත්තේ තමා ගැන පමණි. එමෙන් ම තමන්ගේ දැනුම සහ හැකියාවේ සීමාවන් තුළ පමණක් තෝරාගන්නට ඒ මිනිසාට නිදහස තිබේ. වගකීමේ පැවැත්ම සහ තේරීමේ හැකියාව මත ගණනය කිරීම රඳා පවතී. මැවුම්කරු, කෙනෙකුගේ ස්වරූපය හා සමාජ තත්වය සඳහා සෑම පුද්ගලයෙකු ම වගකීම නො පවරයි. ආරවුල් සහ අරගල මැද නිදහස ලැබූ කෙනෙක්, අරමුණකින් තොරව සතුටු ජීවිතයක් ලැබූ කෙනෙකුට වඩා උතුම් සහ ගෞරවයක් ලැබුවේය. අධිෂ්ඨානයෙන් තොරව ලැබෙන ගෞරවය සහ ත්‍යාගය අර්ථ විරහිත ය. සර්වබලධාරී දෙවිඳා, මිනිසුන්ට තෝරා ගැනීමේ නිදහස ලබා දී, ඔවුන්ව විනිශ්චය නො කර සිටීම යුක්ති සහගත නො වේ. වගකීමෙන් පසුව විනිශ්චය කරනු ලැබේ. අවසානව නැවත නැඟිටීමේ දිනය යනු අපගේ පැවැත්මේ ක්‍රමවේදය සම්පූර්ණ කිරීමයි.

අදේවවාදය මිනිසුන් තුළ විවිධ ආකාරයෙන් වර්ධනය විය. නමුත් එය දර්ශනය වූයේ පෙර පැවති දිව්‍ය නීතිවල හිමිකරුවන් දෙවිඳා පිළබඳ සැබෑ සංකල්පය විකෘති කිරීමෙන් පසුවය. මෙම විකෘති සංකල්පයේ සංකීර්ණත්වය වූයේ මැවුම්කරුව ඔහුගේ කීර්තියට නොගැලපෙන ගුණාංගවලින් විස්තර කිරීමය. ඔහු වෙහෙසට පත්විය, විවේක ගත්තේය, ඔහු නො දනී යනාදී ලෙස විස්තර කිරීමෙනි. මිනිස් හදවත් තුළ අල්ලාහ් නිර්මාණය කළ සරල සංකල්පයට මේවා පටහැනිය.

මිනිසුන් අදේවවාදයට ඇද දමන අනෙකුත් හේතු අතරින්, පූජක වරුන්ගේ සහ ආගමික ආයතනවල පිළිගත නො හැකි නීති සහ නියෝග මෙන් ම ලෞකික හා දේශපාලන වාසි ලබා ගැනීම ද වේ.

ජීවිතයේ මූලික අරමුණ ක්ෂණික සතුට භුක්ති විඳීම නො වේ. ඒ වෙනුවට, අල්ලාහ් පිළිබඳ දැනුම තුළින් නැමදුම් කිරීම සහ අභ්‍යයන්තර ශාන්තිය ලැබීමය. දිව්‍යමය අරමුණ සාක්ෂාත් කර ගැනීම සදාකාලික හා සැබෑ සතුටට හේතු වේ. එබැවින්, මෙය අපගේ මූලික ඉලක්කය වී නම්, ඕනෑ ම ගැටලුවකට හෝ කරදරයකට මුහුණ දීමෙන් මෙම අවසානය කරා ළඟා වීමට පහසු වනු ඇත.

මේ ලෝකය පරීක්ෂණයකි. පුද්ගලයෙකු මෙලොව හැර යන්නේ සාර්ථක හෝ අසාර්ථක වූ සාක්ෂියක් සමඟ පමණි. මිනිසා මෙලොවට ආදරය කිරීම වරදකි. ඔහු විභාගයට තමන් ප්‍රිය කරන්නේ යැයි පවසා, ඒ මත බැඳී විභාගයෙන් ලබා ගන්නා සහතිකයට අකැමති අයකු මෙනි.

ගුවන් යානා එන්ජිමේ යාන්ත්‍රණය අපට නො තේරෙන විට, ගුවන් යානා ඉන්ජිනේරුවරයා වෙත යොමු වීම, කල්පනා කිරීමේ නොහැකියාව නො වේ. නමුත් ගුවන් යානා නිෂ්පාදකයා එන්ජිනේරු යාන්ත්‍රණයේ කිසිදු පියවරක සම්බන්ධ නො වන නමුත්, අප දන්නා යාන්ත්‍රණවල පැවැත්මට වගකිව යුතුය. දෙවිඳා යනු නොදැනුවත්කමේ හිඩැස් පිරවීම සඳහා වූ දෙවියෙකු නො වේ. නමුත් විද්‍යාව විසින් සොයා ගන්නා සියලු ම යාන්ත්‍රණ පිටුපස ඇති ප්‍රධාන හේතුව ඔහුය.

විශ්වය හටගෙන ඇත්තේ ශූන්‍යතාවෙන් බව ද්‍රව්‍ය විද්‍යාව පවසයි. ඒ අතර ම සැබැවින් ම ශූන්‍යතාවේ, පදාර්ථය විනාශ කිරීමට හෝ එය නිර්මාණය කිරීමට හෝ නො හැකි බව විද්‍යාව ම අපට පවසයි. එය

විද්‍යාඥයින් ව්‍යාකූලත්වයට පත් කර ඇත. මන්ද ශූන්‍යතාවේ පදාර්ථය නිර්මානය නො වේ. එසේ නම් ශූන්‍යතාවෙන් විශ්වය ඇති වූයේ කෙසේ ද? දැන්, විද්‍යාවට පැහැදිලි කිරීමට නො හැකි යැයි ප්‍රකාශ කර ඇති දේ පැහැදිලි කිරීමට ආගමේ කාර්යභාරය බවට පත්වී ඇත. ආගම ඔවුන්ට දන්වා ඇත්තේ පදාර්ථය විනාශ වන බවත්, එය ශූන්‍යයකින් නිර්මාණය කළ විශිෂ්ට මැවුම්කරුවෙකු සිටින බවත්ය.

විශ්වයේ නියමයන් විශ්වයේ සත්‍යයක් වන අතර, ඒවා විශ්වයේ පැවැත්මට හේතු පැහැදිලි කිරීමක් නො වේ. නීතිවලින් සොයාගත් දේ මැවුම්කරුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමක් නො ව, අල්ලාහ්ගේ මැවීම් සඳහා වූ පැහැදිලි කිරීමකි. උදාහරණයක් ලෙස, සෑම මාසයක ම ඉතිරිකිරීමේ ආයතනයක මුදල් තැන්පත් කර, වසර අවසානයේ දී ඔහු ආයතනයේ ලාභයෙන් ඉතිරි කළ මුදල ලබා ගැනීමට පැමිණි විට, ගණකාධිකාරීවරයා ඔහුට මෙසේ කියයි: 'ඔබ වෙනුවෙන් මුදල් නිර්මාණය කළ මුදල ගණනය කිරීමේ දී අප භාවිත කළ ගුණ කිරීමේ නීතියේ ප්‍රතිඵල මෙයයි.' මෙහි තේරුමක් තිබේද? ඇත්ත වශයෙන් ම, පුද්ගලයා මුදල් තැන්පත් නො කළේ නම්, ඔහුගේ ශේෂය ශූන්‍යව පවතිනු ඇත. එබැවින්, ස්වභාවධර්මයේ නීති විශ්වය නිර්මාණය කළ බව ප්‍රකාශ කිරීම තර්කයට හා බුද්ධියට පටහැනි ය.

න්‍යායන් සහ නීති, කරුණුවල නියම ගමන් මාර්ගය විස්තර කරයි, නමුත් කිසිවක් නොමැතිව කිසිවක් නො පවතී. චලිතවීමේ න්‍යාය මඟින් ක්‍රිඩාවේ පැසිපන්දුව ගමන් කරන දිසාව විස්තර කළ හැකිය, නමුත් ක්‍රිඩකයාගේ අත පන්දුව චලනය කරයි. එබැවින් නීතියට නිශ්චිත බලයක්, ස්ථානයක් සහ වේලාවක් බලපෑමට ලක්වන පැවැත්මක් අවශ්‍ය වේ. මෙම මූලද්‍රව්‍ය නොමැතිව මෙම නීති ක්‍රියාත්මක නො වේ. ඒවා කිසිසේත් පවතින්නේ නැත.

දේදුන්න යනු වැස්ස මත සූර්ය කිරණ පරාවර්තනය වීම නම්, දේදුන්න දැකීමෙන් සතුටක් ලැබීමට ඇති අපගේ උනන්දුව නිසා මැවුම්කරුවෙකු සිටින බව විශ්වාස කිරීමට අපව පොලඹවන්නේ යැයි කීම වැරදියි. දේදුන්නෙහි වර්ණ පෙන්නුම් කළ යාන්ත්‍රණය සොයා ගැනීමෙන්, එය නිර්මාතෘගේ පැවැත්ම ස්ථිරව ම ප්‍රතික්ෂේප කර ඇත යැයි සිතීම ද වැරදිය. උදාහරණයක් ලෙස: යම් පුද්ගලයෙක් පාරේ ඇවිදගෙන ගොස් ඔහුගේ ජංගම දුරකථනය නැති වූ විට, ඔහු පොදු දුරකථන කුටියක් සොයාගෙන, එය භාවිත කර ඔහුගේ බිරිඳට කතා කරයි. මෙම දුරකථනය තිබීම සහ එහි ක්‍රියාකාරී යාන්ත්‍රණය සනාථ කිරීම ඔහු සොයා ගැනීම, මෙම දුරකථනයේ මුල් නිෂ්පාදකයෙක් නො සිටි බව සාක්ෂි වේ ද? නැතහොත් නිෂ්පාදකයෙකු සිටී බව සනාත කරයි ද? යම් දෙයකින් ප්‍රතිලාභයක් ලබා ගැනීම, එය සාදන්නෙකුගේ පැවැත්ම සනාත කරයි. ඇත්ත වශයෙන් ම, මිනිසුන් දේදුන්නේ සුන්දර දර්ශනය භුක්ති විඳීම සහ දේදුන්න පෙන්වන යාන්ත්‍රණය විද්‍යාව සොයා ගැනීම, සූර්යයාගේ නිර්මාතෘ සහ වර්ෂාව යවන්නාගේ පැවැත්ම ප්‍රතික්ෂේප නො කරයි.

අදේවවාදයේ විරුද්ධාභාසය (paradox) පවතින්නේ ඔවුන්ගේ උපකල්පනයට අනුව මහා පිපිරුම බාහිර බලවේගයක මැදිහත්වීමකින් තොරව සිදු වූ බවත්, විශ්වය කිසිදු අරමුණකින් තොරව නිර්මාණය වූ බවත් විශ්වාස කිරීම තුළය. අඛණ්ඩව බැඳුණු (contnous association) නීතිවලට අනුව, අරමුණකින් තොරව රටාව නැවත නැවත ප්‍රතිනිෂ්පාදනය කිරීමට හැකියාව තිබුණි. බුද්ධිය, වියුක්ත චින්තනය (abstract thinking) සහ විඥානය, අරමුණක් නොමැතිව මෝඩ, අතාර්කික මූලාශ්‍රවලින් කෙසේ හෝ මතු විය හැකි බව විශ්වාස කරන ලෙස අපෙන් ඉල්ලා සිටියි. නිදහසේ ක්‍රියාත්මක කළ හැකි සංකේතාත්මක තොරතුරු (DNA) යෝධ මිටියක්,

ක්‍රමලේඛකයෙකු නොමැතිව, හේතුවක් නොමැතිව ලියැවී ඇති බව විශ්වාස කිරීම මෙම මළ ද්‍රව්‍යය හදිසියේම අරමුණක් නොමැතිව නැවත මතුවිය හැකි යැයි විශ්වාස කරන ලෙස පවසයි.

තාප ගති විද්‍යාවේ (thermo dynamics) දෙවන නියමය පවසන්නේ කාලය ගමන් කරන්නේ චක්‍රීය (cyclical) ආකාරයෙන් නො ව රේඛීය (Linear) මාර්ගයක බවයි, එබැවින් සීතල ශරීරයක සිට උණුසුම් ශරීරයකට තාපය මාරු කළ නො හැකිය. මේ අනුව, මෙම නීතිය කාලය සහ ලෝකය පිළිබඳ චක්‍රීය අදහස සහ හින්දු, බෞද්ධ සහ සාම්ප්‍රදායික චීන ආගම් විසින් ඉදිරිපත් කරන ලද ආත්ම සංක්‍රමණ දර්ශනය ප්‍රතික්ෂේප කරයි. එමෙන් ම මැවුම්කරුවාගේ ස්වරූපයෙන් මූර්තිමත් වන පිළිමයක්, ගලක්, ආදිය විශ්වාස කරන ප්‍රධාන මිථ්‍යාදෘෂ්ටික ආගම් මේවාය. මෙම නියමය විශ්වයේ ආරම්භයක් සහ අවසානයක් ඇති බව තහවුරු කරයි, එමඟින් ආත්ම සංක්‍රමණය පිළිබඳ දර්ශනය ප්‍රතික්ෂේප කරයි.

ඉස්ලාම් යනු පරාමාධිපත්යේ ඒකීය කරණ වාදය (එක් දෙවියෙකු කෙරෙහි විශ්වාසය) පමණක් නො ව, නැමදුමෙහි දේවත්වය ඒකීය කරණය (ඔහුට පමණක් නැමදුම් කිරීමේ අර්ථයෙන් දේවත්වය ඒකීය කරණය) කිරීම ද වේ. එක දෙවියෙකු පිළිබඳ විශ්වාසය බොහෝ ආගම්වල පවතින අතර, එය කුරෙයිෂ් වංශයේ (මුහම්මද් නබිතුමාගේ ජනයාගේ) ප්‍රතික්ෂේපකයින්ගේ විශ්වාසය තුළ ද පැවතුනි. පිළිම වන්දනා කිරීමට හේතුව ගැන ඔවුන්ගෙන් විමසූ විට, ඔවුන් පැවසුවේ: "(අප එසෙ සිදු කරනුයේ) ඔවුන් අපව දෙවිඳා වහන්සේ වෙත සමීප කරවීම සඳහාය" යැයි පවසා සිටියෝය. ඔවුන් පවා දෙවිඳාගේ පැවැත්ම ප්‍රතික්ෂේප නො කළෝය.

මැවුම්කරු මෙසේ පැවසීය:

"...තවද, ඔහු හැර වෙනත් අය ආරක්ෂකයින් ලෙස ගත් අය 'අල්ලාහ් වෙත අප සමීප කරවීමට මිස අපි ඔවුනට නැමදුම් නො කළෙමු' (යැයි පවසති) ..." (අස් සුමර් 38:3)

මේ සියල්ල සිදුවූයේ මැවුම්කරු පිළිබඳ සැබෑ සංකල්පය නොදැනුවත්කම නිසාවෙනි. එය මනස ව්‍යාකූලත්වයට පත් කර අදේවවාදය වෙත යොමු වීමට හේතු විය. එමෙන් ම මැවුම්කරුගේ පැවැත්මට හේතු සහ ඔහුගේ පැවැත්ම සැක කරන වෙනත් ප්‍රශ්න මතු කිරීම් සිදුවිය.

මැවුම්කරු හේතු කාරක නීතිය නිර්මාණය කළ අතර, ඔහු එයට යටත් නො වේ. එනම් ඔහු සෑම දෙයකට ම පෙර සහ සියල්ලට පසුව සිටින බවත්, ඔහුගේ කිසිදු මැවීමක් ඔහු වටා නො සිටින බවත් ය. එබැවින් ඔහු වෙනස් නො වෙයි. ඔහු කාලයට යටත් වීම හරහා අප පසු කරන කාල පරිච්ඡේදයන් හරහා ගමන් නො කරයි, වෙහෙසට පත් නො වෙයි. භෞතික ස්වරූපය තුළ වීමට අවශ්‍ය නො වෙයි. ඔහුව දැකීමට අපට නො හැකිය. මන්ද අප කාලය හා අවකාශය තුළ සිරවී සිටින බැවිනි. නිදසුනක් වශයෙන්, ජනේල නොමැති කාමරයක වාඩි වී සිටින පුද්ගලයෙකුට පිටත ඇති දේ බැලීමට කාමරයෙන් පිටවීමට සිදු වනවාක් මෙනි. මැවුම්කරු තමාට අවශ්‍ය දේ තුළ ක්‍රියාත්මක වන අතර සර්වබලධාරී වුවද, ඔහු තම මහිමයට නොසුදුසු දේ නො කරන බව අප පිළිගත යුතුය.

විශ්වයේ සෑම දෙයක් ම මැවුම්කරුගේ ආධිපත්‍ය යටතේ පවතින අතර, ඔහු පමණක් පරිපූර්ණ දැනුම, නිරපේක්ෂ දැනුම, හැකියාව සහ ඔහුගේ කැමැත්තට සියල්ල යටත් කිරීමට බලය ඇත්තාය. සූර්යයා, ග්‍රහලෝක සහ මන්දාකිණි මැවීමේ ආරම්භයේ සිට ම ඉතා නිරවද්‍යතාවෙන් ක්‍රියා කර ඇති අතර මෙම නිරවද්‍යතාව සහ හැකියාව

මිනිසාගේ නිර්මාණයට ද අදාළ වේ. මිනිස් සිරුරු සහ ඔවුන්ගේ ආත්මයන් අතර පවතින සංහිඳියාව මෙනෙහි කළහොත්, මෙම ආත්මයන් සතුන්ගේ ශරීරවල වාසය කිරීමට නො හැකි බවත්, ශාක හා කෘමීන් අතර සැරිසැරීමට නො හැකි බවත් (ආත්මයන්ගේ පුනරුත්පත්තිය) අපට පැහැදිලි වේ. දෙවිඳා, මිනිසා බුද්ධියෙන් හා දැනුමෙන් වෙන් කර, ඔහු මිහිපිට නියෝජිතයෙකු බවට පත් කළේය. සියලු සත්වයින්ට වඩා ඔහුට ගරු කළේ ය. අගය කළේය. උසස් කළේය. නැවත නැගිටීමේ දිනය, විනිශ්චය, ස්වර්ගය සහ නිරයේ පැවැත්ම ද මැවුම්කරුගේ යුක්ති ධර්ම අතරින් එකකි. හේතුව සියලු යහපත් හා දුෂ්ඨ ක්‍රියාවන් මෙදින කිරා මැන බලනු ඇත.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

“එහෙයින් කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් අයහපතක් කර ඇත්තේද ඔහු එය දැක ගනී.” (7)

"තවද, කවරෙක් අණුවක් තරම් ප්‍රමාණයකින් අයහපතක් කර ඇත්තේද ඔහු එය දැක ගනී." (අස්-සිල්සිාල් 99:7,8)

ඩාවින්ගේ සමහර අනුගාමිකයෝ, ස්වභාවික තෝරා ගෙනීම natural selection යනු (අතාර්කික භෞතික ක්‍රියාවලිය) කිසිදු සැබෑ ආනුභවික පදනමකින් තොරව සියලු දුෂ්කර පරිණාමීය ගැටලු විසඳන අද්විතීය නිර්මාණාත්මක බලයක් ලෙස සැලකූහ. පසුව බැක්ටීරියා සෛලවල ව්‍යුහයේ සහ ක්‍රියාකාරිත්වයේ සැලසුමේ සංකීර්ණත්වය සොයා ගනු ලැබීය. "ස්මාර්ට්" බැක්ටීරියා, 'ක්ෂුද්‍ර ජීවී බුද්ධිය', 'තීරණ ගැනීම' සහ 'ගැටළු විසඳීමේ බැක්ටීරියා' වැනි වචන මාලාව භාවිත

කිරීමට පටන් ගත්තෝය. මේ අනුව, බැක්ටීරියාව ඔවුන්ගේ නව දෙවිඳා බවට පරිවර්තනය විය[4].

සුප්‍රසිද්ධ ඇමරිකානු ලේඛකයෙකු සහ රසායන විද්‍යාඥයෙකු වන Michel Behe මෙසේ පවසයි. "සෛලය පරීක්ෂා කිරීමට මේ රැස්කරගත් සියලු උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස දෙවිඳාගේ පැවැත්ම පිළිගැනීමට මට බලකෙරුනි. එනම්: අණුවක මට්ටමින් ජීවය පරීක්ෂා කිරීම, එය දැඩි අධිෂ්ඨානයේ, පැහැදිලි, තියුණු මොරහඬ දීමකි.

සත්‍යය නම්, මිනිසා මූලික වශයෙන් වානරයෙකුගෙන් බිහි වූවක් හෝ වානරයෙකුගෙන් පරිණාමය වූවක් යන අදහස කිසි විටෙක ඩාවින්ගේ අදහස් තුළ නො තිබුණු බව ඔහු පවසයි: එම මිනිසා සහ වානරයා අයත් වන්නේ එක් පොදු සහ නොදන්නා සම්භවයක් වන අතර, ඔහු එය හැඳින්වූයේ (නාඳුනන සබැඳිය unknown link) යැයි හැඳින්විය. එය විශේෂ පරිණාමයක් වූ අතර එය මිනිසෙකු බවට පත් විය යන්නෙනි. නමුත් අපි මුස්ලිම්වරුන් ලෙස ඩාවින්ගේ වචන මුළුමණින් ම ප්‍රතික්ෂේප කරන අතර, ඇතැමුන් සිතන පරිදි, සියලු ම තත්ත්වයන්හි වඳුරා මිනිසාගේ මුතුන් මිත්තෙකු බව ඔහු පවසා නැත. ඩාවින් දෙවියෙකු සිටින බව විශ්වාස කළ බව සනාථවී ඇත. නමුත් මිනිසා හා සත්ව සම්භවයක් ඇති බවට අදහස අනාගතයේ දී ඩාවින්ගේ අනුගාමිකයින් ඔහුගේ න්‍යායට එකතු කළ විට පැමිණි අතර, ඔවුන් මුලින් අදේවවාදීන් ලෙස සිටියහ.

ඩාවින්ගේ න්‍යාය මෙසේ කියයි: “අප මේ විශ්වයට පැමිණියේ අහඹු විකෘතිවල ප්‍රතිඵලයක් ලෙස මිස ශ්‍රේෂ්ඨ මැවුම්කරුවෙකුගෙන් නො

---

[4] Atheism A Giant Leap of Faith. Dr. Raida Jarrar

වේ." එය තවමත් ඔප්පු කර නොමැති න්‍යායක් පමණි. මෙම න්‍යායේ කතුවරයා වන ඩාවින්ට බොහෝ සැකයන් ඇති බව ඔප්පු වී ඇත. ඔහු තම සගයන්ට සිය සැකයන් සහ පසුතැවීම ප්‍රකාශ කරමින් ලිපි රාශියක් ලිවීය. ඔහු මෙසේ පැවසීය: "අපේ විශ්වය තරම් ශ්‍රේෂ්ඨ විශ්වයක් සහ ජීවියෙකු අපගේ අතිමහත් මානව හැකියාවන් භුක්ති විඳිනවා යැයි සිතීම ඉතා අපහසුය. එය ආරම්භයේ දීම ඇතිවූයේ අන්ධ අහම්බයකින් හෝ අවශ්‍යතාව හා සොයාගැනීම නිසා වෙනි. මෙම පැවැත්ම පිටුපස ඇති පළමු හේතුව ගැන මා අවට සොයා බැලූ විට, බුද්ධිමත් මනසක පැවැත්මක් ඇති බව මට වැටහිනි. එබැවින් මම දෙවිඳාගේ පැවැත්ම විශ්වාස කරමි."

මැවුම්කරුවෙකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමට අදහස් කරන පරිණාමවාදයේ න්‍යාය, සියලු ජීවීන්ගේ, සතුන්ගේ සහ ශාකවල උත්පත්තිවල පොදු සම්භවය ප්‍රකාශ කරන අතර, ඒවා ඒක සෛලීය ජීවියෙකු වන තනි ප්‍රභවයකින් පරිණාමය වූ බවත්, පළමු සෛලය සෑදීම ජලයේ ඇමිනෝ අම්ල එකලස් කිරීමේ ප්‍රතිඵලයක් වන අතර එමගින් ජීවියාගේ ප්‍රවේණික ලක්ෂණ දරණ DNA හි පළමු ව්‍යුහය සෑදී ඇති බවත්, මෙම ඇමිනෝ අම්ල ඒකාබද්ධ කිරීමෙන්, සජීවී සෛලයක පළමු ව්‍යුහය සෑදී ඇති බවත් ප්‍රකාශ කරයි. ප්‍රථම ශුක්‍රාණුව සෑදී පසුව කුඩැල්ලෙකු ලෙස වර්ධනය වී කලලයක් බවට පත් වූ මෙම සෛල ප්‍රගුණනය වීමට හේතු වූයේ විවිධ පාරිසරික හා බාහිර සාධකවල ප්‍රතිඵලයක් ලෙසයි.

"තවද, අල්ලාහ් සියලු සත්වයින් ජලයෙන් මැව්වේය. ඔවුන් අතරින් උදරය මත බඩ ගා ගමන් කරන්නන් වෙයි. තවද, ඔවුන් අතරින් දෙපා මත ගමන් කරන්නන් ද වෙයි. තවද, ඔවුන් අතරින් සිව්පා මත ගමන් කරන්නන් ද වෙයි. අල්ලාහ් අභිමත කරන දෑ මවන්නේය. නියත

වශයෙන් ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි ශක්තිය ඇත්තාය." (අන්-නූර් 24:45)

උතුම් අල් කුර්ආනයේ, පොදු සම්භවයකින් පරිණාමය සංකල්පය සඳහා විද්‍යාව ඒත්තු ගැන්වෙන සාක්ෂි සපයයි.

"...තවද, ජීවමාන සෑම දෙයක් ම ජලයෙන් ඇති කළ බවත් ප්‍රතික්ෂේප කළවුන් නො දුටුවෝ ද? එහෙයින් ඔවුහු විශ්වාස කළ යුතු නො වේ ද?.." (අල්-අන්බියා 21:30)

සර්වබලධාරී දෙවිඳා, අවට පරිසරයට ගැලපෙන පරිදි බුද්ධිමත් හා සහජ ජීවීන් නිර්මාණය කළ අතර ඒවාට ප්‍රමාණයෙන්, හැඩයෙන් හෝ දිගෙන් වර්ධනය විය හැකිය. නිදසුනක් ලෙස, සීතල රටවල බැටළුවන්ට සීතලෙන් ආරක්ෂා වීම සඳහා විශේෂිත හැඩයක් සහ හම් උන්ට ලැබී ඇත. අනෙක් රටවල් මෙන් නො ව වායුගෝලයේ උෂ්ණත්වය අනුව ලොම් වැඩි හෝ අඩු වන අතර පරිසරය අනුව හැඩ සහ වර්ග වෙනස් වේ. කිසිම මිනිසෙකු අනෙකාට සමාන නො වන පරිදි මිනිසුන් පවා ඔවුන්ගේ වර්ණ, ලක්ෂණ, දිව සහ හැඩතලවලින් වෙනස් වේ. කෙසේ නමුත් ඔවුන් මිනිසුන් ලෙස පවතින අතර වෙනත් සත්ව වර්ගයකට වෙනස් වන්නේ නැත.

උත්තරීතර හා පාරිශුද්ධ වූ අල්ලාහ් මෙසේ පවසයි:

"තවද, අහස් හා මහපොළොව මැවීම ද, නුඹලාගේ භාෂා හා නුඹලාගේ වර්ණ විවිධත්වය ද ඔහුගේ සංඥා අතරිනි. නියත වශයෙන් ම එහි දැනුමැත්තන්හට සංඥා ඇත." (අර්-රූම් 30:22)

සුප්‍රසිද්ධ පරිණාමීය විද්‍යාඥ Jules Dewant ඔහුගේ "The Ascent of Nature in Darwin's Descent of Man" හි 295 වන පිටුවේ මෙසේ පවසයි:

"කාන්තාවන්ගේ තරාතිරම පිරිමින්ට වඩා බෙහෙවින් පහත් බව ඩාවින් විශ්වාස කළේය. විශේෂයෙන් ම පැවැත්ම සඳහා අරගලය ගැන කතා කරන විට ඔහු 'මෝඩයන්, ආබාධිතයන්, පසුගාමීන් සහ කාන්තාවන්' එක තත්වයේ තැබුවේය! පිරිමියෙකුට සාපේක්ෂව කාන්තාවකගේ මොළයේ ප්‍රමාණය සහ ඇගේ මාංශ පේශි ප්‍රමාණය පිරිමියා සමඟ පැවැත්ම සඳහා අරගලයකට අවතීර්ණ වීමට ඉඩ නො දෙන නමුත්, ඇය තුළ නිවැරදි කළ නො හැකි ජීව විද්‍යාත්මක යම් ආකාරයක ඌනතාව දකින බව ඔහුගේ අදහස විය.

මෙය ඇත්ත වශයෙන් ම පරිණාමවාද න්‍යායේ අනුගාමිකයින්ගේ සහ අදේවවාදීන්ගේ විශ්වාසයන් හෙළි කරන (ද්‍රවමය) විරුද්ධාභාසයකි. මෙය, විශේෂයෙන් ඉස්ලාමයේ (කාන්තාවගේ) තත්වයට විරුද්ධ වන්නන් අතර පවතී. එම කාන්තාව මිනිසා ගෙන් මැවූ, එනම් ඔහු තුළින් මැවූ අල්ලාහ්ගේ මැවීමකි. ඔහු ඇයට ආශා කරන අතර ඇය ඔහුට ආශා කරයි.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

"තවද, නුඹලා ඇය සමඟ වාසය කර (සැනසුම ලබ)නු පිණිස නුඹලා තුළින් ම නුඹලා වෙනුවෙන් බිරියන් මවා තිබීම ද ඔහුගේ සංඥා අතරිනි. තවද, නුඹලා අතර ආදරය හා කරුණාව ඔහු ඇති කළේය. නියත වශයෙන් ම එහි මෙනෙහි කරන ජනයාට සංඥා ඇත." (අර්-රූම් 30:21)

ප්‍රංශයේ 673 වසරයේ දී යුරෝපියානු කාන්තාවගේ නීත්‍යානුකූල තත්ත්වය ගැන තීරණය කිරීම සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වූහ. ඇය මනුෂ්‍යයෙක් ද? සතෙක් ද? ඇය මනුෂ්‍යයෙක් නම් ඇයට සියලු අයිතිවාසිකම්වලින් ප්‍රතිලාභ ලැබේ ද, නැද්ද? ඇය සතෙක් නම් ඇයට සියලු අයිතීන් හිමිද, නැද්ද? මෙසේ දැඩි සාකච්ඡාවලින් පසුව, ඔවුන් ඒකමතිකව නිගමනය කළේ මෙසේය. කාන්තාවන් මනුෂ්‍යයන් වන නමුත් ඔවුන්ට අයිතිවාසිකම්වලින් ප්‍රයෝජනයක් නොමැති බවයි. පරිණාමවාදයේ න්‍යායේ කතුවරයාට මෙම ඍජු සමුළුවේ බලපෑම සහ දේවත්වය විශ්වාස කරන්නන්ගේ විශ්වාසයන් කෙරෙහි එහි බලපෑම පැහැදිලි විය. එය ඉස්ලාමයේ විශ්වාසයේ සහ එහි නීතියේ අනෙකුත් සියලු ම විශ්වාසයන්ට වඩා උසස් බාවය පිළිබඳ සාක්ෂියකි. ඉතිහාසයේ සහ යථාර්ථයේ සාක්ෂි මෙන් ම කාන්තාවන්ගේ මනුෂ්‍යත්වය, මිනිස් ගෞරවය සහ අභිමානය නැති කරන, ඔවුන් ලාභ සහ නිරුවත් භාණ්ඩයක් සහ විනෝදයක් ලෙස සලකන මිනිසා විසින් සාදන ලද නීති සහ මූලධර්මවලට ද එය අදාළ වේ.මෙම සමුළුයව මෙම බලාපොරොත්තු සුන්වීම සහ බුද්ධිමය සහ සදාචාරාත්මක පරිහානිය පෙන්නුම් කිරීමක් ලෙස අපි සලකමු.

ජර්මානු ඩාවින්වාදීන් ඩාවිනියානු න්‍යාය භාවිත කළේ මිනිස් ජීවිතයේ පාරිශුද්ධභාවය විනාශ කිරීමටයි. ආබාධිත පුද්ගලයින්ට ජීවත් වීමට අයිතියක් නැත යන ඩාවින්ගේ න්‍යාය මත පදනම්ව, "සුව කළ නො හැකි රෝගය ඉවත් කිරීමට යුධ සමය සුදුසු ම කාලය" යි ඇඩොල්ෆ් හිට්ලර් යෝජනා කළේය. බොහෝ ජර්මානුවන්ට ඔවුන්ගේ "ප්‍රමුඛ ලිංගිකත්වය" පිළිබඳ සංකල්පයට අනුව ජීවත් නො වූ පුද්ගලයින් ගැන සිහිපත් කිරීමට අවශ්‍ය නො වීය. කායික හා මානසික ආබාධිතයන් සමාජයට "වැඩක් නැති", ආර්ය ජානවල සංශුද්ධතාවට තර්ජනයක් සහ අවසානයේ ජීවිතයට නුසුදුසු අය ලෙස නිරූපණය කරන ලදී.

දෙවන ලෝක සංග්‍රාමයේ ආරම්භයේ දී, නාසීන් විසින් "T-4" හෝ "අනායාසා ඝාතනය" (Euthanasia) ලෙස හැඳින්වූ ක්‍රමයෙන්, මානසික සහ ශාරීරික ආබාධිත පුද්ගලයන් ඝාතනය කිරීම සඳහා ඉලක්ක කරන ලදී. මියගිය අයගේ සිරුරු ඇත්ත වශයෙන් ම පුළුස්සා දැමුවේ ආදාහනාගාර ලෙස හැඳින්වෙන විශාල පෝරන තුළ ය.

"ඇන්තනි ෆ්ලූ" නම් දාර්ශනිකයා ඇතුළු බොහෝ සමකාලීන භෞතිකවාදී දාර්ශනිකයන්ගේ අදේවවාදය පිටුපස අවාසනාවන්ත, අයහපත් හා වේදනාවේ පැවැත්ම හේතු වූ අතර, ඔහු තම මරණයට පෙර දෙවිඳාගේ පැවැත්ම පිළිගෙන "දෙවියෙක් සිටී" නමින් පොතක් ලියා ඇත. ඔහු විසිවන සියවසරේ දෙවන භාගයේ දී අදේවවාදයේ නායකයෙකු වුවද, දෙවිඳාගේ පැවැත්ම පිළිගත් විට ඔහු මෙසේ පැවසීය.

"මිනිස් ජීවිතය තුළ නපුර සහ වේදනාව පැවතීම, දෙවිඳාගේ පැවැත්ම ප්‍රතික්ෂේප නො කරයි. නමුත් එය දිව්‍යමය ගුණාංග නැවත සලකා බැලීමට අපව පොළඹවයි."

මෙම ව්‍යසනයන් නිසා මිනිසාගේ ද්‍රව්‍යමය හැකියාවන් පොළඹවනු ලබන හෙයින් බොහෝ ධනාත්මක කරුණු සිදු වන බව ඇන්තනි ෆ්ලූ සලකයි. එනිසා ඔහු තමාට ආරක්ෂාව ගෙන දෙන දේ නිර්මාණය කරයි. එමෙන් ම ඔහුගේ හොඳ ම මනෝවිද්‍යාත්මක ලක්ෂණ ද අවුස්සන අතර මිනිසුන්ට උපකාර කිරීමට ඔහුව පොළඹවයි. නපුර සහ වේදනාවේ පැවැත්ම ඉතිහාසය පුරා මානව ශිෂ්ටාචාර ගොඩනැගීමේ ගෞරවයට ලක් වී ඇත. තවද, ඔහු මෙසේ පැවසීය.

"මෙම උභතෝකෝටිකය පැහැදිලි කිරීමට කොපමණ නිබන්ධණ ලියවී තිබුණද, ආගමික අර්ථ නිරූපණය වඩාත් පිළිගත හැකි සහ ජීවිතයේ ස්වභාවයට වඩාත් ම අනුකූල වනු ඇත."

ලෝවාසීන්ගේ පරමාධිපතිගේ එක් ගුණාංගයක් නම් ප්‍රඥාවයි. අරමුණක් හෝ ඉලක්කයක් හෝ නොමැතිව නිකරුණේ කිසිවක් නිර්මාණය නො කරන ඔහු, අපට අනුකම්පා කිරීමට, සතුටු කිරීමට, ආශිර්වාද කිරීමට අපව නිර්මාණය කළේය. සියලු සුන්දර මනුෂ්‍ය ගුණාංග ඔහුගේ ගුණාංගවලින් ලැබූ ගුණාංග වෙති. තවද, මේ ලෝකයේ අපගේ පැවැත්ම අරමුණක් සහ උසස් ඉලක්කයක් සඳහා වන අතර, එනම් එය සර්වබලධාරී දෙවියන්ව දැන හඳුනා ගැනීම සහ පසුතැවිල්ලෙන් ඔහු වෙත හැරී ඔහුගෙන් ඍජුව ම උපකාර පැතීමයි.

ලෝවාසීන්ගේ පරමාධිපති පිළිබඳ දැනුම සාක්ෂාත් කරගනු ලබන්නේ ඔහුගේ අලංකාරවත් නාමයන් සහ ඔහුගේ උත්තරීතර ගුණාංග දැන ගැනීමෙන් වන අතර, ඒවා මූලික වර්ග දෙකකට බෙදා ඇත. එනම්: "අස්මාඋ ජමාල්": දයාව, සමාව දීම සහ කරුණාව යන සියලු ගුණාංගවලින් ඒවා විශේෂිත වේ. ඒ අතරින් මහා කාරුණික, පරම දයාබර, පෝෂක, ත්‍යාගවන්ත, ධර්මිෂ්ඨ, දයානුකම්පිත යනාදිය පවතී. "අස්මා ජලාල්": එය බලය, ශක්තිය, බලාධිකාරිත්වය හා ත්‍රාසය යනාදී සියලු ගුණාංගවලින් විශේෂිත වේ. ඒ අතරින් සර්වබලධාරියා, මඩලන්නා, ග්‍රහණය කරන්නා, පහත් කරන්නා යනාදිය ඇතුළු වේ.

සර්වබලධාරී දෙවිඳාගේ ගුණාංග පිළිබඳ අපගේ දැනුම අනුව, දෙවිඳාගේ මහිමයට ගැළපෙන ආකාරයෙන් ඔහුට නමස්කාර කිරීම, ඔහු උත්කර්ෂයට නැංවීම, ඔහුට නොගැළපෙන දැයින් පිවිතුරු නො කිරීම, ඔහුගේ දයාව පිළිබඳ බලාපොරොත්තු වීම සහ ඔහුගේ උදහසින් හා දඬුවමෙන් වැළකීම යනාදිය පෙළ ගැසේ. එමෙන් ම

නියෝග පිළිපැදීම, තහනම් දැයින් වැළකී සිටීම, ප්‍රතිසංස්කරණ කටයුතුවල නිරත වීම සහ මහපොළොව පාලනය කිරීම යනාදිය ද ඔහුට නැමදුම් කිරීම නියෝජනය කරයි. මේ මත පදනම්ව, මෙලොව ජීවිතය පිළිබඳ සංකල්පය මිනිසුන්ට පරීක්ෂණයක් හා විභාගයක් බවට පත් වේ. එමඟින් ඔවුන් කැපී පෙනෙනු ඇත. දේවභක්තිකයින්ගේ නිලයන් අල්ලාහ් ඉහළ නංවා ඔවුන් පෘථිවියේ පාලනයට හා මතුලොව ස්වර්ගයේ උරුමයට සුදුසුකම් ලබනු ඇත. එසේ ම මෙලොවදී දූෂිතයින්ට අපකීර්තිය ඇති වන අතර ඔවුන්ගේ ඉරණම නිරා ගින්නේ දඬුවම වනු ඇත.

මැවුම්කරු ස්වභාවධර්මයේ නීති සහ ඒවා පාලනය කරන නීති සකස් කර ඇති අතර, දූෂණය හෝ පරිසර විපර්යාසවල දී ඒවා තමන්ව ආරක්ෂා කර ගනී. ඒ අනුව පෘථිවිය සහ ජීවය වඩා හොඳ ආකාරයකින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම සමතුලිතතාවේ පැවැත්ම පවත්වා ගනී. මිනිසුන්ට සහ ජීවිතයට ප්‍රයෝජනවත් වන්නේ පෘථිවියේ රැඳී සිටීම හා පැවත්මයි. මිනිසුන් පීඩාවට පත් වන රෝග, ගිනි කඳු, භූමිකම්පා සහ ගංවතුර වැනි ව්‍යසනයන් පෘථිවියේ සිදු වූ විට, දෙවිඳාගේ නම් සහ ගුණාංග ප්‍රකාශ වේ. උදාහරණයක් ලෙස, ඔහු රෝගීන් සඳහා සුවය ලබා දීමේ දී සහ දිවි ගලවා ගැනීමේදී හෝ අන් අයට අසාධාරණකම් කරන හා අකීකරු වන අයට දඬුවම් දීමේදී හා යුක්තිය ආරක්ෂා කිරීමේ දී 'ෂාෆී' සුවය ලබා දෙන්නා 'හෆීල්' ආරක්ෂකයා යන නාම ප්‍රකාශ වේ. තවද, අකීකරු වූවන් පරීක්ෂාවට හා පිරික්සුමට ලක් කිරීමේ දී ඔහුගේ 'හකීම්' යුක්තිය යන නාමය ප්‍රකාශ වේ. මිනිසා ඉවසිලිවන්තව කටයුතු කළ හොත් පුණ්‍ය විපාක ලබන අතර කම්මැලි නම් වධහිංසාවෙන් විපාක ලබනු ඇත. මිනිසා මෙම පරීක්ෂාවන් තුළින් තම ස්වාමියාගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගනී. එමෙන් ම ඔහුගේ ආශිර්වාදයන් තුළින් ඔහුගේ සුන්දරත්වය හඳුනා ගනී.

යමෙක් දිව්‍යමය සුන්දරත්වයේ ගුණාංග හැර වෙනත් යමක් නො දන්නේ නම්, එය ඔහු සර්වබලධාරී දෙවිඳාව නොදැන සිටියාක් මෙනි.

පරීක්ෂාවන්ගෙන් යමක් හට ගැනීම දෙවිඳාගේ අභිමතය වන අතර දෙවිඳා කැමති දේ සිදුවනු ඇත; දෙවිඳාගේ කැමැත්ත පරම ප්‍රඥාවට සම්බන්ධ වන අතර පරම ප්‍රඥාව පරම යහපතට සම්බන්ධ වේ. පැවැත්මේ පරම අයහපතක් නැත. පුද්ගලයෙකු ජීවත් වන ලෞකික ජීවිතය සදාකාලික පරලොව හා සසඳන විට එය මොහොතකට පමණක් සමාන වන අතර, පසුව ඔහු මෙලොව දී දුක් විඳි සෑම දෙයක් ම ස්වර්ගයේ එක කිමිදීමකින් පහසු වනු ඇත.

නිදසුනක් වශයෙන්, සිටගන්නට ශක්තිය ඇති පුද්ගලයෙක්, නැගිටින්නට නො හැකි තවත් පුද්ගලයෙකුට පහර දෙන්නේ නම්, ඔහු අයුක්තියේ චරිතය ලබාගන්නා අතර අයුක්තිය නපුරු ය.

නමුත්, පොල්ලක් ගෙන තවකෙකුට පහර දෙන තරමට කෙනෙකු සතු බලය තිබීම නපුරු දෙයක් නො වේ.

දෙවිඳා ඔහුට දුන් කැමැත්ත ඔහු තුළ තිබීම නපුරක් නො වේ.

කෙනෙකුට ඔහුගේ අත සොලවන්නට හැකියාව තිබීම නරක දෙයක් නො වේ ද?

තවද, පොල්ලට පහර දීමේ විශේෂණ ලක්ෂණය තිබීම ද නපුරක් නො වේ ද?

මේ සියලු පැවැත්මේ කරුණු යහපත් වන අතර ඒවා වැරදි ලෙස භාවිත කිරීමෙන් හානියට පත් නො වන්නේ නම් ඒවා නරක ස්වභාවයක් නො ලබයි. පෙර උදාහරණයේ දී මෙන් එය අංශභාග තත්ත්වයකි. මෙම උදාහරණය මත පදනම්ව ගෝනුස්සෙකුගේ සහ

සර්පයෙකුගේ පැවැත්ම දෙස බලමු. යම් පුද්ගලයෙකුට උන් නිරාවරණය වී දෂ්ට කරන්නේ නම් මිස විශේෂිත නපුරක් උන්ට නැත. සර්වබලධාරී දෙවිඳා ඔහුට නරක යැයි ආරෝපණය කරන්නේ ඔහුගේ පිරිසිදු යහපත් ක්‍රියාවන් තුළ නො ව, මිනිසුන් විසින් මෙම යහපත වැරදි ලෙස භාවිත කිරීමෙන් ඇති වූ ඔහුගේ ප්‍රතිවිපාක තුළ ය. තවද, මේ අකුසලයෙන් සිදුවන පසුතැවිලි වීම, දෙවිඳා වෙතට නැවත පැමිණීම වැනි නිර්මල යහපත නිසාවෙන් ද සර්වබලධාරී දෙවිඳා මෙම අකුසලය සිදු වීමට ඉඩ හැරිය හැකිය. එබැවින් එය සුවය සඳහා තිත්ත බෙහෙත් පානය කිරීම වැනි ය.

මැවුම්කරු, මිනිසුන්ට ඔවුන් අකමැති ජීවිතයක් ගෙවීමට බල කිරීම සම්බන්ධව නිතර අසනු ලබන ප්‍රශ්නය පදනම් විරහිත එකකි. මැවීමේදී ඔහුගේ මැවීම්වල මතය ගැනීමට දෙවිඳා අභිමත කළේ නම්, පළමුව ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීමට අවශ්‍ය වේ. මිනිසුන් ශුන්‍යව සිටියදී ඔවුනට මතයක් විය හැක්කේ කෙසේ ද? මෙහි ඇති ප්‍රශ්නය වනුයේ පැවැත්ම සහ නො පැවැත්මයි. කෙනෙකුගේ ජීවිතයට ඇති බැඳීම සහ ඔහුට ඇති බිය, මෙම ආශීර්වාදයෙන් ඔහු සෑහීමකට පත්වන බවට ඇති ලොකු ම සාක්ෂියයි. ජීවිතයේ ආශීර්වාදය යනු මිනිසුන්ට තම ස්වාමියා සමඟ තෘප්තිමත් වන යහපත් පුද්ගලයා සහ ඔහු සමඟ කෝපයෙන් සිටින නපුරු පුද්ගලයා වෙන්කර හඳුනා ගැනීමට වූ පරීක්ෂණයකි. සර්ව ලෝකයන්හි දෙවිඳාගේ ප්‍රඥාව වනුයේ මැවීම් අතරින් ඔහු ගැන සෑහීමට පත් වූවන් පරලොවදී ඔහුගේ ගෞරවයේ නිවහන ලබාගැනීමයි. මිනිසා වගකීම දැරීමෙන් පසු, සර්වබලධාරී දෙවිඳා විශ්වය තුළ ඔවුන්ගේ මැවීමට පෙර සියලු මිනිසුන් තමන් ඉදිරියේ සම්මුඛ කර, තම ඒකීයභාවය පිළිබඳ තහවුරු කර ගත්තේය.

"තවද, නුඹගේ පරමාධිපති ආදම්ගේ දරුවන්ගෙන් ඔවුන්ගේ කොඳුවලින් ඔවුන්ගේ පරපුර ගෙන, ඔවුනට එරෙහි ව ඔවුන් ම සාක්ෂි දැරීමට පත් කොට නුඹලාගේ පරමාධිපති මා නො වේ දැයි විමසූ බව සිහිපත් කරනු. එසේය අපි සාක්ෂි දරමු යැයි ඔවුහු පැවසුවෝය. (එසේ ප්‍රතිඥාවක් ගනු ලැබුවේ) මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ 'නියත වශයෙන් ම අපි මේ ගැන අනවධානීන් ලෙස සිටියෙමු' යැයි නුඹලා නො පවසනු පිණිසය." (අල්-අඃරාෆ් 7:172)

එදින දෙවිඳුන්ගේ ඒකීයභාවයට සාක්ෂි දුන් බවට වූ විශාලතම සාක්ෂිය නම්, මිනිසුන් අතර සිටින විශ්වාස කරන්නන් මෙන් ම විශ්වාස නොකරන්නන් යන සියලු දනන් බියට පත් වූ විට, උදව් ඉල්ලීමට පවා හැඟීමක් නොමැතිව ඔහුගේ දෑස් අහස දෙසට යොමුවී තිබීමයි.

පුද්ගලයෙකුට මතක නැති වීමට හේතුව නම්, සර්වබලධාරි දෙවිඳා ඉදිරියෙහි සිටගෙන ඔහු හැර වෙනත් දෙවියෙකු නොමැති බවට සාක්ෂි දුන් බවත්, පසුව මෙම පුද්ගලයා පෘථිවියේ යම් කාලයක සහ ස්ථානයක සිටින බවත් ඔහුට සිහිපත් වන්නේ නම්, කිසිම පරීක්ෂණයක් සිදු නො වනු ඇති බැවිනි. පරීක්ෂණයේ සාරය ශ්‍රද්ධාව හා සම්බන්ධ වන අතර ශ්‍රද්ධාවේ සාරය අදෘශ්‍යයමාන දේ විශ්වාස කිරීම හා සම්බන්ධ වේ. නොපෙනෙන දේ පෙනෙන, දැනෙන අයුරින් සෑම කෙනෙකුගේ ම මනසෙහි පවතී නම්, අදෘශ්‍යයමාන දේ අදෘශ්‍යමාන වන්නේ නැත. මේ අනුව පරීක්ෂණයේ කිසිඳු අර්ථයක් නො පවතී. තෝරා ගැනීමේ කැමැත්ත පිළිබඳ සංකල්පය බිඳ වැටෙයි. දිව්‍යමය සාරය, පරම සත්‍යය සහ පරලොව නිවහන පිළිබඳව සියලු මිනිසුන් දැන ගන්නේ නම්, ඒවා පරීක්ෂණයක් වනුයේ කොහේද?

උදාහරණයක් ලෙස, සිසුන් පිරිසක් විභාග ශාලාවට ඇතුළු වී විභාගය ආරම්භ වූවා යැයි අපි සිතමු. විභාගය අවසන් වන තුරු කිසිදු සිසුවෙකුට ඔහු ඉගෙන ගත්තු දේ බැලීමට ඉඩ නොදෙයි. විභාගය අතරතුර ඔහුට තම පොත්පත් බැලිය නො හැකිය. ඊට හේතුව ඒවා බැලීමෙන් විභාගය යන සංකල්පය සම්පූර්ණයෙන් ම නැති වී යන බැවිණි.

සුප්‍රසිද්ධ ජර්මානු දාර්ශනික ඉමැනුවෙල් කාන්ට් මෙසේ පවසයි.

"සංවේදයෙන් ඔබ්බට ලෝකය වටහා ගැනීමට අපට ඇති නො හැකියාව, මදිකමක් නො ව සදාචාරය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කොන්දේසියකි. තවද, යම් පුද්ගලයෙකුට සියල්ල කෙරෙහි සීමාරහිත දැනුමක් තිබුනේ නම්, ඔහු තම ක්‍රියාවන්හි නිදහස්ව හා ස්වේච්ඡාවෙන් නො සිටිනු ඇත."

මේ අනුව තේරීමේ සඳහා වූ අර්ථය ඇති වන තුරු පරමාණු ලෝකයේ මෙම දර්ශනය මතක තබා ගැනීමට අපට අවසර නැත. ඊට අමතරව, භක්ති සම්මුතිය යනු තර්කය (පණිවිඩය) නො ලැබූ අයට දඬුවම් දෙන තර්කයක් පමණක් නො වේ. පැවරීම සහ ප්‍රතිඵල අවශ්‍ය කරන තර්කය, හවුල්කරුවෙකු නොමැති දෙවිඳා පමණක් විශ්වාස කරන මෙන් ඇරයුම් කරන වක්තෘවරුන්ගේ පණිවිඩ මත මිස පුද්ගලයෙකු මත පදනම් වන්නේ නැත. ඔහු කීකරු වුවහොත් ඔහුට යහ ප්‍රතිඵල දෙනු ලැබේ. ඔහු අකීකරු වුවහොත් ඔහුට දඬුවම් කරනු ලැබේ.

විශ්වාසය සාක්ෂි මත පදනම් වේ. තවද, සාක්ෂි වැඩි විය හැකි අතර, එමඟින් විශ්වාසය සහ නිශ්චිතභාවය අධික වේ. නමුත් අදෘශ්‍යයමාන දේ කිසි විටෙකත් ඉන්ද්‍රීයන් විසින් දැකගත නො හැකි වේ. එසේ නොමැති නම් විශ්වාසය පිළිබඳ සංකල්පය ම බිඳ වැටෙනු ඇත.

අපට, ජීවිතය පුරා නිරෝගී කාල පරිච්ඡේද සහ රෝග කාල පරිච්ඡේද හෝ දශක ගණනාවක සමෘද්ධිය හා සංවර්ධනය සහ ඊට සමාන වන විනාශයේ හා ව්‍යසනයේ කාල පරිච්ඡේද, එමෙන් ම සියවස් ගණනාවක සන්සුන් ස්වභාවය හා ඊට සමාන වන ගිනිකඳු පිපිරීම් සහ භූමිකම්පා සංසන්දනය කළ හැකිය. පවතින යහපත මුලින් ම පැමිණෙන්නේ කොතැනින් ද? අවුල් සහ අහම්බය මත පදනම් වූ ලෝකයකට, යහපත් ලෝකයක් බිහි කළ නො හැකිය. කෙනෙක් අසනීපයක් අත්විඳ මිස නිරෝගීභාවයේ රසය දැනගන්නේ නැත. ඔහු විරූපි දැයක් දකින තාක් කල් සුන්දර දේ හඳුනා ගන්නේ නැත.

තාප ගති විද්‍යාවේ (Rule of Thermodynamics) දෙවන නියමය පවසන්නේ බාහිර බලපෑමක් නොමැතිව පද්ධතියක සම්පූර්ණ එන්ට්රොපිය (අක්‍රමිකතා හෝ අහඹු බව) සෑම විට ම අධික වන බවත්, මෙම ක්‍රියාවලිය ආපසු හැරවිය නො හැකි බවත්ය. වෙනත් වචනවලින් කිවහොත්, පිටතින් එන යමක් ඒවා එකට ගෙන එන්නේ නම් මිස සංවිධානාත්මක දේවල් සෑම විට ම කඩා වැටී, නැතිවී යනු ඇත. ඒ නිසා, අලංකාරය, ප්‍රඥාව ප්‍රීතිය සහ ආදරය සාධාරන බවත් මෙවැනි පුදුමාකාර දේවල පෙනෙන මෙම අහඹු සංසිද්ධීන් මැවුම්කරු විසින් නියාමනය නො කරන්නේ නම්, අන්ධ තාප ගතික බලවේග කිසි විටෙකත් තමන් විසින්ම යහපත් දෙයක් නිපදවන්නේ නැත. නැතහොත් ඔවුන් තරම් මහා පරිමාණයෙන් යහපත් නො වනු ඇත. මේ සියල්ල සිදු වනුයේ රීතිය හොඳ බව සහ රීතියට එකඟ නො වන දේ නරක බව සනාථ කිරීමෙන් පසුවය.

නපුර සහ වේදනාව පිළිබඳ අපගේ දැක්ම රඳා පවතින්නේ ලෞකික ජීවිතයේ යථාර්ථය සහ එය තුළ මිනිස් පැවැත්මේ අරමුණ පිළිබඳ අපගේ දැක්ම මතවේ. එය ආගමට ලැදි මිනිසුන් සහ භෞතිකවාදීන්

අතර වෙනස් වේ. භෞතිකවාදී ඉදිරි දර්ශනය සලකන්නේ මෙලොව ජීවිතය පිටුපස අරමුණක් නොමැති බවත්, පුද්ගලයෙකු මිය ගියහොත් ඔහු කිසිවක් නො වන බවත්, වෙනත් ජීවිතයක් අනුගමනය කිරීමෙන් නැවත නැඟිටීමක් නොමැති බවත් ඒ අනුව පුද්ගලයෙකු ඔහුට ලබා ගත හැකි උපරිම වින්දනය ලබා ගත යුතු බවත්, ඔහුට දැනෙන ඕනෑ ම වේදනාවක් සහ භුක්තියෙන් ඔහුව අවහිර කරන සෑම දෙයක් ම වාදයෙන් තොරව අකුසලක් බවත් ය. මෙම දර්ශනය අනුව පුද්ගලයෙකුට නිරාවරණය වන අකුසල් සහ වේදනාවන් ඔහුට අහඹු කාරණා බවට පත් වේ. අහඹු ලෙස ඇති වූ ලෝකයක ඔහුගේ ජීවිත කාලය ගෙවී යන අතර, පසුව මේ ජීවිතය සංවිධානය කරන, දයාව හා ආදරය ඇති දෙවි කෙනෙක් සිටින බව ප්‍රකාශය ඔවුන්ට විකාරයක් හා පුහුවක් බවට පත්වේ. මෙයින් අදහස් කරන්නේ ඔවුන් භුක්ති විඳීමෙන් වළක්වන ඕනෑ ම දෙයක්, වේදනාවක් ලෙස ඔවුන් සලකන බවයි. එය සීයාගේ බෙහෙත් බීම තහනම් කරන දෙමව්පියන් නපුරු යැයි දරුවෙක් සිතනවාක් මෙනි.

මුළාව, ඔහුව සත්‍යයෙන් ඉවතට ගෙන යාමට පෙර මිනිසා පළමුව තමා දෙස බැලිය යුතුය. විද්‍යාව හා තාක්ෂණය ඔහු වටා කෙතරම් දියුණු වුවත්, මිනිසාට අමරණීයත්වයට පත්විය හැකි තවත් නිර්මාණයක් බවට වර්ධනය වීමට හෝ ආහාර, පාන හා වාතයේ අවශ්‍යතාවක් නොමැතිව හෝ වැසිකිළි කැසිකිළි අවශ්‍යතාවෙන්ගෙන් තොරව හෝ ස්වාධීනව ජීවත් වීමට නො හැකිය. ආරක්ෂිත ඇඳුමකින් තොරව සඳට ළඟා වීමට හෝ තමාව සීමාවෙන් පිටතට ගෙන යන වාහනයක සිටිය නො හැකි බව නිසැකව ම මිනිසා දැන දැන ම මේ විශාල අවකාශය තුළ තමාට සදාකාලික හා සතුට ලබා දෙන ජීවිතයක් සෙවීමට දැඩි උත්සාහයක් දරයි. ඒ සියල්ල, මරණය ඔහු අභිබවා යනු ඇතැයි යන බිය නිසාවෙනි.

"නුඹලා ගලක් හෝ යකඩයක් හෝ වනු යැයි (නබිවරය!) නුඹ පවසනු." (50), "නැතහොත් නුඹගේ සිත් තුළ විශාල ලෙස මවා ගන්නා දැයින් වූ මැවීමක් හෝ වනු. එවිට අපව නැවත ගෙන එනුයේ කවුරුන්දැයි ඔවුහු විමසනු ඇත. "නුඹලා ව මුල් වරට මැවූ අය වේ" යැයි නුඹ පවසනු. එවිට නුඹ වෙත ඔවුන්ගේ හිස් සොලවා "එය කවදා දැ?"යි විමසති. "එය සමීපයෙන් විය හැකැයි" නුඹ පවසනු."(51)

(අල්-ඉස්රා 17:50,51)

වික්ටර් ෆ්රැන්ක්ල් මෙසේ පැවසීය: “අද මිනිසුන්ට යැපීම සඳහා සෑම මාර්ගයක් ම ඇති නමුත් ජීවත්වීමේ තේරුමක් නැත. තේරුමක් නැති ජීවිතයේ හට ගැනෙන සෑම ප්‍රහාරයක් ගැන ම භීතියට පත්ව ජීවිතය සහ මරණයේ බිත්ති අතර හිරවී සිරගෙයක් බවට ජීවිතය පත් කර ගනියි. සෑම වේදනාවක් ම අහඹු සහ පැහැදිලි කළ නො හැකි සිදුවීමක් (නො වැළැක්විය හැකිය) යැයි සලකනු ලැබේ. එය වර්ගීකරණය කළ හැක්කේ ශක්තිය සහ පදාර්ථය අනුව පමණක් වන අතර අවුල් සහගත, කැළඹීම් සහ බේදවාචකය හැර අන් කිසිවක් එය නියෝජනය නො කරයි.

අදේවවාදියා අන් අයට හානියක් නො කරන බවත්, සමහර ආගමිකයින් ආගමේ නාමයෙන් සිදුකරන පරිදි, නරක හැසිරීමට පුද්ගලයෙකු පොළඹවිය නො හැකි බවත් ප්‍රකාශ කිරීම පදනම් විරහිත ප්‍රකාශයකි. ආගම යහපත් සදාචාරය වෙත ආරයුම් කර, අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකී සිටින ලෙස ඉල්ලා සිටී. එබැවින් සමහර මුස්ලිම්වරුන්ගේ අයහපත් හැසිරීම්වලට හේතුව, ඔවුන්ගේ සංස්කෘතික හැසිරීම හෝ ආගම පිළිබඳ නොදැනුවත්කම සහ සත්‍ය ආගමෙන් ඔවුන් දුරස් වීමයි. මිලියන සංඛ්‍යාත මුස්ලිම් සහ කිතුනුවන්ගේ මරණයට හේතු වූ කොමියුනිස්ට්වාදය ලෝකයේ

ස්ථාපිත කිරීමට ගත් උත්සාහයන් ගැන අප අසා නැද් ද? කොමියුනිස්ට් දාර්ශනිකයෙක් මෙසේ පවසයි:

"දෙවිඳා නොමැතිව, අපට මීට වඩා හොඳ විය හැකි බවත්, මිනිසාගේ මනුෂ්‍යත්වය ආරක්ෂා කළ හැකි බවත් අපි සිතුවෙමු. අපි කොතරම් වැරදි ද? දෙවිඳා සහ මිනිසා එක්ව අප විනාශ කළෙමු."

මනුෂ්‍යත්වයට සෙත සැලසීමේ සහ මහපොළොව ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් මිනිසුන්ට යහපත් ගති පැවතුම් සහිතව සැලකීම, මැවුම්කරු පිළිබඳ විශ්වාසය හා ආගමේ සෙවණ යටතේ ගෝලීය සදාචාරය පිළිපැදීමෙන් බැහැර නො වේ. මන්ද භූමිය ප්‍රතිසංස්කරණය කිරීම සහ යහපත් සදාචාරය, ආගමේ අරමුණ නො වන බැවිනි. නමුත් ඇත්ත වශයෙන් ම ඒ දෙක යථාර්ථයෙන් ම මාර්ගවේ. ආගමේ පරමාර්ථය වන්නේ මිනිසාට තම ස්වාමියා ගැනත් ඔහුගේ මූලාශ්‍රය ගැනත් ඔහුගේ මාර්ගය සහ ඔහුගේ ඉරණම ගැනත් දැනුවත් කිරීමය. යහපත් අවසානය සහ ඉරණම සාක්ෂාත් කරගනු ලබන්නේ දෙවියන්ට ඍජුව නැමදුම් කිරීම හා ඔහුට කීකරුවීම තුළින් සර්ව ලෝක දෙවිඳාගේ තෘප්තිය ලබා ගැනීමෙන් පමණි.

Ali Izzat Begovic මෙසේ පැවසීය: “ආචාර ධර්ම මිනිස් ජීවිතයේ සැබෑ සංසිද්ධියක් ලෙස තාර්කිකව පැහැදිලි කළ නො හැකිය. ඇතැම් විට මෙය ආගමේ පළමු හා ප්‍රායෝගික තර්කය විය හැකිය. සදාචාරාත්මක හැසිරීම එක්කො අර්ථ විරහිත ය, නැතහොත් දෙවිඳාගේ පැවැත්ම තුළ එයට අර්ථයක් ඇත. එහි තුන්වන විකල්පයක් නැත. එක්කෝ අපි සදාචාරය යනු උන්මත්තකත්වයේ ගොනුවක් ලෙස අතහැර දමමු. නැතහොත් අපි අමරණීයත්වය ලෙස හැඳින්විය හැකි අගයක් සමීකරණයට හඳුන්වා දෙමු. සදාකාලික ජීවිතයේ කොන්දේසිය සපුරා ඇත්නම්, මේ ලෝකය හැර වෙනත් ලෝකයක්

ඇති බවත්, දෙවිඳා සිටින බවත් වැටහුනේ නම්, මානව සදාචාරාත්මක හැසිරීම අර්ථවත් සහ යුක්ති සහගත වේ.

මනුෂ්‍යයන් අතර සමානාත්මතාව, සදාචාරාත්මක විශේෂත්වයක් මිස ස්වභාවික, ද්‍රව්‍යමය හෝ බුද්ධිමය සත්‍යයක් නො වේ. භෞතික, ස්වාභාවික හෝ මානසික දෘෂ්ටිකෝණයකින්, මිනිසුන් නිසැකව ම සමාන නො වේ. මැවුම්කරු සහ ආගම කෙරෙහි විශ්වාසය මත පදනම්ව සමානාත්මතාව ඉල්ලා සිටිය හැක්කේ දුර්වලයන්ට පමණි. මිනිසුන් සමාන යැයි පැවසිය හැක්කේ මිනිසා දෙවිඳාගේ මැවිල්ලක් නම් පමණි.

මා කියවූ හා මා පුදුමයට පත් කළ කරුණ නම්, අදේවවාදියෙකු නපුරේ පැවැත්ම නිසා දෙවිඳාගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන විට, ඔහු තමාට ම ප්‍රතිවිරුද්ධ වීමය. අදේවවාදීහු තමන් විශ්වාස කරන්නේ ද්‍රව්‍යමය හා ප්‍රත්‍යක්ෂ දේ පමණක් බව පවසමින් දෙවිඳාගේ පැවැත්ම විශ්වාස නො කරන බව පිළිගනිති. එබැවින් ඔවුහු සුරදූතයන්, ජින්, දිව්‍යමය පණිවිඩ, අනාගත වක්තෘවරුන් සහ ප්‍රාතිහාර්යයන් ඇතුළු නො පෙනෙන ලෝකය ප්‍රතික්ෂේප කරති. අනෙක් අතට, ඔවුහු "ස්වභාවධර්මය" යන ද්‍රව්‍යය පිළිගනිති. ස්වභාවධර්මය හෝ පදාර්ථය (පරිසරය), ඔවුන්ගේම පිළිගැනීමට අනුව, සම්පූර්ණයෙන් ම මධ්‍යස්ථ ය. එය සදාචාරයට යටත් වීම හෝ එයට ප්‍රභවයක් වීම පසෙක තබා, එය නපුරේ නො වැළැක්විය හැකි බවට හෝ යහපතෙහි නො වැළැක්විය හැකි බවට යටත් නො වේ. මිනිසා ස්වභාවධර්මයේ දරුවෙක් නම්, සම්පූර්ණයෙන් ම ද්‍රව්‍යවාදී නම්, කිසිවක් පිරි නොනැමූ හිඟ තැනැත්තෙක් නම්, මිනිසා යහපත, අයහපත සහ සදාචාරය ගැන මධ්‍යස්ථ නො වූයේ මන් ද? අදේවවාදියා ඔහුගේ විශ්වාසයට අනුව, සදාචාරය නොදන්නා බව පිළිගනිමින් ස්වභාවධර්මය මත හිඳිමින්

ඔහුගේ සදාචාරය ගැන ආඩම්බර වන්නේ කෙසේ ද? මෙයින් අදහස් කරන්නේ අදේවවාදියෙකු ආඩම්බර වන සදාචාරාත්මක සංකල්ප ඔහුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන මැවුම්කරුගේ ත්‍යාගයක් වන බවයි. මෙය දෙවිඳා අප තුළ තබා ඇති සහජ ස්වභාවය යැයි අප පවසන අතර එමඟින් අනාගත වක්තෘවරුන් සහ පණිවිඩකරුවන් හරහා ඔහුගේ පණිවිඩ ලබා ගැනීමට අපි සූදානම් වෙමු. මෙය පණිවිඩයයි, මනස සම්බන්ධයෙන් ගත් කල, අපි ලෝකයන් සමඟ සන්නිවේදනය කරමු:

පාරභෞතික (Metaphysical) - මනසෙහි වැදගත් කොටසක් වියුක්ත බැවින් - අපි ස්වර්ගීය පණිවිඩ තේරුම් ගනිමු.

භෞතිකවාදය (Material): සදාචාරාත්මක දිව්‍යමය පණිවිඩය[5] මඟින් නියම කර ඇති දේ අනුව අපට එය නැවත ගොඩනඟා ගත හැකිය.

බ්‍රිතාන්‍ය අදේවවාදියෙකු වූ රිචඩ් ඩෝකින්ස් ඔහුගේ The River Out of the Garden of Eden නම් පොතේ මෙසේ පවසයි.

"සොබාදහම නපුරු නැත, නමුත් අවාසනාවකට එය උදාසීන ය. මෙය මිනිසාට තේරුම් ගැනීමට අපහසු ම පාඩම්වලින් එකකි. මන්ද, සියල්ල හොඳ හෝ නරක නො වන බවත්, දයානුකම්පිත හෝ දරුණු නො වන බවත් අපට පිළිගැනීමට අපහසුය. ස්වභාවධර්මයට කිසිම අරමුණක් නැති නිසා එය සියලු මිනිසුන්ගේ දුක් වේදනා ගැන උදාසීනය."

අදේවවාදය යනු හේතු සාධක ඉවත් කිරීමට, තර්කනය සහ සාමාන්‍ය බුද්ධිය නො සලකා හැරීමට සහ විද්‍යා ප්‍රබන්ධවලට අනුගත වීමට, විද්‍යාවේ නාමයෙන් කරන ආරාධනයකි! අල්ලාහ්ගෙන් තොරව,

[5] ආචාර්ය හයිසම් තල්ආගේ "ෂිෆාඋ ලිමා ෆිස් සුදූර්" නම් කෘතිය.

ඔහුගේ විශ්වය හා එහි නීතිරීතිවලින් තොරව, ඔහු අපට ලබා දුන් අදහස් නොමැතිව, විද්‍යාඥයින්ට අධ්‍යයනය කළ හැකි හෝ අදේවවාදීන්ට ප්‍රතික්ෂේප කළ හැකි කිසිවක් නැත.

මිනිසා තම මැවුම්කරු සමඟ ඇති සම්බන්ධතාව කිසිදු සම්බන්ධතාවට වඩා හොඳ සහ ශක්තිමත් විය යුතුය. එබැවින් ඉස්ලාමයේ ඉගැන්වීම්, ක්‍රියාත්මක කරන්නට මුස්ලිම්වරයා උනන්දු විය යුතුය. මෙම සම්බන්ධතාව ඔහුට සියලු යහපත සහ අන් අයට ගෞරවය ගෙන දෙන සැබෑ සම්බන්ධතාවයි.

බොහෝ මිනිස්සු සැක, සෙවීම් සහ අභිමිවීම් වැනි කාලයක් හරහා ගමන් කරති. ඔවුහු ලෝකයේ ස්වාමියා වෙත යන මාර්ගය සොයා ගන්නා තෙක් සම්පූර්ණ සාමය සහ සැනසීම ලබා නො ගනිති. නැතිවූ දරුවෙකු තම මව සොයනවාක් මෙන්, ඔහු ඇයව සොයාගත් විට, ඔහු සන්සුන් වන අතර, ඔහු සොයන ආරක්ෂාව මෙය බව වටහා ගනී. එබැවින්, අදේවවාදය යනු සත්‍යය කරා ළඟා වීමට පැහැදිලි අසාර්ථකත්වය ප්‍රකාශ කිරීමකි.

අපි සුරතල් සතෙකු මිල දී ගැනීමේදී, අපි උපරිමව බලාපොරොත්තු වන්නේ කීකරුකමයි. මෙයට හේතුව අපි එය මිලදී ගත්තද, අපි එය නිර්මාණය නො කළ බැවිනි. පරමාදර්ශය උත්තරීතර අල්ලාහ්ට සතුය. අපගේ මැවුම්කරු සහ අපගේ නිමැවුම්කරු ගැන අප සැලකිලිමත් වන්නේ කුමන හේතුවෙන් ද? අපගේ කීකරුකම, නැමදුම සහ යටත් වීම ලබන්නට ඔහු සුදුසු නො වේ ද? අපි බොහෝ දේ තුළ මෙම ලෞකික ගමනේ දී අපගේ කැමැත්තට එරෙහිව යටත් වෙමු. අපගේ හදවත ස්පන්දනය වෙයි. අපගේ ආහාර ජීර්ණ පද්ධතිය ක්‍රියාත්මක වෙයි. අපගේ ඉන්ද්‍රියන් හොඳින් ග්‍රහණය කරයි. අප කළ යුත්තේ

ආරක්ෂාව කරා ළඟා වීමට අපට අවස්ථාව ලබා දී ඇති අපගේ ඉතිරි කටයුතු දෙවිඳා වහන්සේට භාර දීමයි.

විශ්වාසය පිළිබඳ සිතුවිල්ල කනස්සල්ලෙන් පෙළෙන පුද්ගලයෙකුගේ අවධානය වෙනතකට යොමු කරන ළමා කතා හෝ සුන්දර සිහින, දර්ශන හා විනෝදාස්වාදයට වඩා වැඩි දෙයක් නො වන බව ප්‍රකාශ කළ ද බොහෝමයක් පදනම් විරහිත ය. අරමුණක් සඳහා අපව නිර්මාණය කළ සහ සදාකාලික සතුටක් සඳහා අපව නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ මැවුම්කරුවෙකුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය අපගේ හදවත් තුළ තදින් මුල් බැස ඇති සත්‍යයකි. මේ සුන්දර සත්‍යය මිනිසා කිසිවක් නැති, ශූන්‍යතාවෙන් පැමිණි, කිසිවක් නැති දෙයක් ගමන් කරනු ඇතැයි පවසන අදේවවාදයේ බියකරු සිහිනයට වඩා හොඳය. අදේවවාදියෙකු තම පුත්‍රයා වැඩුනු පසු, ඔහුට කුමක් වීමට අවශ්‍ය දැයි ඇසූ විට "කිසිවක් නැත" යනුවෙන් ඔහුට දෙන ප්‍රතිචාරය පිළිගනී ද? ඔහු මෙම පිළිතුර පිළිනො ගන්නා අතර තම පුතාට රැකියාවක් කිරීමට, ඉගෙනීමට සහ අනාගතයේ වටිනාකමක් ඇති පුද්ගලයෙකු වීමට හැකි සෑම උත්සාහයක් ම දරයි. ජීවිතය කෙටියි, මරණය හදිසියේ පැමිණේ. මෙලොව ජීවිතයේ අප සතුව ඇති මුදල් හා දරුවන් අහිමි වී යනු ඇත. එක්කො එය අපි මිය යෑමෙන්, අපගේ පරපුරට අත්හැර දැමීමෙන් හෝ අපගේ මරණයට පෙර අපගේ ජීවිතයේම එය අපට අහිමි වීමෙන් සිදුවිය හැකිය.

ජීවිතය යනු පරිච්ඡේද රාශියක් ඇති නවකතාවක එක් පරිච්ඡේදයක් පමණි, මරණය යනු කතාවේ අවසානය නො ව එහි ආරම්භයයි. මනුෂ්‍යයා නිර්මාණය කර ඇත්තේ උතුම් වූ හා උසස් වූ අරමුණක් සඳහා වන අතර, නුවනැති මිනිසා යනු මරණින් මතු ජීවිතය සැලසුම් කරන කෙනෙකි.

අනන්තයට සාපේක්ෂව ඕනෑ ම සංඛ්‍යාවක් ශූන්‍යය. අපගේ ජීවිතය යනු ඉලක්කම් සමූහයකි. මෙම සංඛ්‍යා අතරින් සංඛ්‍යාවක් අපගේ ජීවිතයෙන් දිනපතා අඩුවෙනු ඇත. එබැවින් අප වසර සියයක් දෙසීයක් ජීවත් වුවද, අනන්තයට සාපේක්ෂව ඒවා ශූන්‍ය වේ. ඕනෑ ම වයසක, රෝග සහිතව හෝ රෝග රහිතව හෝ මරණය පැමිණීම වැළැක්විය නො හැකිය. මරණයේ මොහොත නියම කර ඇත. අපි ජීවත් වෙන්නේ බිංදුවකය (zero). අදේවවාදියා දෙවියන්ව දැන සිටියේ නැත. මන්ද ඔහු සැබවින්  ම ඔහුව දැන සිටියේ නම්, ඔහු දෙවියන්ව විශ්වාස කිරීමට, ඔහුට යටත් වීමට ප්‍රතික්ෂේප නො කරනු ඇත. දෙවිඳා විශ්වාස කිරීම සඳහා මැවුම්කරුව දැකීමට ඔහු ඉල්ලා සිටියි. අපි අනන්තයට වඩා ශූන්‍යය අගය කරමු ද?

විස්මය ඇති කරන කෘතියක්, අවසානය දක්වා නො කියවා විනිශ්චය කිරීම හෝ පළමු පිටුවට අප අකමැති යැයි පොතක් ප්‍රතික්ෂේප කිරීම තර්කානුකූල නො වේ. මෙම විනිශ්චය අසම්පූර්ණ යැයි සැලකේ.

එමෙන් ම මනුෂ්‍යයා ජීවත්ව සිටින තාක් ඔහුට තවමත් අවස්ථාව පවතින අතර, එය තම ආධිපත්‍යයේ හවුල්කරුවෙකු නොමැති, දරුවෙකු නොමැති, මිනිසකු, සතෙකු, පිළිමයක හෝ ගලක ස්වරූපයෙන් මූර්තිමත් නො වන එක ම මැවුම්කරු පිළිබඳ විශ්වාස කිරීමේ අවස්ථාවයි. මෙම මැවුම්කරුට සෘජුව නමස්කාර කළ යුතුය. අවශ්‍යතාවක දී ඔහුට කන්නලව් කර ඔහු වෙත හැරිය යුතුය. පව් කරන විට කිසිදු සාන්තුවරයෙකු, පූජකයෙකු හෝ මැදිහත්කරුවෙකු නොමැතිව පසුතැවිලි වී සෘජුව සමාව ඉල්ලා සිටිය යුතුය.

# ඉස්ලාම් ආගම යනුවෙන් හඳුන්වනු ලබන ආගම මෙයයි.

එබැවින් මෙලොව ජීවිතයේ අවසානය යනු අප කලින් සඳහන් කළ පරිදි මරණයෙන් පසු නැවත නැඟිටවනු ලැබීම, ප්‍රශ්න කරනු ලැබීම සහ පසුව විපාක දෙනු ලැබීම යන සදාකාලික ගමනක ආරම්භයයි. අපගේ මෙලොව පැවැත්ම උදාර අරමුණක් සහ උසස් ඉලක්කයක් සඳහා වන බව ඉස්ලාම සලකයි. එනම් සර්වබලධාරී අල්ලාහ් පිළිබඳ හඳුනාගෙන ඔහුට පමණක් නැමදුම් කිරීම සහ ඔහු වෙත ඍජුව හැරීමයි.

"සෑම ආත්මයක් ම මරණයේ සුවය විඳින්නකි. නුඹලාට නුඹලාගේ ප්‍රතිඵල පූර්ණ ව පිරිනමනු ලබනුයේ මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයෙහි ය. එවිට කවරෙක් (නිරා) ගින්නෙන් දුරස් කරනු ලැබ (ස්වර්ග) උයනට ඇතුළත් කරනු ලැබුවේ ද සැබැවින් ම ඔහු ජයග්‍රහණය කළේය. තවද, මෙලොව ජීවිතය රවටාලන හුදු භුක්ති විඳීමක් මිස නැත." (ආලු ඉම්රාන් 3:185)

ඉස්ලාම් ආගමට පිවිසීම පහසු සහ සරල ය. සිදු කළ යුත්තේ අල්ලාහ් සතු ඒකීයභාවය පිළිගනිමින් ද ඔහුගේ නබි මුහම්මද්ගේ දූත මෙහෙවර පිළිගනිමින් ඒ බව සාක්ෂි දරා ඒ අනුව ක්‍රියා කිරීමය. එය සිදු වනුයේ විශ්වාසයේ සාක්ෂිය ලෙස හැඳින්වෙන වාක්‍ය මාලාවක් හරහාය. එනම්:

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත්, ඔහු ඒකීය බවත්, ඔහුට කිසිදු හවුල් කරුවකු නොමැති බවත් මම සාක්ෂි

දරමි. තවද, සැබැවින් ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ඔහුගේ ගැත්තා බවත් ඔහුගේ ධර්ම දූතයා බවත් මම සාක්ෂි දරමි.

අල්ලාහ් විසින් එවන ලද සියලු ම දූතවරු සත්‍යය බව මම සාක්ෂි දරමි.

සැබැවින් ම ස්වර්ගය සත්‍යය බවත් අපාය ද සත්‍යය බවත් මම සාක්ෂි දරමි.

# සටහන

මැදපෙරදිග වෙසෙන කිතුනුවෝ, යුදෙව්වෝ සහ මුස්ලිම්වරු (අල්ලාහ්) යන වචනය දෙවියන්ට සඳහන් කිරීමට භාවිත කරති. එනම් එක ම සැබෑ දෙවිඳා, මෝසෙස්ගේ සහ ක්‍රිස්තුස්ගේ දෙවිඳා යනුවෙනි. මැවුම්කරු ශුද්ධ වූ අල් කුර්ආනයේ තමන් ගැන හඳුන්වා දෙන විට "අල්ලාහ්" සහ වෙනත් නම් සහ ගුණ නාමවලින් හඳුන්වා දී ඇත. "අල්ලාහ්" යන වචනය පැරණි ගිවිසුමේ 89 වතාවක් (උත්පත්ති 2:4) සහ තවත් බොහෝ තැන්වල සඳහන් වේ. අද සමහර විද්වතුන් (අල්ලාහ්) යන වචනය සංස්කෘත භාෂාවෙන් හින්දු ග්‍රන්ථයේ පැරණි අනුවාදවල (Rigveda Book 2 Hymn I පදය II) එක ම දෙවිඳා ගැන සඳහන් කිරීම සඳහා භාවිත කර ඇති බව පවසති.

ශුද්ධ වූ අල් කුර්ආනය යනු මැවුම්කරුගෙන් එවන ලද අවසාන පොත වේ. අල් කුර්ආනයට පෙර එවන ලද සියලු ම දිව්‍ය ග්‍රන්ථවල මූල කෘතිය මුස්ලිම්වරු විශ්වාස කරති. (ආබ්‍රහම්ගේ ලේඛන, සබූර් - ගීතාවලිය, තව්රාත් -ටෝරාව සහ ඉන්ජීල් -බයිබලය සහ වෙනත්) ඒ සියලු දිව්‍ය ග්‍රන්ථවල සැබෑ පණිවිඩය පිරිසිදු ඒකදේවවාදය බව මුස්ලිම්වරු විශ්වාස කරති. (එනම් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබීම සහ සාන්තුවරයෙකු හෝ පූජකයෙකු හරහා නො ව ඍජුව ම ඔහුට පමණක් නැමදුම් කිරීම, ඔහුට කිසිදු පුතෙකු නැති බව, ඔහු මනුෂ්‍යයෙකුගේ හෝ ගලක ස්වරූපයෙන් අවතාර නො ගන්නා බව) විශ්වාස කරති. නමුත් පෙර දිව්‍ය ග්‍රන්ථවලට වෙනස්ව අල්-කුර්ආනය විශේෂ කණ්ඩායමක් හෝ විශේෂ නිකායක් විසින් ඒකාධිකාරී කර නො තිබේ. එහි විවිධ පිටපත් දක්නට නො ලැබේ. එමෙන් ම එහි කිසිදු වෙනසක් සිදු කර නොමැත. සියලු ම මුස්ලිම්වරුන්ට ඇත්තේ එක පිටපතක් පමණි. අල්-කුර්ආනය සෑම කෙනෙකුගේ ම අතේ තිබේ. එය

නැමදුම් කටයුතුවලදී පාරායනය කරනු ලබන අතර ජීවිතයේ සියලු කටයුතුවල දී යොදා ගැනේ. ලොව පුරා සිටින මුස්ලිම්වරු අල්-කුර්ආනය මුහම්මද් තුමාගේ කාලයේ එතුමාණන් සහ එතුමාණන්ගේ සගයන් විසින් පාරායනය කළ ආකාරයට ම කිසිදු වෙනසකින් තොරව අදත් පාරායනය කරති. අල් කුර්ආනයේ වර්තමාන පරිවර්තන කුර්ආන් අර්ථ කථනයෙහි පරිවර්තන පමණි.

ශුද්ධ වූ අල් කුර්ආනයේ බොහෝ පදවල මැවුම්කරු "නහ්නු" (අපි) යන වචනය භාවිත කර තිබීම අරාබි භාෂාව අනුව බලය සහ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කරයි. එලෙස ම ඉංග්‍රීසි භාෂාවේ ද "we the monarchy" ලෙස භාවිත කෙරී ඇත. මෙම බහුවචන සර්වනාමය යෙදී ඇත්තේ උසස් තනතුරක සිටින (රජු, පාලක හෝ සුල්තාන් වැනි) පුද්ගලයෙකු හැඳින්වීම උදෙසා ය. කෙසේ වෙතත්, අල්-කුර්ආනය ගැතිභාවය සම්බන්ධ කරමින් අල්ලාහ්ගේ ඒකීයභාවය සැමවිටම තරයේ අවධාරණය කර සිටී.

## යොමුව:

- ෆාතින් සබ්රිගේ "رحلة من الذاكرة لماذا الدين؟" (ආගම කුමකට ද? මතක සටහනේ ගමනක්)
- www.fatensabri.com
- ආචාර්ය හයිසම් තල්ආගේ "شفاء لما في الصدور" (හදවත් තුළ පවතින දැට ප්‍රතිකාරය)
- ආචාර්ය අම්ර් ෂෙරිෆ්ගේ "وهم الإلحاد" (අදේවවාදයේ මිත්‍යාව)
- ආත්මය සහ මැවුම්කරු ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අදේවවාදි ස්ටීවන් හෝකින්ට අල් කුර්ආනයේ ප්‍රතිචාරයේ ලිපියක්. ආචාර්ය මහ්මුද් අබ්දුල්ලා ඊබ්රාහිම් නජා.
- www.islamhouse.com
- www.quranenc.com

# කතුවරයාගේ පොත්

- අල්-කුර්ආනය සහ බයිබලය තුළ ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ පණිවිඩය, (එතුමා කෙරෙහි සාමය වේවා!) 2017, ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කර තවත් භාෂා 15කට පරිවර්තනය කර ඇත.
- "المفهوم الحقيقي للإله" දෙවිඳා පිළිබඳ සැබෑ සංකල්පය. 2018, ඉංග්‍රීසියෙන් ප්‍රකාශයට පත් කර භාෂා 7කට පරිවර්තනය කර ඇත.
- "لماذا الإسلام؟" (ඉස්ලාම් කුමකට ද?) 2019, ඉංග්‍රීසියෙන් ප්‍රකාශයට පත් කර භාෂා 13කට පරිවර්තනය කර ඇත.
- "عين على الحقيقة" සත්‍යය දෙස නෙත් යොමු කරන්න. 2020, ඉංග්‍රීසියෙන් ප්‍රකාශයට පත් කර භාෂා 4කට පරිවර්තනය කර ඇත.
- "لماذا الدين؟ رحلة من الذاكرة" (ආගම කුමකටද? මතක සටහනේ ගමනක්) 2021, අරාබි භාෂාවෙන් ප්‍රකාශයට පත් කර ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත.
- "هل القرآن كلام الله" (කුරානය දෙවිඳාගේ වචනයද?) 2021, අරාබි භාෂාවෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

# පටුන


හදවතින් වූ ප්‍රකාශයකි ........................................................................ 3

විශ්වය නිර්මාණය කළේ කවු ද? ...................................................... 17

මැවුම්කරු කවු ද? ................................................................... 18

මැවුම්කරු ව මැව්වේ කවු ද? ......................................................... 18

ඔහුගේ පැවැත්මේ යථාර්ථය කෙසේ නම් වන්නේ ද?............................ 19

ඔහුගේ නාම හා ගුණාංග මොනවා ද? ............................................... 19

ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳ හඳුන්වාදීම................................................ 20

නිරපේක්ෂ සැලසුම ඔහු සතුය. ......................................................... 20

සියලු පාලන කටයුතු ඔහු සතුය. ......................................................... 21

පොදුවේ පොහොසත්බව ඔහු සතුය. ................................................... 21

ගුප්ත දෑ පිළිබඳ යතුරු ඔහු සතුය. ...................................................... 22

චතුර හැකියාව, බලය ඔහු සතුය. ........................................................ 22

විශ්වය නිර්මාණය වූයේ කෙසේ ද?.................................................... 23

පුපුරා වෙන්වීමෙහි අදියර ............................................................... 23

විශ්වයේ ප්‍රසාරණය "අහස" ............................................................... 24

මහපොළොවේ පිහිටීම සහ අහසේ දුම් සම්භවය.................................... 24

කාලය සහ අවකාශය නිර්මාණය කිරීම ............................................... 25

මැවීමෙහි අරමුණ කුමක් ද? ............................................................ 26

මැවුම්කරුට මිනිසනුගෙන් අවශ්‍යතාවක් තිබේ ද? ................................. 26

පරිණාමය පිළිබඳ සංකල්පය නිවැරදි කිරීම ........................................ 27

ආදම්ගේ මැවීම ආරම්භයේ මැටියෙන් විය........................................ 27

මිනිස් පියා ආදම් ගරුත්වයට පත් කිරීම........................................ 27

ආදම්ගේ පරපුර මැවීම ........................................ 28

ආදම්ගේ පරපුර ගරුත්වයට පත් කිරීම. ........................................ 28

තෝරා ගැනීමේ නිදහස ආදම්ට පිරිනැමීම........................................ 29

දැනුම හේතුවෙන් ආදම් තුමා වෙන්කර දැක්වීම ........................................ 29

මහපොළොවේ අනුප්‍රාප්තිය හඳුන්වා දීමේ කතාව........................................ 30

මැවුම්කරුගේ පැවැත්ම සහ විද්‍යාත්මක නීති සහ න්‍යායන් සමග එහි සම්බන්ධය.
........................................ 31

මැවුම්කරු කෙරෙහි විශ්වාස කිරීම අනිවාර්ය සාක්ෂි සමඟ අනුකූල වේ. ....... 33

මැවුම්කරුවෙකුගේ පැවැත්ම පිළිබඳ විශ්වාසය, අභිප්‍රාය සහ අරමුණ පිළිබඳ සාක්ෂිවලට අනුකූල වේ........................................ 34

ප්‍රඥාවන්ත මැවුම්කරුවකු පිළිබඳ විශ්වාසය වනාහි එය අනුකූලතාව සහ පිළිවෙල පිළිබඳ සාක්ෂිවලට අනුකූල වේ........................................ 35

දේව බලය හා දේව ප්‍රඥාව තුළින් විශ්වය මිනිසාට වසඟ කර දී ඇත. ............ 36

දේව අධීක්ෂණය හා දේව දයාව තුළින් මිනිසාගේ බිහිවීම (වර්ධනය) සඳහා විශ්වයේ යෝග්‍යතාව........................................ 36

දේව ප්‍රඥාව සහ දයාව තුළින් විශ්වයේ මැවීම් සඳහා ශ්‍රේෂ්ඨත ම ස්වරූපය නියම කිරීම. ........................................ 37

ජීවීන් අතර පවතින යුගල මැවුම්කරුගේ පැවැත්ම සහතික කරන, පරිණාමවාදය අර්ථවිරහිත කරන සාක්ෂියකි........................................ 38

මැවුම්කරු කෙරෙහි විශ්වාසය හේතු කාරක නීතියට අනුකූල වේ. ............... 38

විශ්වය විනාශ වී ඇත යන ඇත්ත, විනාශය තීරණය කරන තාප ගති විද්‍යාවේ දෙවන නියමයට අනුකූල වේ. ........................................................ 40

මැවුම්කරු කෙරෙහි ඇති විශ්වාසය බාර්ක්ලේ මූලධර්මයට අනුකූල වේ. එය දේවල්වලට සාක්ෂි දරන මනස පැවැත්ම අවශ්‍ය වේ. ................................ 40

මැවුම්කරු කෙරෙහි විශ්වාසය, මිනිස් අයිතිවාසිකම් සහතික කරයි. ............. 41

මැවුම්කරු පිළිබඳ වූ විශ්වාසය වනාහි, එය උපකල්පිත ජීවිතය සහ ඉලෙක්ට්‍රොනික් ක්‍රියාවක් වීම ප්‍රතික්ෂේප කරයි. .................................... 41

මිනිස් මනස යනු, එහි සංරචක (උපාංග) අසමත් වීම නිසා වැඩ නතර කරන පරිගණකයක් නො වේ. ........................................................ 43

මිනිස් මනස පරිගණක යන්ත්‍රනයට සංසන්දනය කිරීම අදේවවාදයට එරෙහි තර්කයකි. ........................................................ 44

මිනිසාගේ මනස පරිගණක යන්ත්‍රයට සංසන්දනය කිරීමෙන් සත්‍යය අවබෝධ වේ. ........................................................ 45

පරස්පර විරෝධී නිරපේක්ෂ බලය ප්‍රතික්ෂේප කිරීම .............................. 47

බහුවිශ්ව උපකල්පනයට මැවුම්කරුවෙකුගේ පැවැත්ම අවශ්‍ය වේ. .............. 48

සරල ම පැහැදිලි කිරීම නිවැරදි බව පවසා සිටි ඔක්කාම්ගේ මූලධර්මය විශ්වාසයට අනුකූල වේ. ........................................................ 49

කල්පනා කොට බැලීම. ........................................................ 56

ඉස්ලාම් ආගම යනුවෙන් හඳුන්වනු ලබන ආගම මෙයයි. ......................... 91

සටහන ........................................................ 93

යොමුව: ........................................................ 95

කතුවරයාගේ පොත් ........................................................ 96